**ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය - 2018**

----------------------------------------------------------------

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ (ජා.ජ.ස.ජ.ම) 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

### 1.4 විගණන විෂය පථය

------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

-----------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

-------------------------------------------------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | කෙරීගෙන යන වැඩ ශේෂයන් ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශන සමඟ සැසඳුම් කිරීමට අපොහොසත් වීම | කෙරීගෙන යන වැඩ සැසඳුම් කිරීමේ භාවිතයක් නොපවතී. | පොදු ලෙජරයේ කෙරීගෙන යන වැඩ ශේෂයන් ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශයන් සමඟ සන්සන්දනය කළ යුතු වීම. |
| ii. | මාසික බැංකු සැසඳුම් ප්‍රකාශයන් ඊළඟ මාසයේ 15 වන දිනට පෙර පිළියෙල කිරීමට අපොහොසත් වීම. | බැංකුව විසින් කරනු ලබන සෘජු ගෙවීම් සම්බන්ධවන බැංකු ගිණුම්වලදී ඊට අදාළ බැංකු උපදෙස් ඉල්ලුම් කිරීම සහ ඒවා බැංකුවෙන් ලබා ගැනීමට දීර්ඝ කාලයක් ගත වේ. | මුදල් රෙගුලාසි 395(ඇ) ප්‍රකාරව සියලු බැංකු සැසඳුම් පිළියෙල කළ යුතු වීම. |
| iii. | පසුගිය වර්ෂයේදී අවිනිශ්චිත ගිණුමට මාරු කරනු ලැබූ විශාල වටිනාකමකින් යුත් හර සහ බැර ශේෂයන් විමර්ශනය කොට නිරවුල් කිරීමට අපොහොසත් වීම. | ඉහත ගිණුම් විමර්ශනය කොට නිරවුල් කරගැනීම සඳහා අතිරේක සාමාන්‍යාධිකාරී (මූල්‍ය) විසින් විශේෂ කමිටුවක් පත් කර ඇති අතර එහි කටයුතු මේ වන විට සිදු වෙමින් පවතී. | අවිනිශ්චිත ගිණුම නිරවුල් කර ගැනීමට ක්‍රියා කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| iv. | ඉඩම් අත්පත් කර ගෙන ඇති නමුදු අත්තිකාරම් නිරවුල් කිරීමට අපොහොසත් වීම. | ඔප්පුව පැවරීම සිදු කරනු ලබන විට පමණක් අත්තිකාරම් නිරවුල් කරනු ලැබේ. | දැනටමත් පවරාගෙන ඇති ඉඩම් අත්තිකාරම් සම්බන්ධයෙන් ඉඩම් අත්තිකාරම් ගිණුම නිරවුල් කිරීමට ක්‍රියා කළ යුතු වීම. |
| v. | 2018 වර්ෂය සඳහා වන වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2019 ජූනි 30 දින වන විටත් නිම කර නොතිබුණි. | සටහන් කර ගන්නා ලදී. | මුදල් රෙගුලාසි 756 ප්‍රකාරව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය නිම කළ යුතු වීම. |
| vi. | ස්ථාවර සහ අස්පෘශ්‍ය වත්කම්හි වටිනාකම සමාලෝචනය කොට නැවත ප්‍රකාශ කොට නොතිබුණි. | දිවයින පුරා පැතිරී ඇති අතිවිශාල වත්කම් පදනමකින් යුක්තවීම හේතුවෙන් වාර්ෂිකව වත්කම් ප්‍රත්‍යාගණනය සිදු කිරීමට නොහැකි විය. | ස්ථාවර සහ අස්පෘෂ්‍ය වත්කම් වටිනාකම වාර්ෂිකව සමාලෝචනය කොට යළි ප්‍රකාශ කළ යුතු වීම. |
| vii. | ව්‍යාපෘති අවසන් වී ඇති නමුදු ව්‍යාපෘතීන්හි ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කොට නොතිබුණි. | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ වගකිවයුතු ඉංජිනේරුවරයෙකු විසින් නිම කිරීම් සහතිකය නිකුත් කරනු ලබන තෙක් ව්‍යාපෘති අවසන් කළා සේ සැලකිය නොහැකිය. | වැඩ නිම කළ ව්‍යාපෘතීන්හි වත්කම් ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කළ යුතු වීම. |
| viii. | දිගුකාලයක් තිස්සේ නොවෙනස්ව පවතින කෙරීගෙන යන වැඩ ශේෂයන් විමර්ශනය කිරීමට අපොහොසත් වීම. | ක්‍රියාමාර්ග ගෙන ඇත. | වැඩ නිමකරන ලද ව්‍යාපෘතීන්හි කෙරීගෙන යන වැඩ ශේෂයන් ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කළ යුතු වීම. |
| ix. | මණ්ඩලීය වාහන වෙනත් ආයතනයන් වෙත නිදහස් කිරීම | සටහන් කර ගන්නා ලදී. | 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පීඊඩී/12 චක්‍ර ලේඛයේ ඡේද අංක 8.3.9 ට අනුගත විය යුතු වීම. |
| x. | දීර්ඝ කාලීනව පවතින මාර්ගස්ථ තොග ශේෂයන් පැවතීම. | සෑම වර්ෂයකදීම මාර්ගස්ථ තොග ශේෂය පැවතියද තොග සත්‍යාපනයේදී එය නිරවුල් වේ. | දිගු කාලීනව පවතින මාර්ගස්ථ තොග ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවීම. |
| xi. | ඒකාබද්ධ තොග පාලන පද්ධතියක් පවත්වාගෙන යාමට අපොහොසත් වීම. | මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ අංශය විසින් මේ වන විට ඒකාබද්ධ තොග පාලන පද්ධතියක් සංවර්ධනය කරමින් පවතී. | ඒකාබද්ධ තොග පාලන පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| xii. | නැවත අයකර ගැනීමේ යෝජනා ක්‍රම සඳහා ලද අත්තිකාරම් අදාළ වියදමට එරෙහිව කපා ගැනීමෙන් තොරව දීර්ඝ කාලයක් තිස්සේ පැවතුණි. | ඒවා ප්‍රමාදව තිබූ අවස්ථා කිහිපයක් පැවතුණි. ඒවා නම්,<br><br>i. ප්‍රාදේශීය කාර්යාල විසින් සිදු කරනු ලබන නැවත කර ගැනීමේ ව්‍යාපෘතීන්හි අත්තිකාරම් මුළුමනින්ම නිරවුල් කිරීම සඳහා වැඩ නිම කිරීමේ සහතිකය ප්‍රධාන කාර්යාලය වෙත යැවිය යුතු වීම.<br><br>ii. උමා ඔය නැවත අය කර ගැනීමේ ව්‍යාපෘතිය වැනි විවිධ හේතූන් නිසා ව්‍යාපෘති කාලය දීර්ඝ කරගනු ලැබූ මහා පරිමාණ ව්‍යාපෘති කිහිපයක් පැවතීම. | ප්‍රධාන ලෙජරයේ පවතින දීර්ඝ කාලීනව පැවත එන නැවත අය කරගැනීමේ ශේෂයන් නිරවුල් කර ගැනීමට ක්‍රියා කළ යුතු වීම. |

### 1.5.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ප්‍රමිතයෙහි (ශ්‍රී.ලං.ගි.ප්‍ර 01) ඡේද අංක 32 ට පටහැනි ලෙස විසල් රත්නපුර ජල සම්පාදන ව්‍යාපෘතියට අදාළව මාර්ග සංවර්ධන අධිකාරියේ තබා තිබූ රු.8,254,685 ක් වටිනා ජංගම වත්කම් තුළ ඇතුළත්ව තිබූ කෙටිකාලීන තැන්පතු, ඇප තැන්පත් වගකීම් ගිණුමට මාරු කර තිබුණි. එමෙන්ම ප්‍රදාන ලෙස ලැබී තිබුණු පරිගණක මෘදුකාංගවලට අදාළ රු.1,041,284 ක ක්ෂය වීම් සහ විලම්භිත ආදායම් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ තුළ වෙනම දැක්වීමකින් තොරව එකිනෙකට හිලව් කොට තිබුණි. | i. 381 ජ'ර්නල් ප්‍රවේශ අංකය හරහා මෙය නිවැරදි කර ඇත.<br>ii. මණ්ඩලයේ වත්කම් දෙකකට බෙදා ඇත.<br>1. මෙහෙයුම් සහ නඩත්තු (ඕ ඇන්ඩ් එම්) අරමුදල් මූල්‍යන වත්කම්<br><br>2. ප්‍රදානිත වත්කම්<br><br>ප්‍රදානිත වත්කම් ක්ෂය කිරීමේ ප්‍රතිපත්තිය නම්, අදාළ ක්ෂයවීම් ප්‍රදාන සංරචකය සමඟ හිලව් කිරීමයි. ඕ ඇන්ඩ් එම් මූල්‍යයන වත්කම්වලට අදාළ ක්ෂයවීම ලාභ හා අලාභ ගිණුමට අය කරනු ලබයි.<br><br>ශ්‍රී.ලං.ගි.ප්‍ර 20 හි 12 වන ඡේදයට අනුව ප්‍රදානයන් කාල පරිච්ඡේදය තුළ ක්‍රමානුකූල පදනමකට ගිණුම්ගත කළ යුතුය. කරුණාකර ඉහත ප්‍රමිතියේ 12 සිට 19 ඡේදයන් බලන්න. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 32 හි විධිවිධාන පිළිපැදිය (ශ්‍රී.ලං.ගි.ප්‍ර 32) යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | තවද, ශ්‍රී.ලං.ගි.ප්‍ර 01 හි 45 වන ඡේදයට අනුව, ආයතනයක් මූල්‍ය ප්‍රකාශනයේ අයිතමයන් ඉදිරිපත් කිරීම සහ වර්ගීකරණය එක් කාල පරිච්ඡේදයක සිට තවත් කාල පරිච්ඡේදයක් දක්වා වෙනස් නොවන ලෙස පවත්වා ගනු ඇත. | |
| ii | මුදල් ප්‍රවාහ ප්‍රකාශන පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (ශ්‍රී.ලං.ගි.ප්‍ර 07) 07 වන වගන්තියට පටහැනිව, ඉතිරි කිරීම් ගිණුමක තැන්පත් කරනු ලැබූ රු.1,311,367 ක් ජංගම නොවන වත්කම් යටතේ වර්ගීකරණය කර තිබුණි. | ශ්‍රී.ලං.ගි.ප්‍ර 1 ඡේද 66 ට අනුව වත්කමක් ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කිරීම සඳහා කොන්දේසි හතරක් සපයයි. ලංකා බැංකුවේ ඉතිරි කිරීමේ ගිණුම සම්බන්ධයෙන්,<br>1. එහි දෛනික මෙහෙයුම් චක්‍රය තුළ එය විකිණීමට හෝ පරිභෝජනය කිරීමට<br>2. වාණිජ කටයුතු සඳහා රඳවා ගැනීමට<br>3. මාස දොළහක් ඇතුළත එය උපලබ්ධි කර ගැනීම<br>4. මාස දොළහක් ඇතුළත වගකීම පියවා ගැනීම සඳහා උපයෝජනය කිරීමට.<br>(කළමනාකාරිත්වයට කිසිදු අභිප්‍රායක් නොමැත)<br><br>එබැවින් ශ්‍රී.ලං.ගි.ප්‍ර 7 හි 06 ඡේදය මෙම ඉතිරි කිරීමේ ගිණුමට අදාළ නොවේ. එබැවින් එය ජංගම නොවන වත්කම් ලෙස වර්ගීකරණය කර ඇත. | වත්කම් ජංගම හා ජංගම නොවන ලෙස වර්ගීකරණය කිරීමේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 07- (ශ්‍රී.ලං.ගි.ප්‍ර 07) හි විධිවිධාන පිළිපැදිය යුතු වීම. |
| iii | දේපල, පිරියත සහ උපකරණ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (ශ්‍රී.ලං.ගි.ප්‍ර 16) 51 වන වගන්තියට අනුව, වත්කම්වල ඵලදායී ජීවිත කාලය 2010 වර්ෂයෙන් පසු සමාලෝචනය කර නොතිබුණි. එබැවින් ස්ථාවර වත්කම් කාණ්ඩ 13 කට අදාළව පිරිවැය රු.1,668,151,682 ක් වටිනා සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම් ඒවායේ ඵලදායී ආර්ථික කාලය නැවත තක්සේරු නොකර මණ්ඩලය විසින් අඛණ්ඩව භාවිතා කරනු ලැබේ. | ඒ සඳහා සුදුසු තක්සේරු නිලධාරියෙකුගේ සේවය ලබා ගැනීම දුෂ්කර ය. එබැවින් සුදුසු තක්සේරු නිලධාරියෙකු යොදවා නොමැති නම් එමඟින් මූල්‍ය ප්‍රකාශන නොමග යැවිය හැකිය. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි (ශ්‍රී.ලං.ගි.ප්‍ර 16) විධිවිධාන පිළිපැදිය යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| iv | රජයේ ප්‍රදාන ගිණුම්ගත කිරීම සහ රජයේ ආධාර හෙළිදරව් කිරීම පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (ශ්‍රී.ලං.ගි.ප්‍ර 20) විධිවිධානවලට පටහැනිව, වසර 8 සිට 12 දක්වා කාලයක් තුළ නොවෙනස්ව පැවති ව්‍යාපෘති 31 ට අදාළව එකතුව රු.මිලියන13,580.74 ක් වූ විදේශ ප්‍රදාන ශේෂයන් ක්‍රමක්ෂය කිරීමෙන් තොරව 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවලට ගෙන තිබුණි. මූල්‍ය ප්‍රකාශන සඳහා ක්‍රමක්ෂය නොකිරීමේ බලපෑම විගණනයේදී නිශ්චය කර ගත නොහැකි වූයේ එම විදේශීය ප්‍රදානවලට අදාළ තොරතුරු කිසිවක් නොමැති බැවිනි. | විදේශීය අරමුදල් සපයන ව්‍යාපෘතිවල හිඟ ණය පරිවර්තනය කිරීම සඳහා මහා භාණ්ඩාගාරය විසින් ප්‍රතිපත්තිමය තීරණයක් ගන්නා ලදී. ඒ අනුව ඒවා 2015 වර්ෂය තුළ ස්කන්ධ ප්‍රාග්ධනය බවට පරිවර්තනය කරන ලදී. එබැවින් ගැලපුම් සංකල්පයේ සහ අනුකූලතා සංකල්පයේ ගිණුම්කරණ මූලධර්මවලට අනුකූල වීම සඳහා විදේශ ණයවලට අදාළ ප්‍රදාන සංරචකයන්ද ස්කන්ධ ප්‍රාග්ධනය බවට පරිවර්තනය කළ යුතුය. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී.ලං.ගි.ප්‍ර) 20 හි විධිවිධාන පිළිපැදිය යුතු වීම. |
| v. | ආයෝජන දේපල පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයේ (ශ්‍රී.ලං.ගි.ප්‍ර 40) විධිවිධාන වලට පටහැනිව, ධාරණ අගය ලෙස රු.342,542,802 ක් වූ අයෝජන දේපළ 2018 දෙසැම්බර් 31 දිනට ආයෝජන දේපළ ලෙස දැක්වීම වෙනුවට දේපළ පිරියත හා උපකරණ ලෙස දක්වා තිබුණි.<br>තවද, ප්‍රමිතියේ 75 (ඊ) (i) සහ 79 වගන්තිවලට අනුව, ආයෝජන දේපල වලින් ලැබෙන ආදායම හෙළිදරව් කර නොතිබූ අතර, ක්ෂය කිරීමේ ක්‍රමය, ඵලදායී ජීවිත කාලය හෝ ක්ෂය වීමේ අනුපාතය, දළ ධාරණ වටිනාකම සහ කාල පරිච්ඡේදය ආරම්භක හා අවසාන දිනට සමුච්චිත ක්ෂය සහ අපහායන වටිනාකම ආදිය සම්බන්ධයෙන් මණ්ඩලය විසින් නිසි හෙළිදරව්වක් සිදු කර නොතිබුණි. | ශ්‍රී.ලං.ගි.ප්‍ර 40 හි 14 වන ඡේදයට අනුව, නගර සැලසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් දැනට භාවිත කරන බත්තරමුල්ල සුනිල් මාවත හි මණ්ඩලය විසින් ඉදිකරන ලද ගොඩනැගිල්ල ආයෝජන දේපළ ලෙස අර්ථ දැක්වීම විනිශ්චය මත පදනම් වේ. එබැවින් ඉහත ප්‍රමිතියේ 75 (ඇ) ඡේදයට අනුව මූල්‍ය ප්‍රකාශනයන්හි එවැනි ගැලපීම් අවශ්‍ය නොවේ. | ආයෝජන දේපල ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයේ (ශ්‍රී.ලං.ගි.ප්‍ර 40) ඇති විධිවිධාන පිළිපැදිය යුතු වීම. |
| vi. | මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ විලම්බිත බද්දක් හඳුනාගෙන නොමැති අවස්ථාවක සිදු කළ යුතු හෙළිදරව් කිරීම් වන භාවිතයට නොගත් බදු අලාභ ආදායම් බදු පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (ශ්‍රී.ලං.ගි.ප්‍ර 12) 81 (ඉ) වගන්තිය ප්‍රකාරව, විලම්භිත බද්දක් | අපේක්ෂිත අනාගතය සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට ආදායම් බදු ගෙවීමට සිදු නොවනු ඇත. එබැවින් මූල්‍ය ප්‍රකාශනවල විලම්බිත බදුකරණය සඳහා කිසිදු ප්‍රතිපාදනයක් කිරීම අවශ්‍ය නොවේ. ශ්‍රී.ලං.ගි.ප්‍ර 37 හි 10 වැනි ඡේදයට | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 12 හි (ශ්‍රී.ලං.ගි.ප්‍ර 12) විධිවිධාන පිළිපැදිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | හඳුනාගෙන නොමැති අවස්ථාවක සිදු කළ යුතු හෙළිදරව් කිරීම් වන අඩු කළ තාවකාලික වෙනස්කම් ප්‍රමාණය, භාවිතයට නොගත් බදු අලාභ භාවිතයට නොගත් බදු බැර වැනි අදාළ හෙළිදරව් කිරීමේ අවශ්‍යතා කිසිවක් සිදු කර නොතිබුණි. | අනුව මූල්‍ය ප්‍රකාශනවල වගකීමක් හඳුනාගත හැක්කේ 1. මුදල් පිටතට ගලායාමේ සම්භාවිතාවක් ඇත්නම් සහ 2. වගකීම විශ්වසනීයව මැනීමට හැකිනම් පමණකි.<br>විලම්භිත බද්ද හඳුනා ගැනීම සඳහා ඉහත කොන්දේසි සපුරා නොමැති බැවින් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන වෙන්කිරීම අවශ්‍ය නොවේ. | |
| vii. | අස්පෘශ්‍ය වත්කම් පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ 104 වන වගන්තියේ (ශ්‍රී.ලං.ගි.ප්‍ර 38) නිශ්චිතව දක්වා ඇති පරිදි අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයකදීම අස්පෘශ්‍ය වත්කම් සඳහා ක්‍රමක්ෂය කිරීමේ කාල පරිච්ඡේදය සහ ක්‍රමක්ෂය කිරීමේ ක්‍රමය සමාලෝචනය කිරීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි. | පරිගණක මෘදුකාංග ක්‍රමක්ෂය කිරීම සඳහා වන ගෝලීය පරිචය වසර 7 ක් වන අතර ඒ අනුව අස්පෘශ්‍ය වත්කම් වසර 7 ක කාලයක් තුළ ක්‍රමක්ෂය කර ඇත. මුළු අස්පෘශ්‍ය වත්කම් මුළු වත්කමෙන් 0.0013% කින් සමන්විත වේ. එබැවින් සෑම වසරකම එය සමාලෝචනය කිරීම අවශ්‍ය නොවේ.<br><br>තවද ශ්‍රී.ලං.ගි.ප්‍ර 38 හි 74 වන ඡේදයට අනුව අස්පෘශ්‍ය වත්කම් ගණනය කිරීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය පිරිවැය ආකෘතිය යොදා ගනී. එබැවින් ක්‍රමක්ෂය කිරීමේ කාලය සමාලෝචනය කිරීම අවශ්‍ය නොවේ. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 38 හි (ශ්‍රී.ලං.ගි.ප්‍ර 38) විධිවිධාන පිළිපැදිය යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|---|
| i. | මීට වසර තුනකට (3) පෙර කැලණිය ප්‍රදේශයේ සොරකම් කරන ලද රු. 2,549,787 ක තොග ශේෂයක් 2018 දෙසැම්බර් 31 දිනට වූ තොගයට ඇතුළත් කර තිබුණි. | මේ වන විට කෙරීගෙන යන පරීක්ෂණයක් හේතුවෙන් මෙම මෙම තොග ශේෂය පැවතුණි. ගබඩාවල භාරකරු මේ වන විට විශ්‍රාම ගොස් ඇත. පරීක්ෂණය අවසන් වූ පසු ගිණුම් පොත්වලින් ඉවත් කිරීමට පියවර ගනු ලැබේ. | ගිණුම් පොත් සංශෝධනය කිරීමට සහ වගකිවයුතු නිලධාරීන්ගෙන් අලාභ පියවා ගැනීමට කඩිනමින් පියවර ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| ii. | 2016 වර්ෂය තුළ ගෙවන ලද රු.63,287,387 ක ආර්ථික සේවා ගාස්තු (ESC) විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ ආදායම් බදු වියදම සහ සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ගෙවන ලද බදු ලෙස වැරදියට හඳුනාගෙන තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය සඳහා තථ්‍ය බදු ගෙවීම රු.133,867,477 කි. තවද, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් තථ්‍ය ආදායම් බදු වියදම හඳුනා ගැනීම සඳහා සවිස්තර ආදායම් බදු ගණනය කිරීමක් සිදු කර නොතිබුණි. | පසුගිය දෙවසර තුළ ජාතික ජල සම්පාදන මණ්ඩලයට ආදායම් බදු බැරකමක් නොතිබුණි. ආදායම් බදු වගකීම්වලට එරෙහිව උපරිම වශයෙන් අවුරුදු දෙකක් දක්වා ආර්ථික සේවා ගාස්තු අය කළ හැකිය. එබැවින් 2016 වර්ෂය තුළ ගෙවන ලද ආර්ථික සේවා ගාස්තුව 2018 වර්ෂයේ වියදම් ලෙස අය කරගෙන ඇත. විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ බදුකරණය යන අයිතමය යටතේ මෙය පැහැදිලිව දක්වා ඇත. ආදායම් බදු වගකීම්වලට එරෙහිව උපරිම වශයෙන් අවුරුදු දෙකක් දක්වා ආර්ථික සේවා ගාස්තු අය කළ හැකිය. පසුගිය වසර දෙක තුළ, ආර්ථික සේවා ගාස්තුවට එරෙහිව අය කිරීම සඳහා මණ්ඩලයට බදු බැරකමක් නොතිබුණි. එබැවින් 2016 වර්ෂය තුළ ගෙවන ලද ආර්ථික සේවා ගාස්තු 2018 වියදම් ලෙස අයකරගෙන තිබුණි. ඒ අනුව 2018 වර්ෂය සඳහා ගෙවන ලද ආර්ථික සේවා ගාස්තුව 2018 දී ලැබිය යුතු ආර්ථික සේවා ගාස්තු ලෙස සටහන් වේ. තවද, කාරක ප්‍රාග්ධන ගැලපුමේ මුදල් පිටතට ගලා යාමක් ලෙස ගෙවන ලද ආර්ථික සේවා ගාස්තුව මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ සටහන් විය. එබැවින් ගෙවන ලද ආර්ථික සේවා ගාස්තුවට සමාන මුදල් පිටතට ගලායාම මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වූ මුදල් ප්‍රවාහ යටතේ නිවැරදිව ගලපා ඇත. | විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ ආදායම් බදු වියදම්වල නිරවද්‍යතාවය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ගෙවන සත්‍ය බදු ගෙවීම්වල නිවැරදිතාවය පිළිබඳ සහතික විය යුතු වීම. |
| iii. | විගණනය සඳහා ලබා දී ඇති තොරතුරුවලට අනුව, කිරම කටුවන ජල සම්පාදන ව්‍යාපෘතියට අදාළ හම්බන්තොට ප්‍රදේශිකයෙහි පිහිටි ඉඩම් මණ්ඩලය විසින් නීත්‍යානුකූලව අත්පත් කර ගෙන ඇති බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, එම ඉඩම සඳහා ගෙවා ඇති රු.6,626,000 ක අත්තිකාරම් මුදල 2019 මාර්තු 31 දින වන විටත් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | සම්පූර්ණ අයිතිය මණ්ඩලයට පැවරෙන අවස්ථාවේදී පමණක් අත්තිකාරම් ගෙවීම පියවනු ඇත. | අත්පත් කර ගැනීමේ ක්‍රියාපටිපාටිය අවසන් වූ පසු අත්තිකාරම් නිරවුල් කිරීමට පියවර ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| iv | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2018 දෙසැම්බර් 31 වන විට වෙළඳ ණය ගැතියන් රු .4,779,721,487 ක් විය. කෙසේවෙතත්, ණයගැතියන් වෙනුවෙන් අපහායන සඳහා වෙන්කිරීම් සිදු කර තිබුණේ රු.4,754,467,100 ක් වන ණය ගැතියන් සඳහා පමණක් වන අතර එකතුව රු.25,254,387 ක් වූ ණයගැතියන් සඳහා වෙන් කිරීම් සිදු කොට නොතිබුණි. | ශ්‍රීලංගිප්‍ර 36 ට අනුව, සියලුම වෙළඳ ණය ගැතියන් සඳහා වන අපහායනය ගණනය කරනු ලබන්නේ වාණිජ අංශය විසින් සපයන ලද තොරතුරු වලිනි. තවද පොදු ලෙජරයේ ඇති තොරතුරු භාවිතා කරමින් වෙනත් ණය ගැතියන් සහ මලාපවහන ණය ගැතියන් සඳහා පොදු ප්‍රතිපාදන ගණනය කරනු ලැබේ. | ණය ගැතියන් සඳහා වන අපහායනය සඳහා වූ වෙන්කිරීම්හි නිරවද්‍යතාවය සහතික විය යුතු වීම. |
| v. | අක්කරෙයිපත්තු ප්‍රාදේශීය කාර්යාලයේ භෞතික සත්‍යාපන වාර්තාවලට අනුව රු.59,100,869 ක් වටිනා ස්ථාවර වත්කම් භාවිතයට ගත නොහැකි තත්ත්වයේ පැවති අතර, රු.2,000,000 ක් වටිනා ක්ලෝරිනේටර් නිවසක් සහ රු.115,000 ක් වන ස්වාභාවික පොකුණ මේ වන විටත් අතහැර දමා තිබුණි. කෙසේවෙතත්, එම වත්කම් අපහරණය කිරීමට අවශ්‍ය පියවර ගැනීමකින් තොරව, සමාලෝචිත වර්ෂය තුළ රු.1,299,871 ක ක්ෂය වෙන් කිරීම් සිදු කර තිබුණි. | වත්කම් පරිහරණය නොකලද, එම වත්කම් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී විසින් පත් කරන ලද හා සාමාන්‍යාධිකාරී විසින් අනුමත කරන ලද කමිටුවක් විසින් බැහැර කළ යුතු බව තහවුරු කළ යුතුය. ගිණුම්කරණ ප්‍රමිතියට (ශ්‍රී.ලං.ගි.ප්‍ර 16) අනුව මෙම වත්කම් ඉවතලන තෙක් ක්ෂය කළ යුතුය. | භාවිතයට ගත නොහැකි වත්කම් බැහැර කිරීමටත් ඒ අනුව ගිණුම් පොත් සංශෝධනය කිරීමටත් පියවර ගත යුතුය. |
| vi. | අම්පාර ප්‍රාදේශීය කාර්යාලයේ භෞතික සත්‍යාපන වාර්තාවට අනුව, එකතු වටිනාකම රු.69,659,250 ක වත්කම් භෞතිකව දැක ගත නොහැකි විය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළ රු.1,963,612 ක ක්ෂය වෙන්කිරීම් සිදු කර තිබුණි. තවද, රු.7,088,478 ක් වටිනා ආකෘතීන් කඩා ඉවත් කර ඇති අතර රු.1,300,000 ක් වටිනා තවත් ආකෘතීන් ද්විකරණය වී තිබුණි. එබැවින් එම වත්කම් සඳහා ක්ෂය කිරීම් ලෙස රු.335,478 ක අතිරික්ත ප්‍රතිපාදනයක් සිදු කර තිබූ අතර ඒ හේතුවෙන් ලාභය ඊට සමාන වටිනාකමකින් අවප්‍රමාණය වී තිබුණි. | කඩා දැමූ රු.7,088,478 ක් වටිනා ආකෘතීන් සම්බන්ධයෙන්, ගිණුම් පොත් වලින් ඉවත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම සඳහා මණ්ඩල පත්‍රිකාවක් යොමු කර ඇත. | පොදු ලෙජරයේ වත්කම් යාවත්කාලීන කිරීමට පියවර ගත යුතුය. |
| vii. | ලැබී ඇති තොරතුරු වලට අනුව, රු.3,672,877,899 ක් වටිනා නිම කර ජනතා අයිතියට පත් කරන ලද ජල සම්පාදන හා පුනරුත්ථාපන ව්‍යාපෘති පනස් හයක (56) පිරිවැය ප්‍රාග්ධනිත ගත නොකර 2018 දෙසැම්බර් 31 දිනට කෙරීගෙන යන වැඩ තුළ පැවතුණි. | විවිධ අවස්ථා වලදී තක්සේරු කිරීම සහ වැඩ නිම කිරීම සඳහා අනුමැතිය ලබා ගත යුතු අතර ඒවා මෙම අදියර වල පවතින බව සොයාගෙන ඇත. නිරවුල් කිරීම සඳහා ක්‍රියාමාර්ග ගනු ඇත. | සම්පූර්ණ කරන ලද සහ ජනාතා අයිතියට පත්කරන ලද ජල සම්පාදන හා පුනරුත්ථාපන ව්‍යාපෘති ප්‍රාග්ධනිත කිරීමට පියවර ගත යුතුය. |

viii. 2015, 2016 සහ 2017 වර්ෂවලට අදාළව 2017 සහ 2018 වර්ෂවල මූල්‍ය ප්‍රකාශනයන්හි මණ්ඩලය විසින් පෙර වර්ෂයේ ගැලපුම් සිදු කර ඇති බව නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2017 වසර අවසානයට වූ සමුච්චිත අලාභය රු. මිලියන 429.91 කින් විකෘති වී තිබුණි. එබැවින්, ඉදිරි වර්ෂය තුළදී සමාලෝචිත වර්ෂයේ ලාභයට ගැලපීම් කිරීමට ඇති හැකියාව විගණනයේදී බැහැර කර නොහැක. පෙර වර්ෂවල සිදු කරන ලද එවැනි පෙර වර්ෂයන්ට අදාළ ගැලපීම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| වර්ෂය | හර කළ වටිනාකම | බැර කළ වටිනාකම | සමුච්චිත ලාභයට අදාළ බලපෑම |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| ------ | -------- | ---------- | ---------- |
| 2017 | 5,298,986 | 4,588,000 | 710,986 |
| 2016 | 243,896,877 | 139,680,704 | 104,216,173 |
| 2015 | 370,743,389 | 45,758,713 | 324 984,676 |

ශ්‍රී.ලං.ගි.ප්‍ර 08 ට අනුව එය පූර්ව වර්ෂයට අදාළ දෝෂ නිවැරදි කිරීම නියාමන අවශ්‍යතාවයකි. ඒ අනුව මණ්ඩලය එම අවශ්‍යතාවයට අනුකූලව කටයුතු කර ඇත.

භාවිතයක් ලෙස සිදු කරන පෙර වර්ෂයේ ගැලපීම් මගින් ලාභ විකෘති වීම වළක්වා ගැනීමට පියවර ගත යුතු වීම.

ix. ව්‍යාපෘති විසිතුනක් (23) සම්බන්ධයෙන් කෙරීගෙන යන වැඩ යටතේ දැක්වෙන වටිනාකම රු.166,114,851 ක් වන ශේෂයන් මූල්‍ය ප්‍රකාශයන්හි අවශ්‍ය වෙනස්කම් සිදු කිරීම සඳහා විමර්ශනය නොකර වසර තුනේ සිට දහයට කාලපරිච්ඡේදයක් දක්වා නොවෙනස්ව පැවතුණි.

විවිධ අවස්ථා වලදී තක්සේරු කිරීම සහ වැඩ නිම කිරීම සඳහා අනුමැතිය ලබා ගත යුතු අතර ඒවා මෙම අදියර වල පවතින බව සොයාගෙන ඇත. නිරවුල් කිරීම සඳහා ක්‍රියාමාර්ග ගනු ඇත.

සම්පූර්ණ කරන ලද ජල සම්පාදන හා පුනරුත්ථාපන ව්‍යාපෘති ප්‍රාග්ධනීකරණය කිරීමට පියවර ගත යුතු වීම.

x. කැලණි දකුණු ඉවුරු ජල සම්පාදන ව්‍යාපෘතිය සහ විසල් මාතලේ ජල සම්පාදන ව්‍යාපෘතිය සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ණය හා උපචිත පොලිය බැංකු වලින් ලැබුණු තහවුරු කිරීම් හා සසඳන විට පොලිය සම්බන්ධයෙන් රු.6,974,239 ක අධි ප්‍රතිපාදන සිදු කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමාලෝචිත වර්ෂයේ ලාභය අවතක්සේරු කර ඇති අතර ජංගම වගකීම් සමාන ප්‍රමාණයකින් අධිතක්සේරු කර තිබුණි. තවද, කටාන ජල සම්පාදන ව්‍යාපෘතියට අදාළව, සමාලෝචිත වර්ෂය අවසානයට ඇමරිකානු ඩොලර්වලින් නම් කර ඇති හිඟ ණය ශේෂය රු.1,914,460,917 ක් විය. කෙසේ වෙතත්, බැංකු තහවුරු කිරීම අනුව එය රු.1,793,311,046 ක් වීම

<u>කැලණි දකුණු ඉවුරු ජල සම්පාදන ව්‍යාපෘතිය</u>

2018.12.31 දිනට අදාළ ණය මුදලේ උපචිත පොලිය සමඟ ණය මුදලේ වටිනාකම බැංකුව විසින් තහවුරු කර ඇත. එසේවුවද විස්තරාත්මක ණය උපලේඛනය අනුව උපචිත පොලිය හැර ණය මුදලේ වටිනාකම පෙන්නුම් කරඇත.

ගෙවිය යුතු ණය පොලිය යටතේ උපචිත පොළී මුදල වන රු.297,340,764 ක් මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර තිබුණි.

වසර අවසාන ණය ශේෂය සහ ඒ සඳහා උපචිත පොලිය නිවැරදිව ගණනය කර ඇති බවට සහතික විය යුතු වීම.

| | | | |
|---|---|---|---|
| | හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල වූ විදේශ ණය ශේෂය රු.121,149,871 කින් වැඩියෙන් දක්වා තිබුණි. | <u>විසල් මාතලේ ජල සම්පාදන ව්‍යාපෘතිය</u><br>2018.12.31 දිනට ණය මුදල සහ ණය සඳහා වන උපචිත පොළිය බැංකුව විසින් සනාථ කර ඇත. එසේ වුවද විස්තරාත්මක ණය උපලේඛනය අනුව ගෙවිය යුතු ණය වාරික හා උපචිත පොලිය හැර ණය මුදලේ වටිනාකම දක්වා ඇත.<br><br>මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් අංක 29 හි ගෙවිය යුතු ණය වාරික යටතේ රු.147,032,945 ගෙවිය යුතු ණය වාරිකය ගිණුම්ගත කර තිබුණි.<br><br>මූල්‍ය ප්‍රකාශනයන්හි ගෙවිය යුතු ණය පොලිය යටතේ උපචිත පොළී මුදල රු.257,457,708 ගිණුම්ගත කොට තිබුණි.<br><br><u>කටාන ජල සම්පාදන ව්‍යාපෘතිය</u><br>ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සහ බැංකුව විසින් ගනු ලබන විනිමය අනුපාතය අතර වෙනසක් ඇත. එබැවින් මෙම වෙනස සිදුවන්නේ විනිමය අනුපාතයන්හි සිදුවන වෙනස්කම් හේතුවෙනි. | |
| xi. | සමාලෝචිත වර්ෂය තුළ වාහන විසි හතක් (27) ඉවත් කර තිබුණද, ඉවත් කරන ලද වත්කම්වල ලාභය/ අලාභය ගණනය කිරීමේදී වාහන 19 ක පිරිවැය සහ සමුච්චිත ක්ෂය කිරීම් පමණක් සැලකිල්ලට ගෙන තිබුණි. අනෙකුත් වාහනවල පිරිවැය සමුච්චිත ක්ෂයවීම් සැලකිල්ලට නොගැනීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවලට වූ බලපෑම විගණනයේදී නිශ්චය කර ගැනීමට නොහැකි වූයේ ඊට අදාළ තොරතුරු කිසිවක් නොමැති බැවිනි. | වත්කම් ඉවත් කිරීමේ ලාභය ගණනයේදී පොදු ලෙජරයේ සටහන් කර ඇති ඉවත්කරන ලද වත්කම් නිවැරදිව ගිණුම්ගත කර ඇත. පොදු ලෙජරයේ සටහන් නොවූ වත්කම්වල ලාභ අනෙකුත් ආදායම් යටතේ සටහන් කර හඳුනාගෙන තිබේ. | ඉවත් කරන ස්ථාවර වත්කම්වල ලාභය නිවැරදිව ගණනය කර ඇති බවට සහතික විය යුතු වීම. |
| xii. | කෑගල්ල ප්‍රාදේශීය රසායනාගාරයේ වූ රු.1,096,062 ක තොග ශේෂය සමාලෝචිත වර්ෂය සඳහා සකස් කරන ලද මූල්‍ය ප්‍රකාශයන්හි තොගය ලෙස හඳුනාගෙන නොතිබුණි. | රසායනාගාරයන් සඳහා නිකුත් කරන අයිතමවල පිරිවැය ඒවා නිකුත් කරන විට ලාභ හා අලාභ ගිණුමට අය කෙරේ. මණ්ඩලයේ ගිණුම්කරණ ක්‍රියාපටිපාටියේ දී ආරම්භක හා අවසාන තොගය විකුණුම් පිරිවැයේ කොටසක් ලෙස නොසැලකේ. එබැවින් තොග අධි හෝ ඌන ලෙස අගය කිරීම ලාභයට හෝ අලාභයට බලපාන්නේ නැත. | සියලුම තොග අයිතමයන් මූල්‍ය ප්‍රකාශනවල තොග යටතේ ඇතුළත් කර ඇති බවට සහතික විය යුතු වීම. |

## 1.5.4 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

**විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය**

i. ඌව, මඩකලපුව, බටහිර මධ්‍යම හා දකුණු ප්‍රාදේශිකයන්හි ස්ථාවර වත්කම් ලේඛන හා අනුරූප උපලේඛන අතර එකතුව රු.18,170,606 ක වෙනසක් පැවතීම හේතුවෙන් සින්නක්කර ඉඩම්, ගෘහභාණ්ඩ හා උපාංග සින්නක්කර ගොඩනැගිලි සහ විබෙදුම් යනාදී ස්ථාවර වත්කම් අයිතම 04 ක නිරවද්‍යතාවය හා සම්පූර්ණතාවය විගණනයට තහවුරු කර ගත නොහැකි විය.

විස්තර පහත පරිදි වේ.

| ප්‍රාදේශිකය | වත්කම් වර්ගය | විස්තරාත්මක උපලේඛන අනුව වටිනාකම | ස්ථාවර වත්කම් අනුව වටිනාකම | වෙනස |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| ඌව | ඉඩම් | 300,000 | - | 300,000 |
| | ගෘහභාණ්ඩ | 1,861,963 | 10,996,938 | 9,134,975 |
| මඩකලපුව | ගොඩනැගිලි | 117,786,350 | 112,889,559 | 4,896,791 |
| බටහිර මධ්‍යම | - | 810,074,733 | 808,974,733 | 1,100,000 |
| දකුණ | විබෙදුම් | 2,738,840 | - | 2,738,840 |
| එකතුව | | | | **18,170,606** |

**කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම:**

**මඩකලපුව**

විගණනය මඟින් නැවත අයකර ගත හැකි අරමුදල් යටතේ ලබාගත් ස්ථාවර වත්කම් අතහැර දමා ඇත.

**නිර්දේශය:** ස්ථාවර වත්කම් ලේඛන අනුරූප උපලේඛන සමඟ සැසඳිය යුතු වීම.

ii. පහත වෙනස්කම් නිරීක්ෂණය කරන ලදී.

**(අ) වෙළඳ ණය ගැතියන්**

| | |
|---|---|
| මූල්‍ය ප්‍රකාශන අනුව | 4,779,721,487 |
| වයස් විශ්ලේෂණයට අනුව | 4,607,334,432 |
| වෙනස | 172,387,055 |

**(ආ) නව සම්බන්ධතා ණය ගැතියන්**

| | |
|---|---|
| මූල්‍ය ප්‍රකාශන අනුව | 187,303,893 |
| වයස් විශ්ලේෂණයට අනුව | 65,755,070 |
| වෙනස | 121,548,823 |

**(ඇ) ස්ථාවර වත්කම් ඉවත්කිරීමේ ලැබීම්**

| | |
|---|---|
| මූල්‍ය ප්‍රකාශන අනුව | 12,695,977 |
| විස්තරාත්මක උපලේඛන | 15,961,886 |
| වෙනස | 3,265,909 |

**(ඈ) ස්ථාවර වත්කම් ඉවත් ලාභය**

| | |
|---|---|
| මූල්‍ය ප්‍රකාශන අනුව | 24,193,893 |
| විස්තරාත්මක උපලේඛන අනුව | 20,927,984 |
| වෙනස | 3,265,909 |

**(ඉ) මනු විකුණුම් සහ තොග විකුණුම්**

**කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම:**

(අ) (ආ) සහ (ඉ) වාණිජ පද්ධතිය සහ පොදු ලෙජර් පද්ධතිය වෙනස් අරමුණු දෙකක් සාක්ෂාත් කර ගැනීම සඳහා වින්‍යාස කර ඇත. එබැවින් මෙම පද්ධති දෙක අතර වෙනසක් ඇත. (ඇ) සහ (ඈ) පොදු ලෙජර තුළ හඳුනාගත හැකි සමාලෝචිත වර්ෂය තුළ ඉවත් කරන ලද වත්කම්වල විකුණුම් මුදල්, මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ඇතුළත් කර ඇත. (ඊ) සහ (උ) මේ සඳහා වන විස්තරාත්මක උපලේඛන මේ වන විටත් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණි.

**නිර්දේශය:** මූල්‍ය ප්‍රකාශනවල ශේෂයන් අදාළ කාලසටහන් සමඟ නැවත සකස් කළ යුතු වීම.

| | |
|---|---|
| මූල්‍ය ප්‍රකාශන අනුව | 22,382,424,723 |
| කළමනාකරණ තොරතුරු වාර්තා අනුව | 22,385,300,000 |
| වෙනස | 2,875,277 |

**(ඊ) විශේෂ ව්‍යාපෘති අත්තිකාරම්**
**(ජීසීඩබ්ඩබ්ඩබ්එම්අයිපී -1)**

| | |
|---|---|
| මූල්‍ය ප්‍රකාශන අනුව | 1,786,957,815 |
| විස්තරාත්මක උපලේඛනය අනුව | 1,947,606,836 |
| වෙනස | 160,649,021 |

**(උ) විශේෂ ව්‍යාපෘති අත්තිකාරම්**
**(ජීසීඩබ්ඩබ්ඩබ්එම්අයිපී-2)**

| | |
|---|---|
| මූල්‍ය ප්‍රකාශන අනුව | 2,521,617,447 |
| විස්තරාත්මක උපලේඛනය අනුව | 2,517,208,883 |
| වෙනස | 4,408,564 |

iii. වස්කඩුව, වැල්ලවත්ත සහ වයඹ කලාපයේ ප්‍රදේශයන්හි ගබඩාවල භෞතික තොග සත්‍යාපන වාර්තාවලට අනුව, 2018 දෙසැම්බර් 31 දිනට තොග ශේෂය රු.261,487,780 කි. කෙසේ වෙතත්, මූල්‍ය ප්‍රකාශනවලට අනුව එය රු.248,875,937 කි. ඒ හේතුවෙන්, සමාලෝචිත වර්ෂය අවසානයේ දී තොග ශේෂය රු.12,611,843 කින් අවප්‍රමාණය වී තිබුණි. විස්තර පහත පරිදි වේ.

| ප්‍රාදේශිකය | භෞතික සත්‍යාපන වාර්තා අනුව ශේෂය | ගෙන ඇති තොග වටිනාකම | වෙනස |
|---|---|---|---|
| | රු | රු. | රු. |
| වස්කඩුව ඉදිකිරීම් ගබඩාව | 135,414,831 | 156,306,319 | 20,891,488 |
| වැල්ලවත්ත ගබඩාව | 13,611,539 | 10,605,949 | (3,005,590) |
| වයඹ | 112,461,410 | 81,963,669 | (30,497,741) |
| **මුළු** | **261,487,780** | **248,875,937** | **(12,611,843)** |

අවසාන සහ ආරම්භක තොගය ජාජසජම හි විකුණුම් පිරිවැයෙහි කොටසක් ලෙස නොසැලකේ. එබැවින් තොග අඩුවෙන් හෝ වැඩියෙන් දැක්වීම ලාභයට හෝ අලාභයට බලපාන්නේ නැත.

යටකී වෙනස්කම් සැසඳුම් කළ යුතු වීම.

iv. සිදු කරන ලද නියැදි පරීක්ෂණයට අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති කෙරීගෙන යන වැඩ ශේෂය සහ විදේශ මූල්‍යන ව්‍යාපෘති හයක මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අනුරූප ශේෂයන් අතර රු.49,770,754 ක සමස්ත නිරපේක්ෂ වෙනසක් නිරීක්ෂණය විය.

<u>දැදුරු ඔය ජල සම්පාදන ව්‍යාපෘතිය මොණරාගල බුත්තල ජලසම්පාදන ක්‍රමය/ අළුත්ගම, මතුගම සහ අගලවත්ත ජල සම්පාදන ව්‍යාපෘතියේ ඔරුගොඩවත්ත සිට කඩුවෙල දක්වා සම්ප්‍රේෂණ හා ප්‍රධාන බෙදාහැරීම් නල ප්‍රතිසංස්ථාපනය</u>

යටකී වෙනස්කම් සැසඳිය යුතු වීම.

සංචලන අත්තිකාරම් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 21 හි ඇති තැන්පත් හා අත්තිකාරම් වල ද, ඉතිරිය කෙරීගෙන යන වැඩ ශේෂය තුළද දක්වා ඇත. එසේ වුවද ව්‍යාපෘති අවසන් ගිණුම්වල කෙරීගෙන යන වැඩ ශේෂය හා සංචලන අත්තිකාරම් එකට වාර්තා කර ඇත. එබැවින් මෙම වෙනස සංචලන අත්තිකාරම්වලට අදාළ වේ.

<u>කැලණිය දකුණු ඉවුර ජල සම්පාදන ව්‍යාපෘතිය</u> ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශනවල සංචලන අත්තිකාරම් හා කළ වැඩ වටිනාකම එකට වාර්තා කිරීම මෙම වෙනස තුළ ඇතුළත් වේ. කෙසේ වෙතත් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළ සංචලන අත්තිකාරම් හා කෙරීගෙන යන වැඩ වටිනාකම් වෙනම වාර්තා වේ. තවද කැලණි දකුණු ඉවුරු II හි රු.21,394,970 ක නිම් වැඩ පොල්ගහවෙල, පොතුහැර ජල සම්පාදන ව්‍යාපෘතියේ වාර්තා කොට ඇති බව සටහන් විය.

<u>ආණමඩුව ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය</u> ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශවල සංචලන අත්තිකාරම් හා කළ වැඩ වටිනාකම එකට වාර්තා කිරීම මෙම වෙනස තුළ ඇතුළත් වේ. කෙසේ වෙතත් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශ තුළ සංචලන අත්තිකාරම් හා කෙරීගෙන යන වැඩ වටිනාකම් වෙනම වාර්තා වේ. තවද ඉඩම් ගාස්තු ගෙවීම්

| | | | |
|---|---|---|---|
| | | ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වේ. එසේ වුවද, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල ඉඩම් ගාස්තු ගෙවීම් ඉඩම් ලෙජර් කේතය යටතේ වෙනම වාර්තා කොට තිබුණි.<br><br>**විසල් දඹුල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය/ පොල්ගහවෙල, පොතුහැර ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය**<br>ඉහත ව්‍යාපෘතිවල වෙනස්කම් සඳහා සැසඳුම් අමුණා ඇත. | |
| v. | බැංකු ගිණුම් තුනක් (03) සම්බන්ධයෙන් බැංකු සැසඳුම් ප්‍රකාශවල දක්වා ඇති පිළිවෙලින් රු.8,173,807 සහ රු.43,415,740 ක් වූ හඳුනානොගත් හර ශේෂයන් සහ බැර ශේෂයන් නිරවුල් කර නොතිබුණි. | අදාළ බැංකු උපදෙස් ලංකා බැංකුවෙන් ලබා ගැනීමට මණ්ඩලයට නොහැකි විය. මෙම උපදෙස් බැංකුවෙන් ලබා ගැනීම සඳහා සාකච්ඡා පවත්වනු ලැබේ. මෙම උපදෙස් බැංකුවෙන් ලැබුණු පසු මේවා නිරවුල් වේ. | හඳුනා නොගත් හර සහ බැර ශේෂයන් සැසඳුම් කළ යුතු වීම |

### 1.5.5 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ රත්මලාන, මොරටුව, ජා - ඇල හා ඒකල අපජල කළමනාකරණ ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරුගෙන් ලබාගත් රු. මිලියන 1,607.53 ක් වටිනා කාර්යසාධන බැඳුම්කරය මුදල් බවට පත් කොට ගෙන තිබුණි. කෙසේ වෙතත් එයින් රු. මිලියන 1,240.4 ක් භාණ්ඩාගාර අනුමැතියකින් තොරව දේශීය බැංකුවලට ණය සේවා ගෙවීම සඳහා යොදා ගෙන තිබුණි. | අදහස් දැක්වීමක් කර නොතිබුණි. | අවශ්‍ය අනුමැතිය ලබා නොගෙන ව්‍යාපෘති අරමුදල් බාහිර ක්‍රියාකාරකම් සඳහා යොදා නොගන්නා බවට සහතික වියයුතු වීම. |

### 1.5.6 අවිනිශ්චිත ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශුද්ධ එකතු වටිනාකම රු.793,388,346 ක් වූ මණ්ඩලයේ වත්කම්, වගකීම් හා ස්කන්ධ ශේෂයන් විමර්ශනය කිරීමට පියවර ගැනීමකින් තොරව 2016, 2017 සහ 2018 වර්ෂයන් වලදී අවිනිශ්චිත ගිණුමට මාරු කර තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට අවිනිශ්චිත ගිණුමේ ශේෂය රු.12,780 ක් විය. කෙසේ වෙතත් එම ශේෂයන් නිරවුල් කිරීමට 2019 අප්‍රේල් අවසානය වන විටත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මෙම ශේෂයන් 1999 වර්ෂයේ සිට ඉහළ පහළ යමින් පවතින අතර එය හස්තමය ක්‍රමයක සිට පරිගණක පද්ධතියට පරිවර්තනය කිරීමේ දී සිදු වූ දෝෂයන් හේතුවෙන් ඇති වූවකි. එය ඉවත් කිරීමට විවිධ ක්‍රියාමාර්ග ගන්නා ලදී. විශේෂ කමිටු පත් කිරීම හා විගණන ආයතනවලින් විශේෂ සේවා ලබා ගැනීම යනාදී වශයෙනි. එහි ප්‍රතිඵලයක් ලෙස මණ්ඩල පත්‍රිකාවක් මගින් මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු සමහරක් කපා හැර ඇත. එය නිරවුල් කිරීමට පියවර ගැනීම සඳහා වෙනම ගිණුමකට මාරු කිරීමට තවදුරටත් තීරණය කරන ලදී.<br><br>ඉහත ගිණුම් විමර්ශනය කර නිරවුල් කිරීම සඳහා අතිරේක සාමාන්‍යාධිකාරී (මුදල්) විසින් විශේෂ කමිටුවක් පත් කර ඇති අතර එහි ප්‍රගතිය තවමත් සිදුවෙමින් පවතී. | අවිනිශ්චිත ගිණුම නිරවුල් කිරීමට පියවර ගත යුතු වීම. |

### 1.5.7 ආයතනයේ අඛණ්ඩ පැවැත්ම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | ඉකුත් වර්ෂය හා සන්සන්දනය කරන විට සමාලෝචිත වර්ෂයේ විදේශ ණය ප්‍රමාණය ඉහළ යාම ප්‍රධාන වශයෙන් හේතු කොට ගෙන මණ්ඩලයේ මුළු හිඟ ණය ශේෂය රු.බිලියන 67.16 ක සිට රු.බිලියන 100.26 දක්වා හෙවත් සියයට 49 කින් ඉහළ ගොස් තිබුණි. එසේ හෙයින් ණය ස්කන්ධ අනුපාතය (තෝලන) 2017 වර්ෂයේ සියයට 24 සිට 2018 වර්ෂයේ සියයට 32 දක්වා ඉහළ ගොස් තිබුණි.<br><br>තවද, මණ්ඩලය විසින් 2018 දෙසැම්බර් 31 දින වන විට තවත් රු.බිලියන 253 ක දේශීය හා විදේශීය ණය සඳහා බැඳී තිබුණි. ඒ අනුව, මණ්ඩලය විසින් ඉදිරි වසර 5 තුළ දේශීය හා විදේශීය ණය සඳහා ප්‍රාග්ධනය සහ පොලිය ලෙස වාර්ෂිකව රු. බිලියන 19 ක් ගෙවිය යුතුය. අනාගත කාල පරිච්ඡේදයන් සඳහා | 2012 වර්ෂයේ සිට ක්‍රියාත්මක විය යුතු ජල ගාස්තු සංශෝධනය මේ දක්වා බලාත්මක නොවේ. ජල ගාස්තු වැඩි කිරීම සඳහා මණ්ඩලය විසින් මහා භාණ්ඩාගාරයට යෝජනාවක් ඉදිරිපත් කර ඇත. වසරකට 4% ක උද්ධමනය හේතුවෙන් සිදුවන පිරිවැය වැඩිවීමට වර්තමානයේදී මණ්ඩලයේ ආදායමට අනුරූප විය නොහැක.<br><br>පසුගිය වසර 6 තුළ ජල ගාස්තු අනුපාතයන් සංශෝධනය කර නොතිබුණද, වර්ෂයකට ලක්ෂයකට වඩා වැඩියෙන් වර්ධනය වන පාරිභෝගික පදනම සමඟ විකුණන ලද ජල ප්‍රමාණය වැඩි වී ඇත.<br>තවද, මහා භාණ්ඩාගාරය විසින් ලබා දී ඇති ඇපකරය මත පදනම්ව මණ්ඩලය ණය බැඳීම් සඳහා එළැඹුණු අතර මෙම තත්ත්වය අවස්ථා කිහිපයකදීම මහා භාණ්ඩාගාරයට සහ රේඛීය | වහාම ක්‍රියාත්මක වන පරිදි නිසි ආදායම් වැඩි දියුණු කිරීම සහ පිරිවැය අඩු කිරීමේ යාන්ත්‍රණයක් හඳුන්වා දීමට පියවර ගත යුතුය. |

| | |
|---|---|
| මණ්ඩලයට ආදායම් වැඩි දියුණු කිරීම සඳහා හෝ පිරිවැය අඩු කිරීම සඳහා නිසි වැඩ සටහනක් නොමැති හෙයින්, අනාගත ණය සේවාකරණය හේතුවෙන් මණ්ඩලයට දැඩි මුදල් ප්‍රවාහ ගැටළු ඇති විය හැකි අතර එය මෙහෙයුම් කටයුතුවලට හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම සඳහා ද බලපානු ඇත. | අමාත්‍යාංශයට දන්වා ඇත.<br><br>මෙම තත්වය මඟහරවා ගැනීම සඳහා මහ භාණ්ඩාගාරය විසින් මණ්ඩලයට<br>1. එක් එක් ණය සඳහා භාණ්ඩාගාර ඇපකරය<br>2. නාගරික ව්‍යාපෘති සඳහා ලබාගත් ණය ආපසු ගෙවීමෙන් 50% ක් ද ග්‍රාමීය ව්‍යාපෘති සඳහා ලබාගත් ණය ආපසු ගෙවීමෙන් 75% ක් ද මලාපවහන ව්‍යාපෘති සඳහා ලබාගත් ණය ආපසු ගෙවීම් මගින් 100% ක් ද ගෙවීමට ද මහා භාණ්ඩාගාරය එකඟ වී තිබේ.<br><br>3. ව්‍යාපෘතිවල වියදම් පියවා ගැනීම සඳහා 2015 දී රු.බිලියන 13 ක භාණ්ඩාගාර බැඳුම්කරයක් ලබා දීම සහ ණය ආපසු ගෙවීම සහ පොළිය පියවා ගැනීම සඳහා 2019 දී රු.බිලියන 6 ක් ලබා දීමට එකඟ වීම යනාදී වශයෙන් වන්දි පහසුකම් කිහිපයක් ලබා දී ඇත<br><br>ඒ අනුව ඉහත සඳහන් වශයෙන් ණය බැඳීම් සපුරාලීම සඳහා මණ්ඩලයට මූල්‍ය ආධාර සපයන බව පෙනී යයි. සෑම වසර තුනකට වරක් වැටුප් වැඩිවීමට ආදායමේ වැඩිවීම සැලකිල්ලට ගනී. සෑම වසරකම ආදායම් වැඩිවීම සාමාන්‍යයෙන් 7% ක් පෙන්නුම් කරන අතර ඒ අනුව වසර තුනක් සඳහා වැඩිවීම සාමාන්‍යයෙන් 21% ක් පෙන්නුම් කරයි. එබැවින් වැටුප් වැඩිවීම ආදායමේ වැඩිවීමට ගැලපෙන ලෙස සැලකේ. එබැවින් වැටුප් වැඩිවීම මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට බලපාන්නේ නැත. |

**1.5.8 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| | විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| අ) | නව සම්බන්ධතා ණය ගැතියන් | 184,612,724 | විස්තරාත්මක උපලේඛන සහ වයස් විශ්ලේෂණය | අ) සියලුම නව සම්බන්ධතා ණය ගැතියන්ගේ උපලේඛන (273) මූල්‍ය ප්‍රකාශන සමඟ විගණනයට ඉදිරිපත් කර ඇත.<br><br>(ආ) 1999 දී ලබා දුන් | (i) දත්ත පද්ධතියක් තුළ එක් එක් ණය ගැතියන්ගේ සහ ණය හිමියන්ගේ විස්තරාත්මක උපලේඛන |
| ආ) | විශේෂ ප්‍රසාද දීමනා | 13,309,832 | විස්තරාත්මක උපලේඛන | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| ඈ) | වෙනත් ණය ගැතියන් | 24,443,502 | විස්තරාත්මක උපලේඛන | රු.10,529,933 ක විශේෂ අත්තිකාරම් සේවකයින් විශ්‍රාම යන විට අය කර ගත යුතුය. මෙය එකල අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කර ඇත. එබැවින් මෙය නිරවුල් කළ හැක්කේ එම සේවකයින් සම්පූර්ණයෙන්ම විශ්‍රාම යන විට පමණි. | පවත්වා ගැනීමට පියවර ගත යුතු වීම. |
| ඇ) | චලනය නොවන හා සෙමින් චලනය වන තොග | 1,127,874,983 | වයස් විශ්ලේෂණය | | (ii) විස්තරාත්මකව බදු ගණනය කිරීමෙන් පසුව වියදම ආදායම් ප්‍රකාශයේ හඳුනාගත යුතු වීම. |
| ඉ) | කළ වැඩ වටිනාකම | 247,666,512,803 | ප්‍රාදේශීය සහය මධ්‍යස්ථානයන්හි ව්‍යාපෘති අනුව විස්තරාත්මක උපලේඛන | (ඈ) අනෙකුත් සියලුම ණය ගැතියන්ගේ උපලේඛන මූල්‍ය ප්‍රකාශන සමඟ විගණනයට ඉදිරිපත් කර ඇත. | |
| ඊ) | දේපළ, පිරියත සහ උපකරණ | 86,631,779,732 | ස්ථාවර වත්කම් ලේඛණ සහ සත්‍යාපන වාර්තා | | (iii) විගණනයට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට පෙර බැංකු තහවුරු කිරීම් ගත යුතු වීම. |
| උ) | වෙළඳ ණය හිමියන් | 110,803,940 | විස්තරාත්මක උපලේඛන | (ඇ) චලනය නොවන හා සෙමින් චලනය වන තොග විස්තර විගණනයට තොග සත්‍යාපන වාර්තා සමඟ සපයනු ලැබේ. අතිවිශාල තොග පදනමක් ඇති බැවින් වයස් විශ්ලේෂණයක් සකස් කිරීමට මණ්ඩලයට නොහැකි විය. | |
| ඌ) | වෙනත් ණය හිමියන් | 89,949,095 | විස්තරාත්මක උපලේඛන | | (iv) මූල්‍ය ප්‍රකාශන සමඟ සියලුම උපලේඛන විගණනයට ඉදිරිපත් කළ යුතු වීම. |
| එ) | බදු වියදම | 63,287,387 | ආදායම් බදු ගණනය කිරීම | | |
| ඒ) | ආයෝජන (කල්පිරීම සඳහා පවත්වා ගන්නා) | 208,742 | ස්ථාවර තැන්පතු සහතික, බැංකු තහවුරු කිරීම් | | |
| ඉ) | දේශීය මූලාශ්‍ර ණය | 6,724,006 | විස්තරාත්මක උපලේඛන, ප්‍රාදේශීය ණය සංවර්ධන අරමුදලෙන් තහවුරු කිරීම | (ඉ) ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානය අනුව කළ වැඩ විස්තර හා උපලේඛන විගණනයට ඉදිරිපත් කර ඇත. | |
| | | | | (ඊ) සම්පූර්ණ කරන ලද ස්ථාවර වත්කම් සත්‍යාපන වාර්තා ඉදිරිපත් කර ඇති අතර ඉදිරිපත් නොකළ වාර්තා තවමත් පිළියෙල වෙමින් පවතී. | |
| | | | | (උ) වෙළඳ ණය හිමියන් සඳහා වන උපලේඛන දැනටමත් මූල්‍ය ප්‍රකාශන සමඟ විගණනයට ඉදිරිපත් කර ඇත. | |

(ඍ) වෙනත් ණය හිමියන් සඳහා වන උපලේඛන දැනටමත් මූල්‍ය ප්‍රකාශන සමඟ විගණනයට ඉදිරිපත් කර ඇත.

(එ) 2018/2019 වර්ෂය සඳහා බදු ගණනය කිරීම 2019 නොවැම්බර් 30 දින දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට නියමිතය.

(ඒ) දේශීය බැංකු සහ විදේශ බැංකු තහවුරු කිරීම් සඳහා වන ඉල්ලීම අදාළ බැංකුවලට යවා ඇත.

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | එකතුව රු. මිලියන 1,153 ක් වූ වෙළඳ ණයගැතියන්, මලාපවහන ණයගැතියන් සහ වෙනත් ණයගැතියන් ආපසු අයකර නොගෙන වසර දෙකකට වැඩි කාලයක් පැවතුණි. එයින් සියයට 63 ක් කොළඹ, කැලණිය, කෝට්ටේ සහ දෙහිවල ප්‍රාදේශිකවල ණයගැතියන් නියෝජනය කරනු ලැබේ. | මණ්ඩලයේ ප්‍රතිපත්තිය වන්නේ වසර දෙකකට වැඩි ණයගැතියන් සඳහා සම්පූර්ණ ප්‍රතිපාදන සැපයීමයි. නමුත් එය අයකර ගැනීමේ ක්‍රියාවලිය අඛණ්ඩව සිදු කෙරේ. එය රතු දැන්වීම් යැවීම, ජලය විසන්ධි කිරීම සහ නීතිමය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම යනාදී වශයෙනි. මණ්ඩලය සාමාන්‍ය ජනතාවට අත්‍යවශ්‍ය සේවාවක් සපයන බැවින් ණය ගැතියන් සම්බන්ධයෙන් මණ්ඩලය තද බල නොවූ පියවර ගනු ලැබේ. | ණය ගැතියන්ගෙන් නියමිත මුදල අයකර ගැනීමට ප්‍රමාණවත් හා අවශ්‍ය පියවර ගත යුතු වීම. |
| ii. | අහඹු ලෙස තෝරාගත් රු.178,131,134 ක වෙළඳ ණය ගැතියන් සඳහා සෘජුවම ශේෂ තහවුරු කිරීම් යවා ඇත. රු.1,613,601 ක් වන ණය ගැතියන් තහවුරු කිරීම් සමඟ එකඟ වන අතර රු.1,173,787 ක් වන ණය ගැතියන් තහවුරු කිරීම් සමඟ එකඟ නොවේ. | වෙළඳ ණයගැතියන් වන පාරිභෝගිකයින් තහවුරු කිරීමේ ඉල්ලීමට ප්‍රතිචාර නොදක්වයි. | පවත්නා පාරිභෝගික දත්ත පද්ධතියේ නිරවද්‍යතාවය සමාලෝචනය කිරීමට පියවර ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | 2019 අප්‍රේල් 30 දක්වා රු.175,343,746 ක් වූ ණයගැතියන් සම්බන්ධයෙන් තහවුරු කිරීම ලැබී නොතිබුණි. | | |
| iii. | ශ්‍රී ජයවර්ධනපුර රෝහලෙන් අයකර ගත යුතුවන මලාපවහන ණයගැතියන් යටතේ රු.6,872,181 කට සමාන මුදලක් දක්වා තිබුණි. කෙසේ වෙතත්, මේ වන විටත් රු.5,263,268 ක් නිරවුල් කර තිබූ හෙයින්, රු.1,608,913 ක් අයකර ගත යුතුව පැවතුණි. | කළමනාකරු (ජයවඩනගම) කාර්යාලයේ ඇති දත්ත වලට අනුව 2018 හි මාසික බිල්පත් ඉහත උපලේඛනය අනුව ගෙවා තිබුණි. මේ මත පදනම්ව, 2018 ට අදාළ සියලුම බිල්පත් 2019.02.14 වන විට ගෙවා ඇති බව නිරීක්ෂණය විය. | පොදු ලෙජරයට ගනුදෙනු නිවැරදිව සටහන් කර ඇති බවට සහතික විය යුතු වීම. |

| මාසය | මාසික බිල රු. | ගෙවූ දිනය |
|---|---|---|
| ජනවාරි | 1,141,070.56 | මාර්තු 26 |
| පෙබරවාරි | 895,185.36 | මැයි 04 |
| මාර්තු | 880,832.47 | මැයි 17 |
| අප්‍රේල් | 886,465.90 | ජූනි 29 |
| මැයි | 825,133.80 | ජූලි 29 |
| ජූනි | 847,491.10 | අගෝස්තු 27 |
| ජූලි | 948,973.88 | ඔක්තෝබර්, 02 |
| අගෝස්තු | 693,960.66 | ඔක්තෝබර් 19 |
| සැප්තැම්බර් | 728,805.05 | නොවැම්බර් 02 |
| ඔක්තෝබර් | 1,014,207.98 | නොවැම්බර් 28 |
| නොවැම්බර් | 595,622.61 | ජනවාරි 01 |
| දෙසැම්බර් | 580,331.23 | පෙබරවාරි 14 |

| | | | |
|---|---|---|---|
| iv. | 2018 දෙසැම්බර් 31 වන විට විසන්ධි වූ ණයගැති ශේෂය රු.1,292,910,373 ක් විය. එම ණයගැතියන්ගෙන් රු.986,940,330 ක් වන හෙවත් සියයට 76 කට සමාන ප්‍රමාණයක් අයකර ගැනීමෙන් තොරව වසර දෙකකට වැඩි කාලයක් පැවතුණි. | අයකර ගැනීමේ ක්‍රියාවලිය සඳහා සැලකිය යුතු කාලයක් ගතවේ. එය දින 30 කට පසු රතු දැන්වීම් යැවීම සහ දින 90 කට පසු නීතිමය ක්‍රියාමාර්ග ගැනීම යනාදී වශයෙනි. තවද විශාල පාරිභෝගිකයින් සංඛ්‍යාවක් සිටින හෙයින් නැවත අයකර ගැනීම සඳහා වන නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට සැලකිය යුතු කාලයක් ගතවන අතර එය නීතිපති දෙපාර්තමේන්තුව විසින් මෙහෙයවිය යුතු වේ. | අයකර ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමට පියවර ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| v. | බටහිර උතුර ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානය විසින් ප්‍රාදේශීය මාර්ග සංවර්ධන අධිකාරියේ තබා තිබූ රු.1,000,000 ක කෙටිකාලීන තැන්පත් ඊට අදාළ ව්‍යාපෘතිය අවසන් වී වසර තුනක් ඉක්මවා ගියද 2018 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි. | 120RCA2019/ 12 කුවිතාන්සිය හරහා 2016.03.05 දිනට රු.1,000,000 ක් වැනි කෙටි කාලීන තැන්පතු දැනටමත් ලැබී තිබේ. | ව්‍යාපෘතිය අවසන් වූ වහාම අයකර ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමට පියවර ගත යුතු වීම. |
| vi. | මාර්ග සංවර්ධන අධිකාරිය, කොළඹ මහ නගර සභාව, බේරුවල මහ නගර සභාව, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය සහ නගර සභාව ඇතුළු වෙනත් ආයතනවල තබා ඇති රු.7,393,610 ක කෙටිකාලීන තැන්පතු ආපසු අයකර නොගෙන වසර තුනක් තිස්සේ හිඟව පැවතුනි. | ඔවුන්ගේ මුදල් ආපසු ලබා ගැනීම සඳහා පියවර කිහිපයක් ගත් නමුත් අවශ්‍ය ලියකියවිලි නොමැති නිසා ඒවා ආපසු ලබා ගැනීමට නොහැකි විය. නුදුරු අනාගතයේ දී ඉදිරි ක්‍රියාමාර්ග ගනු ඇත. | ව්‍යාපෘතිය අවසන් වූ වහාම අයකර ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමට පියවර ගත යුතු වීම. |
| vii. | කොන්ත්‍රාත්කරුවන්ගෙන් රඳවා තබා ගැනීම් සහ ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු පිළිවෙලින් රු.486,914,669 සහ රු.6,953,762 ක් වසර තුනක් තුළ නොවෙනස්ව පැවතුනි. තවද, එම රඳවා තබා ගැනීම් හා තැන්පතු සම්බන්ධ කොන්ත්‍රාත්තු අවසන් වී ඇත්දැයි තහවුරු කර ගැනීම සඳහා විගණනයට කිසිදු සාක්ෂියක් ලබා දී නොමැත. | වසර තුනකට පසු, සම්පූර්ණ කරන ලද ව්‍යාපෘතිවල කොන්ත්‍රාත්කරුවන්ගේ රඳවා තබා ගැනීම් සහ ආපසු ගෙවිය හැකි ටෙන්ඩර් තැන්පතු සාමාන්‍යයෙන් ලාභ හා අලාභ ගිණුමට මාරු කරනු ලැබේ. | කොන්ත්‍රාත්කරුවන්ගේ රඳවා තබා ගැනීම් සහ ආපසු ගෙවිය හැකි ටෙන්ඩර් තැන්පතු වල නොවෙනස්ව පවතින ශේෂයන් විමර්ශනය කිරීමට පියවර ගත යුතු වීම. |

**1.6.2 ගෙවිය යුතු මුදල්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | රු.35,519,035 ක් වූ අනෙකුත් ණය හිමියන් වසර 03 කට වඩා වැඩි කාලයක සිට නිරවුල් කර නොතිබුණි. තවද, මණ්ඩලය වෙනත් ණය හිමියන්ගේ නිසි දත්ත පද්ධතියක් පවත්වා ගෙන නොතිබූ බැවින් ඒවායේ වටිනාකම විගණනයේදී සත්‍යාක්ෂණය කර ගත නොහැකි විය. | පැහැදිලි කිරීම්වල ගැටලුවක් පවතින අතර මේ සම්බන්ධයෙන් නිසි ප්‍රතිපත්තියක් ගත යුතුය. | පැහැදිලි කිරීමේ දෝෂ මගහරවා ගැනීම සඳහා ඉහත සඳහන් ප්‍රතිපත්තිය හඳුන්වාදීමට කඩිනම් කිරීමට පියවර ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| ii. | රු.177,141,105 ක් වූ නිරවුල් නොකළ ණය හිමියන් 2018 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් නොකර ප්‍රාදේශික 13 ක් තුළ වසර දෙකකට වැඩි කාලයක් පැවතුණි. | මෙම ඡේදයේ දක්වා ඇති තොරතුරු අදාළ නිරවුල් නොකළ ශේෂයන් හඳුනා ගැනීමට ප්‍රමාණවත් නොවේ. | වසර 02 ක් තිස්සේ නිරවුල් නොකළ ණය හිමියන්ගේ ශේෂය විමර්ශනය කිරීමට පියවර ගත යුතු වීම. |

### 1.6.3 අත්තිකාරම්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | 2009 සිට 2015 දක්වා ඉඩම් අත්පත් කර ගැනීම සඳහා එකතුව රු.119,138,100 ක් අත්තිකාරම් ගෙවා තිබුණි. කෙසේ වෙතත්, ඉඩම් නීත්‍යානුකූලව අත්පත් කර ගෙන තිබේද යන්න තහවුරු කර ගැනීම සඳහා විගණනයට කිසිදු සාක්ෂියක් ලබා දී නොතිබුණි. | ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියට සැලකිය යුතු කාලයක් ගතවේ. ඉඩම අත්පත් කර ගැනීම සඳහා අත්තිකාරම් තැන්පතුවක් ගෙවූ විට, එය නිරවුල් වන තෙක් මණ්ඩලයට වසර ගණනාවක් බලා සිටීමට සිදු වේ. අදාළ නීතිමය ලියකියවිලි මණ්ඩලයේ ඉඩම් අංශයේ ඇත. | දීර්ඝ කාලයක් තිස්සේ පවතින ඉඩම් අත්තිකාරම් නිරවුල් කිරීමට පියවර ගත යුතු වීම. |
| ii. | 2018 දෙසැම්බර් 31 දින වන විට එකතුව රු.1,460,424,649 ක අත්තිකාරම් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා ඇති අතර එයින් රු.682,861,632 ක් වසර 3 කට වැඩි කාලයක් හිඟව පැවතුණි. තවද, මධ්‍යම ප්‍රාදේශිකයේ ගෙවා ඇති අත්තිකාරම් සම්බන්ධයෙන් එකතුව රු.9,278,336 ක අත්තිකාරම් සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති වුවද, 2018 දෙසැම්බර් 31 දක්වා එය විසඳා නොතිබුණි. | ව්‍යාපෘතිවල කොන්ත්‍රාත්කරුවන්ට ලබා දී ඇති සංචලන අත්තිකාරම් අයකර ගැනීම කොන්ත්‍රාත් නියමයන්ට අනුව සිදු කළ ද එය කොන්ත්‍රාත්කරුගේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය මත රඳා පවතී. ශ්‍රී ලංකා රජයේ දායකය ගෙවීම් ප්‍රමාද වීම හේතුවෙන් භෞතික හා මූල්‍ය ප්‍රගතිය අඩු විය. අත්තිකාරම් අයකර ගැනීම ප්‍රමාද වීමට ප්‍රධාන හේතුව මෙය වේ. | කොන්ත්‍රාත්තුව අවසන් වූ විට ගෙවන ලද කොන්ත්‍රාත් අත්තිකාරම් අයකර ගෙන ඇති බවට සහතික කරගත යුතු වීම. |
| iii. | නැවත අය කළ හැකි වැඩ සඳහා අත්තිකාරම් මුදල රු.6,302,459,963 ක් විය. එම අත්තිකාරම් අතරින් ව්‍යාපෘති 89 ක් සඳහා ලැබුණු රු.472,643,548 ක් වසර දෙකකට වඩා වැඩි කාලයක් නොවෙනස්ව පැවතුණි. තවද, මෙම ව්‍යාපෘති නිම කර තිබේද නැද්ද යන්න තහවුරු කර ගැනීම සඳහා විගණනය සඳහා කිසිදු සාක්ෂියක් ඉදිරිපත් කර නොතිබුණි. | කෙසේ වෙතත්, අත්තිකාරම් වලින් ව්‍යාපෘති 89 ක් සඳහා ලද රු.472,643,548 ක මුදලක් වසර 2 ක් නොවෙනස්ව පැවතුණි.<br>ස්වභාවයෙන්ම නැවත අය කළ හැකි ව්‍යාපෘති අඛණ්ඩව සිදුවෙමින් පවතින අතර ගනුදෙනුකරුගේ අවශ්‍යතා මත පදනම්ව වැඩ කටයුතු ක්‍රමක්‍රමයෙන් අවසන් කරනු ලබයි. ඒ හේතුවෙන් එකී වැඩ කටයුතු ඉහත කී ආකාරයට අවසන් වූ පසු ගෙවීම් සඳහා බිල්පත් ඉදිරිපත් කරනු ලැබේ. මණ්ඩලයේ වගකිවයුතු ඉංජිනේරු විසින් වැඩ අවසන් කිරීමේ සහතික නිකුත් කරන තෙක් එවැනි ව්‍යාපෘතියක් නිම කළ බව අපට සලකා බැලිය නොහැක. එබැවින් අපගේ වාර්තාවල ශේෂයන් දිගු කලක් නොවෙනස්ව පැවතිය හැකිය. | නැවත අය කළ හැකි වැඩවල නොවෙනස්ව පවතින ශේෂය විමර්ශනය කිරීමට පියවර ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | ඉහත සඳහන් ශේෂයන්ගෙන් 2019 දී නිරවුල් කිරීම් සිදු කර ඇත. | |
| iv. | ගාලු ප්‍රදේශයේ අපජල අපහරණ කිරීමේ ව්‍යාපෘතිය යටතේ අපජල පවිත්‍රාගාරයක් ඉදිකිරීම සඳහා මණ්ඩලය විසින් මිලදී ගත් ඉඩමක් තක්සේරු දෙපාර්තමේන්තුව විසින් රු.මිලියන 71.5 කට තක්සේරු කර ඇති අතර රු.මිලියන 21.25 ක අත්තිකාරම් මුදලක් 2014 අප්‍රේල් මාසයේ දී ඉඩම් හිමියාට ඉඩමේ අයිතිය සලකා බැලීමෙන් තොරව ලබා දී තිබුණි. කෙසේ වෙතත්, පවුල් කිහිපයක් විසින් ඉඩම අත්පත් කර ගෙන ඇති බවත් අත්තිකාරම් ලබා ගැනීමෙන් පසුව අයිතිකරු විසින් ඉඩමෙන් පස් ඉවත් කරගෙන ඇති බවත් විගණනයට නිරීක්ෂණය විය. | **ගාල්ල අපජල අපහරණ ව්‍යාපෘතිය** මෙම ව්‍යාපෘතිය සඳහා ඉඩම් අංශය ස්වාධීනව ඉඩම් අත්පත් කර ගැනීම සිදු කරනු ලබන අතර නීති අංශය විසින් අත්තිකාරම් ගෙවීම අයකර ගැනීම සඳහා වෙනම පරීක්ෂණයක් සිදු කරනු ලැබේ. | ඉඩම් හිමියාට දැනටමත් ගෙවා ඇති අත්තිකාරම් අයකර ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමට පියවර ගත යුතු වීම. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|
| i. | සාමාන්‍යාධිකාරීගේ 2015 අගෝස්තු 12 දිනැති පරිපාලන චක්‍රලේඛය 1/12/2015 | ප්‍රාදේශික 30 ක මාස 3 සිට මාස 183 දක්වා කාලයක් තිස්සේ විසන්ධි කරන ලද පාරිභෝගිකයින් 2049 ක් සම්බන්ධයෙන් රු.520,687,090 ක් වටිනා හිඟ බිල්පත් අයකර ගැනීමට නීතිමය පියවර ගෙන නොතිබුණි. | නීතිපති දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව නීතිමය ක්‍රියාමාර්ග ගන්නා ලදී. | සාමාන්‍යාධිකාරී චක්‍රලේඛවල ඇති විධිවිධාන පිළිපැදිය යුතු වීම. |
| ii. | 2015 ජනවාරි 10 දිනැති PED/ASD/02/ Veh.Circular/ 2015 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය | ධාවන තත්ත්වයේ නොපවතින මහරගම කළමනාකරණ කාර්යාලයේ බවුසර් දෙකක් සහ යතුරුපැදි තුනක් ද බටහිර උතුර ප්‍රාදේශීය සේවා මධ්‍යස්ථානයේ මෝටර් රථ නවයක් 2018 දෙසැම්බර් 31 දින වන විටත් ඉවත් කර නොතිබුණි. | JV-5994/ 48-5686/ LA-5749 යන වාහන බැහැර කිරීමට පියවර ගෙන ඇත.<br><br>පහත සඳහන් වාහන අලුත්වැඩියා කිරීමට පියවර ගෙන ඇත. JV-5919/ TQ-2366 | භාණ්ඩාගාර චක්‍රලේඛ වල විධිවිධාන පිළිපැදිය යුතු බව. |
| iii. | ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |

| | | | | |
|---|---|---|---|---|
| අ) | මුදල් රෙගුලාසි 770 | රු.28,460,008 ක් වටිනා යල් පැන ගිය තොග බැහැර කිරීමට පියවර නොගෙන එය 2018 මූල්‍ය ප්‍රකාශනය තුළ ඇතුළත් කර තිබුණි. | මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් පසු යල් පැන ගිය තොග බැහැර කරනු ලැබේ | මූල්‍ය රෙගුලාසිවල විධිවිධාන පිළිපැදිය යුතු වීම. |
| ආ) | මුදල් රෙගුලාසි 756 | 2018 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණය 2019 අප්‍රේල් 30 වන විටත් අවසන් කර නොතිබුණි. | පිළිතුරක් ලබා දී නැත. | මූල්‍ය රෙගුලාසිවල විධිවිධාන පිළිපැදිය යුතු වීම. |
| iv. | 1974 අංක 2 දරණ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ (1) කොටසෙහි 05 වන වගන්තිය | 2019 අප්‍රේල් 30 වන විටත් ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයෙන් කිසිදු මණ්ඩල සාමාජිකයෙකු පත් කර නොතිබුණි. | පිළිතුරක් ලබා දී නැත. | 1974 අංක 2 දරණ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ විධිවිධාන පිළිපැදිය යුතු වීම. |
| v. | 2017 පෙබරවාරි 15 දිනැති අංක 1/2017 දරණ කළමනාකරණ විගණන චක්‍රලේඛය | විදේශීය අරමුදල් මගින් මූල්‍යයනය වන සංවර්ධන ව්‍යාපෘති සඳහා පූර්ණ කාලීන හෝ අර්ධ කාලීන පදනමින් අභ්‍යන්තර විගණකවරුන් පත් කර නොතිබුණි. | පිළිතුරක් ලබා දී නැත. | කළමනාකරණ විගණන චක්‍රලේඛ වල විධිවිධාන පිළිපැදිය යුතු වීම. |
| vi. | 2003 ජුනි 02 දිනැති PED/ 12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 වගන්තිය | මණ්ඩලය විසින් 2018 ඔක්තෝබර් 16 වන විට රේඛීය අමාත්‍යාංශයට මුදා හරින ලද සේවකයින් අසූ පහක් (85) දෙනෙකුගේ වැටුප් හා දීමනා වශයෙන් රු.58,583,402 ක් සමාලෝචිත වර්ෂය තුළ දී මණ්ඩලය විසින් ගෙවා තිබුණි. ඒ අනුව 2015 දෙසැම්බර් සිට 2018 දෙසැම්බර් 31 දක්වා මණ්ඩලයෙන් නිදහස් කරන ලද සේවකයින් සඳහා නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය විසින් රු.146,423,663 ට සමාන මුදලක් ප්‍රතිපූරණය කළ යුතුය. | මණ්ඩලය, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය යටතට ගැනේ. අමාත්‍යාංශය තුළ ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැතිවීම හේතුවෙන් මණ්ඩලය ක්‍රියාකාරකම් හා සම්බන්ධ හදිසි තාක්ෂණික හා වෙනත් කාර්යයන් සඳහා කාර්ය මණ්ඩලය නිදහස් කරන ලෙස අමාත්‍යාංශයේ ලේකම් ඉල්ලීම් කළ විට, මණ්ඩලයට ඔවුන්ගේ වැටුප් ප්‍රතිපූරණය කිරීමේ පදනම මත තාවකාලිකව අමාත්‍යාංශයට මණ්ඩලයේ සේවකයින් මුදා හරිනු ලැබේ. කෙසේ වෙතත්, එම වැටුප් ප්‍රතිපූරණය කිරීම සඳහා අවශ්‍ය අයවැය | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ වල විධිවිධාන පිළිපැදිය යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | | ප්‍රතිපාදන තමන් සතුව නොමැති බව අමාත්‍යාංශය විසින් දැනුම් දී ඇත. | |
| vii. | ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | |
| අ) | XIV ඡේදයේ 8.1.2 වගන්තිය | තමන්ගේ වාහන රාජකාරී ගමන් සඳහා යෙදවීම වෙනුවෙන් සේවකයින් 12 දෙනෙකු සඳහා, පූර්ව අනුමැතියකින් තොරව ඉන්ධන සඳහා රු.967,412 ක් ගෙවා තිබුණි. | පිළිතුරක් ලබා දී නැත. | ආයතන සංග්‍රහයේ විධිවිධාන පිළිපැදිය යුතු වීම. |
| ආ) | XIX ඡේදයේ 6.1 වගන්තිය | අනුරාධපුර ප්‍රාදේශිකයේ නිල නිවාස 11 ක් සේවකයින් විසින් අවුරුදු 07 සිට අවුරුදු 22ක් දක්වා කාලයක් අත්පත් කරගෙන තිබුණි. | මණ්ඩලය විසින් පියවර කිහිපයක් ගෙන ඇති අතර වැඩිදුර ක්‍රියාමාර්ග තවමත් ක්‍රියාත්මක වෙමින් පවතී. | ආයතන සංග්‍රහයේ විධිවිධාන පිළිපැදිය යුතු වීම. |

**1.8 මුදල් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | 1999 සිට 2006 දක්වා කාලය තුළ ත්‍රිකුණාමලය, කැලණිය සහ අම්පාර ප්‍රාදේශිකවල සිදු කළ රු.මිලියන 248.44 ක මුදල් වංචාව 2018 දෙසැම්බර් 31 දක්වා වගකිවයුත්තන්ගෙන් අය කර ගෙන නොතිබුණි. | මේ වන විට ත්‍රිකුණාමල මහාධිකරණයේ නීති කටයුතු සිදු කෙරෙමින් පවතී. කැලණිය වංචාව සම්බන්ධයෙන් දැනටමත් තීන්දුවක් ලබා දී ඇති අතර ඔහුට සිර දඬුවම් නියම කර ඇත. ඉහත කී අපරාධ නඩුවලට අමතරව, ඉහත පුද්ගලයින්ගෙන් මූල්‍යමය පාඩු පියවා ගැනීම සඳහා මණ්ඩලය විසින් ගල්කිස්ස දිසා අධිකරණයේ සිවිල් නඩු පවරා ඇත. | අනාගතයේ දී පහත සඳහන් තත්වයන් වලක්වා ගැනීම සඳහා අභ්‍යන්තර පාලන ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක වන බවට සහතික විය යුතු වීම. |
| ii. | 2000 සිට 2001 දක්වා කාලය තුළ කුරුණෑගල ප්‍රාදේශිකයේ සිදු කළ රු.1,337,135 ක මුදල් වංචාව අයකර ගෙන නොමැති අතර 2019 මාර්තු 31 දින දක්වා කිසිදු නීතිමය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | අයකැමිට එරෙහිව කුරුණෑගල මහාධිකරණයේ නඩුවක් ගොනු කර තිබේ. මේ වන විට නීතිමය කටයුතු සිදු කෙරෙමින් පවතින අතර නීතිපති දෙපාර්තමේන්තුව මේ වන විට අවශ්‍ය පියවර ගනිමින් සිටී. | අනාගතයේ දී මෙම තත්ත්වයන් වලක්වා ගැනීම සඳහා අභ්‍යන්තර පාලන ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක වන බවට සහතික විය යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලයේ වටිනාකම රු.505,408,042 ක බදු පෙර ශුද්ධ අලාභයක් වූ අතර ඉකුත් වර්ෂයේ අනුරූප ලාභය රු.1,877,317,582 ක් විය. එබැවින් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,382,725,624 ක් වන දැවැන්ත පිරිහීමක් නිරීක්ෂණය විය. විකුණුම් පිරිවැයෙහි හා පරිපාලන වියදම් වල සැලකිය යුතු වර්ධනය විශේෂයෙන්ම සියයට 23 ක වැටුප් වැඩිවීම හා මූල්‍ය වියදමෙහි වූ වර්ධනය මෙම පිරිහීමට හේතු වී තිබුණි.

## 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන් වල ප්‍රවණතා විශ්ලේෂණය

| විස්තරය | විචලන වටිනාකම<br>රු. මිලියන | විචලනය වැඩිවීම/ (අඩුවීම) සියයට | විචලනයට හේතු |
|---|---|---|---|
| විකුණුම් පිරිවැය | 1,625 | 11 | වැටුප් වැඩිවීම හේතුවෙන් කාර්ය මණ්ඩල පිරිවැය ඉහළ යාම පොම්ප කිරීමේ පිරිවැය, අළුත්වැඩියා හා නඩත්තුව, කුලී සහ ගාස්තු යනාදිය ඉහළ යාම. |
| වෙනත් මෙහෙයුම් ආදායම | 662 | (38) | මලාපවහන, භූගත ජලය සහ අධිභාර ආදායම අඩුවීම |
| ණය සඳහා පොළිය | 263 | 1922 | වර්ෂය තුළ ණය ලබා ගැනීම් වැඩි වීම. |

## 2.3 අනුපාත විශ්ලේෂණය

ලබා දී ඇති තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා මණ්ඩලයේ වැදගත් අනුපාත කිහිපයක් පහත පරිදි වේ.

| වර්ෂය | **2018** | **2017** |
|---|---|---|
| දළ ලාභ ආන්තිකය | 36.22 | 40.50 |
| ශුද්ධ ලාභ ආන්තිකය | (2.30) | 7.61 |
| ජංගම අනුපාතය (වාර ගණන) | 2.81 | 4.14 |
| ක්ෂණික අනුපාතය (වාර ගණන) | 2.48 | 3.72 |
| මුළු වත්කම් පිරිවැටුම (වාර ගණන) | 0.05 | 0.05 |

ඉහත තොරතුරුවලට අනුව, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ ප්‍රධාන මූල්‍ය අනුපාතයන්හි අහිතකර තත්ත්වයක් පෙන්නුම් කර තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය සඳහා වූ ශුද්ධ ලාභ ආන්තිකය සියයට 2.30 දක්වා විශාල ලෙස අඩු වී තිබුණි. වර්ෂය තුළ ආයෝජන ඉවත් කර ගැනීම සහ ණය හා වෙනත් ගෙවිය යුතු දෑ ක්‍රමානුකූලව වැඩිවීම හේතුවෙන් ජංගම අනුපාතය සහ ක්ෂණික අනුපාතය පිළිවෙලින් 1.33 සහ 1.24 ගුණයකින් වැඩි වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| i. | කළු ගඟට මුහුදු ජලය මිශ්‍ර වීම නිසා ඇති වූ පානීය ජල ගැටලුවට විසඳුමක් ලෙස 2016 පෙබරවාරි 03 වන දින රු.11,284,500 ක කොන්ත්‍රාත් වටිනාකමකින් ලවණ බාධකයක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබුණි. කෙසේ වෙතත් ජලයේ ලවණ සාන්ද්‍රණය අපේක්ෂිත පරිදි අඩු වී නොතිබූ බැවින් ඒ සඳහා වැය කළ මුළු පිරිවැය අනාර්ථික වී තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කොන්ත්‍රාත්තු සැලසුම් කර ඇති බවට සහතික විය යුතු වීම. |
| ii. | රු.බිලියන 3.5 ක ණය පහසුකම යටතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ මීටර් 16,700 ක නල එළීම් වැඩි දියුණු කිරීම සඳහා, 2015 පෙබරවාරි 16 වන දින මාස 9 ක කාලයක් සඳහා ගිවිසුමක් අත්සන් කර තිබුණි. ඉහත නල එළීමේ කටයුතු සඳහා පයිප්ප හා උපාංග මිලදී ගැනීම වෙනුවෙන් රු.75,582,616 ක කොන්ත්‍රාත්තුවකට එළඹුණු අතර ඒ අනුව ප්‍රසම්පාදනයන් සිදු කර තිබුණි. කෙසේ වෙතත්, ඉහත සඳහන් යෝජනා ක්‍රම නවයක් අතුරින් මීටර් 1179 ක් සඳහා ජල සම්පාදන යෝජනා ක්‍රම 3 ක් පමණක් සම්බන්ධයෙන් නල ඇතිරීම් සිදු කර තිබුණි. එබැවින් ව්‍යාපෘති කටයුතු වලින් සියයට 7 ක් සම්පූර්ණ කිරීමෙන් පසු කොන්ත්‍රාත්තුව අවසන් කරන ලදී. ඒ අනුව ඉතිරි එළීම් සඳහා පයිප්ප හා උපාංග මිලදී ගැනීම වෙනුවෙන් දැරූ මුදල් ආර්ථිකමය නොවන තත්වයකට පත්ව තිබුණි. | අදහස් දැක්වීමක් කර නොතිබුණි | (i) අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කොන්ත්‍රාත්තු සැලසුම් කර ඇති බවට සහතික විය යුතු වීම.<br><br>(ii) ව්‍යාපෘතියක් ආරම්භයේ සිට නිම කිරීම දක්වා නිසි අධීක්ෂණ යාන්ත්‍රණයක් පවතින බවට සහතික විය යුතු වීම. |

### 3.2 හඳුනාගත් පාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| i. | සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති නවයක් සම්බන්ධයෙන් වරායෙන් අමුද්‍රව්‍ය බහාලුම් නිදහස් කිරීම ප්‍රමාද වීම හේතුවෙන් රු.මිලියන 625 ට සමාන මුදලක් දඩ මුදල් ලෙස දරා තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | ආනයනික භාණ්ඩ කිසිදු ප්‍රමාදයකින් තොරව නිදහස් කරවා ගැනීමට අවශ්‍ය පියවර ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| ii. | අනුරාධපුර ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානයේ නිල නිවාස 50 ක මාසික කුලිය සම්බන්ධයෙන් විගණනයට ලබා දී ඇති තොරතුරු වලට අනුව, නිවාස 34 කින් රු.60 සිට රු.500 දක්වා මාසික කුලියක් පමණක් අය කර ගෙන තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | නිල නිවාස සඳහා මාසික කුලිය සංශෝධනය කිරීමට පියවර ගත යුතු වීම. |

**3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | 2019 අප්‍රේල් 08 දින වන විට අනුරාධපුර ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානයේදී රු.25,000 ට වැඩි බිල්පත් වටිනාකමකින් යුතු පාරිභෝගිකයින් 60 දෙනෙකුගෙන් අය කර ගත යුතු රු.3,820,937 ක ශේෂයක් මාස 03ට කට වඩා වැඩි කාලයක් හිඟව පවතින බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත් එදින වන විට සම්බන්ධතා විසන්ධි කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | හිඟ පාරිභෝගිකයින්ගේ සම්බන්ධතා විසන්ධි කිරීමට කඩිනම් පියවර ගත යුතු වීම. |
| ii. | මහා කොළඹ ජල පුනරුත්ථාපන ව්‍යාපෘතියේ කටයුතු 2016 දෙසැම්බර් 31 දින වන විට සැලකිය යුතු ලෙස අවසන් කර තිබුණි. කෙසේ වෙතත්, මෙම ව්‍යාපෘතිය යටතේ ජල කුළුණක් සහ කාර්යාලයක් ඉදිකිරීම සඳහා 2001 දී කොලොන්නාව ප්‍රාදේශීය ලේකම්ගෙන් බදු පදනම මත ඉඩමක් මිල දී ගෙන තිබූ අතර බදු ගිවිසුමකට එළඹීමකින් තොරව 2018 දෙසැම්බර් 31 දක්වා රු.මිලියන 4.2 ක් ගෙවා තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | බැඳීම් මත පමණක් ගෙවීම් කිරීමට පියවර ගත යුතු අතර ගෙවීමට නිසි එකඟතාවයකින් තොරව කිසිදු ගෙවීමක් සිදු නොකළ යුතු වීම. |
| iii. | 2008 සිට 2017 දක්වා කාලය තුළ මනුසටහන්කරුවෙකු විසින් කළුතර ප්‍රදේශයේ සිදු කරන ලද රු.1,145,235 ක වංචාවක් 2019 මාර්තු 31 වන දින වන විටත් වගකිවයුතු පුද්ගලයින්ගෙන් අය කරගෙන නොතිබුණි. තවද, ව්‍යාජ මනු කියවීම් හේතුවෙන් මණ්ඩලයට වන අලාභ සේවකයින්ගෙන් අයකර ගැනීමට නිසි යාන්ත්‍රණයක් මණ්ඩලය විසින් හඳුන්වා දී නොමැති බව නිරීක්ෂණය වූ අතර ඒ සඳහා වන පරිපාලන චක්‍රලේඛ යාවත්කාලීන කර නොතිබුණි. | මනු කියවන්නා විසින් මනු කියවීම වැරදියට වාර්තා කොට ඇති අතර එම නිසා මණ්ඩලයට රු.මිලියන 1.1 ක අලාභයක් සිදුවිය. දැනට සේවකයා නිසි ලෙස ආයතනයට දැනුම් නොදී සේවයෙන් ඉවත් වී ඇත.<br><br>අලාභය ගණනය කිරීමට පියවර ගෙන ඇති අතර එවැනි අවස්ථාවන් සඳහා වන පාඩු ගණනය කිරීම සඳහා ක්‍රමවේදයක් හඳුන්වා දෙන ලෙස වාණිජ අංශයට දැනුම් දී ඇත. | ව්‍යාජ මනු කියවීම හේතුවෙන් සේවකයින්ගෙන් සිදුවන පාඩු පියවා ගැනීම සඳහා නිසි යාන්ත්‍රණයක් හඳුන්වා දීමටත්, ඒ සඳහා පවත්නා පරිපාලන චක්‍රලේඛ යාවත්කාලීන කිරීමටත් කඩිනම් පියවර ගත යුතු වීම. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මණ්ඩලයේ ණය සේවාකරණ ධාරිතාවය දුර්වල වීම හේතුවෙන්, 2014 වර්ෂයෙන් පසු ආරම්භ කරන ලද ව්‍යාපෘති සඳහා ලබාගෙන ඇති රු.67,153,332,380 ක් වන හිඟ ණය මුදල 2015 සිට 2018 දක්වා රජයේ ස්කන්ධ ගිණුමට මාරු කර තිබුණි. කෙසේ වෙතත්, මහා භාණ්ඩාගාරයේ වාර්තා වලට අනුව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙනුවෙන් ගෙවිය යුතු ණය වශයෙන් රු.54,937,651,218 ට සමාන මුදලක් ප්‍රාග්ධනිත කොට තිබුණි. එබැවින් විදේශීය ණය වශයෙන් මණ්ඩලය විසින් ගෙවිය යුතු රු.12,218,681,163 ට සමාන මුදලක් කිසිදු අනුමැතියකින් තොරව රජයේ ස්කන්ධ ගිණුමට මාරු කර තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | නුදුරු අනාගතයේ දී ණය සේවාකරණ වගකීම සපුරාලීම සඳහා මුදල් ප්‍රවාහ වැඩි දියුණු කිරීමට පියවර ගත යුතු වීම. |

**3.5 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| i. | 2018 දෙසැම්බර් 31 දිනට ආනයනික මාර්ගස්ථ තොග වටිනාකම රු.1,345,932,727 ක් විය. ඒ අතරින් රු.740,955,941 ක් වූ තොග මාස හයකට වඩා වැඩි කාලයක් තිස්සේ විමර්ශනයකින් තොරව මාර්ගස්ථ තොග ලෙස පැවතුණි. | අදහස් දක්වා නොතිබුණි. | දීර්ඝ කාලීනව පවතින මාර්ගස්ථ තොග ශේෂය පිළිබඳව විමර්ශනය කිරීමට පියවර ගත යුතු වීම. |
| ii. | තොග භෞතිකව සත්‍යාපනය කිරීමට පෙර සියලුම තොග ලැබීම් සහ නිකුත් කිරීම් තොග වාර්තා වල සටහන් කළ යුතු වේ. කෙසේවෙතත්, තොග ලැබීම් හා නිකුත් කිරීම් සම්බන්ධයෙන් ශුද්ධ හර ශේෂය වූ රු.445,785,905 ක් සහ ශුද්ධ බැර ශේෂය වූ රු.306,580,310 ක් තොග සමීක්ෂණයකින් පසුව තොග ශේෂයට ගලපා තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | තොග භෞතික වශයෙන් සත්‍යාපනය කිරීමට පෙර සියලුම තොග ලැබීම් සහ තොග නිකුත් කිරීම්, තොග වාර්තාවල සටහන් කිරීමට පියවර ගත යුතු වීම. |
| iii. | විශේෂ විමර්ශන අංශයන්හි පිරිවැය මධ්‍යස්ථාන හතරට අදාළව මාර්ගස්ථ තොග වශයෙන් රු.35,315,564 ක අසාමාන්‍ය තොග ශේෂයක් පැවතුණි. | අදහස් දක්වා නොතිබුණි. | මාර්ගස්ථ තොගයේ ඇති අසාමාන්‍ය බැර ශේෂය විමර්ශනය කර නිරවුල් කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| iv. | 2018 දෙසැම්බර් 31 දිනට ණය හිමි පාලන ගිණුමේ එකතුව වන රු.2,897,360 ක අසාමාන්‍ය හර ශේෂයක් පැවතුණි. | අදහස් දක්වා නොතිබුණි. | ණය හිමි පාලන ගිණුමේ ඇති අසාමාන්‍ය හර ශේෂය විමර්ශනය කර නිරවුල් කළ යුතු වීම. |

## 3.6 අරමුදල් ඌන උපයෝජනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | සමාලෝචිත වර්ෂය සඳහා ගම්පහ, අත්තනගල්ල හා මිනුවන්ගොඩ ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය හා කළුතර, මතුගම, අගලවත්ත ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා වෙන් කර තිබූ පිළිවෙලින් රු.බිලියන 7 ක් හා රු.බිලියන 13.6 ක විදේශ ප්‍රතිපාදන වලින් රු.950,942,952 ක් හා රු.2,183,249,626 ක් හෙවත් පිළිවෙලින් සියයට 14 හා සියයට 16 ක් සමාලෝචිත වර්ෂය තුළ භාවිතා කර තිබුණි. | ගම්පහ අත්තනගල්ල මිනුවන්ගොඩ ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියේ වටිනාකම රු.බිලියන 29.1 ක් වන අතර කොන්ත්‍රාත් කාලය 2017 පෙබරවාරි සිට වසර 03 ක කාලයකි. එම නිසා 2018 වර්ෂයට පුරෝකථන වටිනාකම වූ රු.බිලියන 07 තාත්වික වේ. කෙසේ වෙතත් රු.බිලියන 9.6 ක් වන කොන්ත්‍රාත් වැඩවලින් සියයට 30 ක් ජල සම්පාදන මණ්ඩලය වෙත උපකොන්ත්‍රාත් ලබා දී ඇත. 2018 වර්ෂයේ දී රු. බිලියන 2 ක් වන කොන්ත්‍රාත් ප්‍රදානය කරනු ලැබූ අතර සියයට 20 ක අත්තිකාරම් ගෙවීමක් හෙවත් රු.බිලියන 0.4 ක් උපයෝජනය කර ඇත. ප්‍රදානය කරන ලද ප්‍රධාන කොන්ත්‍රාත්තුව නැවත සලකා බලන ලෙස දක්වමින් මුදල් අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද කැබිනට් පත්‍රිකාවේ ප්‍රතිඵලය වූයේ කොන්ත්‍රාත්තු 2ක් සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු පත් නොකිරීම සහ අනෙක් කොන්ත්‍රාත්තුවේ නිර්දේශයන් සඳහා කැබිනට් අනුමැතියට ඉදිරිපත් කිරීම අත්හිටුවීමයි. වර්ෂයේ අවසානයේ කැබිනට් මණ්ඩලය මාස කීපයක සිට ක්‍රියාත්මක නොවූ අතර වක්‍ර වැඩ සඳහා වූ උප කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා 2018 වර්ෂයේදී කැබිනට් අනුමැතිය ලබා ගත නොහැකි විය. එමඟින් වක්‍ර වැඩ සඳහා වූ උපකොන්ත්‍රාත් ප්‍රසම්පාදනය කෙරෙහි විශාල බලපෑමක් ඇති වූ අතර එය ජල සම්පාදන මණ්ඩලයේ පාලනයෙන් මුළුමනින්ම බැහැරව වූවක් වන අතර වක්‍ර වැඩ සඳහා අත්තිකාරම් වෙනුවෙන් රු.බිලියන 1.5 ක් 2018 වර්ෂයේදී බෙදාහැරීම අඩු විය.<br><br>උපකොන්ත්‍රාත් වැඩ සඳහා පයිප්ප, උපාංග හා වෙනත් ද්‍රව්‍ය සැපයීම 2018 වසර තුළ සම්පූර්ණ කිරීමට නියමිතව තිබුණි. ගම්පහ, අත්තනගල්ල හා මිනුවන්ගොඩ ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියෙහි දේශීය සංරචකයන් වන ඉඩම් අත්පත් කර ගැනීම හා නැවත පදිංචි කිරීම, රේගු බදු, වැට් බදු යනාදිය සඳහා කැබිනට් අනුමැතිය ලබා දී තිබුණද ප්‍රාග්ධන අයවැය මඟින් ප්‍රමාණවත් මුදල් වෙන් කර නොමැත. ඊට විකල්පයක් ලෙස ජල සම්පාදන මණ්ඩලයට දේශීය බැංකුවකින් (මහජන බැංකුව) ණයක් ලබා ගැනීමට සිදු විය. අයවැය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ හෙයින් ආනයනය කරන ද්‍රව්‍ය වෙනුවෙන් එකතු කළ අගය මත බදු, ජාතිය | ව්‍යාපෘතිය සඳහා වෙන් කර ඇති අරමුදල් සම්පූර්ණයෙන් භාවිතා කරන බවට තහවුරු කර ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | ගොඩනැගීමේ බදු හා රේගු බදු ගෙවීමට නොහැකි වූ නිසා සැපයූ ද්‍රව්‍ය වරායේ රඳවා තබා ගත් අතර වරාය අධිකාරියට ගෙවිය යුතු බදු හා දඩ පොලී තවදුරටත් එකතු විය. දේශීය බැංකු ණය උපයෝගී කරගනිමින් වරාය ගාස්තු ගෙවීම සඳහා විශේෂ කැබිනට් අනුමැතියක් ලබා ගත යුතු වූ අතර වරාය ගාස්තු හා කුලී ගෙවීම සඳහා කිසිදු ප්‍රතිපාදනයක් කර නොතිබුණි. මෙම පාලනය කළ නොහැකි තත්ත්වය හේතුවෙන් ද්‍රව්‍ය නැව්ගත කිරීම දින නියමයක් නොමැතිව ප්‍රමාද කිරීමට සිදු විය. ඒ අනුව ද්‍රව්‍ය සැපයීම සඳහා ඇස්තමේන්තු ගෙවීම රු.බිලියන 3.2 ක් වූ නමුත් 2018 වර්ෂය තුළ වෙන්කොට ඇත්තේ රු.බිලියන 0.4 ක් පමණි.<br>නැව්ගත කරන ලද ද්‍රව්‍ය නිදහස් කර ගැනීම ප්‍රමාදවීම නිසා සැපයුම සඳහා ගෙවීම පමණක් නොව එළීමේ ක්‍රියාවලියද ප්‍රමාද වීමට හේතු විය. එම නිසා කොන්ත්‍රාත් ප්‍රදානය නොකිරීම හා එළීම සඳහා ද්‍රව්‍ය සැපයීමේ නොහැකියාව නිසා සැලසුම් කළ ආකාරයට නළ එළීම සඳහා මුදල් වෙන් කළ නොහැකි විය. | |
| ii. | සමාලෝචිත වර්ෂය තුළ මොරටුව, රත්මලාන, ජා ඇල, ඒකල අපජල වැඩි දියුණු කිරීමේ යෝජනා ක්‍රමය සඳහා රජයේ දායක මුදල් වශයෙන් රු.7,005,042 ක් වෙන් කර තිබුණි. කෙසේ වෙතත් ඉන් කිසිදු වියදමක් දරා නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | ව්‍යාපෘතීන් සඳහා වෙන්කරන ලද අරමුදල් සම්පූර්ණයෙන් ම භාවිතා කරන බවට තහවුරු කළ යුතු වීම. |

### 3.7 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | විසල් මහනුවර ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ රසායනාගාරයන් ඉදිකිරීම සඳහා රු.166,993,899 ක් වැය කර තිබුණි. කෙසේ වෙතත් සේවකයන් බඳවා ගැනීමේ දුර්වලතාවය නිසා රසායනාගාරය අතහැර දමා තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | විසල් මහනුවර ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ ඉදිකර ඇති රසායනාගාරයේ සම්පත් භාවිතා කිරීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතු වීම. |
| ii. | මණ්ඩලයේ ප්‍රධාන ගබඩාව තුළ රු.19,106,552 ක් වටිනා ජල මීටර් අමතර කොටස් අක්‍රිය තත්ත්වයේ පැවතුණි. කෙසේ වෙතත් ඒවා සැපයුම්කරුවන්ට නැවත භාර දීමට කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | වගකීමේ කාලය තුළ පවතින ජල මීටර් අමතර කොටස් සැපයුම්කරුවන් වෙත ආපසු භාරදීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| iii. | 2018 ඔක්තෝබර් 10 දිනට ප්‍රධාන ගබඩාව තුළ එකිනෙකට වෙනස් විෂ්කම්භයන් තුනකට අයත් රු.95,495,710 ක් වටිනා ජල මනු 23,922 ක් පැවතුණි. කෙසේ වෙතත් මෙම ජල මනුවල සාමාන්‍ය වාර්ෂික පරිභෝජනය මත පදනම්ව (විගණනයෙන් හෙළි වූයේ) තවත් වසර 5 සිට 10 දක්වා කාලයක් තුළ ගබඩා හා පොළිය වශයෙන් විශාල පිරිවැයක් දරමින් මෙම අයිතමයන් රඳවා තබා ගැනීමට සිදු වනු ඇති බව විගණනයට අනාවරණය විය. | අදහස් දක්වා නොතිබුණි. | තොග පාලන මට්ටම් සැලකිල්ලට ගනිමින් ජල මනු සඳහා ඉදිරියේදී ඇණවුම් සිදු කළ යුතු වීම. |
| iv. | 2018 ඔක්තෝබර් 31 දිනට රත්මලාන වැඩබිම තුළ පාවිච්චියට ගත නොහැකි තත්ත්වයේ පවතින පරිමාණයන් 06කට අයත් වටිනාකම රු.13,724,670 ක් වූ ජල මීටර් අමතර කොටස් 4982 ක් වසර 01 සිට වසර 06 කට වඩා වැඩි කාල පරාසයක සිට පැවතුණි. තවද රු.3,409,612 ක් වන අමතර කොටස්වල වගකීම් කාලය ඉකුත් වී තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | තොග පාලන මට්ටම් සැලකිල්ලට ගනිමින් ජල මනු අමතර කොටස් සඳහා අනාගතයේදී ඇණවුම් සිදු කළ යුතු වීම. |
| v. | ගාල්ල දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක හා නඩත්තු කාර්යාලයට අයත් ජල සම්පාදන ව්‍යාපෘති තුනකට හා මලාපවහන ව්‍යාපෘතියකට අදාළ ජල ටැංකි තුනක් හා පොම්පාගාර තුනක් 1982 වර්ෂයේ සිට අක්‍රීය තත්ත්වයේ පැවතුණි. | අදහස් දක්වා නොතිබුණි. | ජල පොම්පාගාර හා ජල ටැංකි පාවිච්චියට ගැනීම පිළිබඳ ක්‍රියාමාර්ග ගත යුතු වීම. |
| vi. | 2018 දෙසැම්බර් 31 දිනට චලනය නොවන තොග සහ සෙමින් චලනය වන තොග වටිනාකම් පිළිවෙලින් රු.511,522,599 ක් හා රු.616,322,384 ක් විය. ඒවා මණ්ඩලයේ මුළු තොග වලින් සියයට 6 ක් හා සියයට 7 ක් නියෝජනය කර තිබුණි. | මණ්ඩලය විසින් සපයන සේවාවන්හි ස්වභාවය අනුව අවශ්‍ය කරන පයිප්ප හා උපාංග ආනයනය කරන තෙක් අලුත්වැඩියා කටයුතු සිදු කිරීමට බලා සිටිය නොහැකිය. එම නිසා හදිසි අවශ්‍යතාවයන්ට මුහුණ දීම සඳහා ඇතැම් වර්ගයේ පයිප්ප හා උපාංග ආනයනය කොට වැඩබිම්හි රඳවා ගනු ලැබේ. | ඉදිරියේදී චලනය නොවන සහ සෙමින් චලනය වන තොග මගහරවා ගැනීම සඳහා තොග පාලන මට්ටම් පිළිබඳ සැලකිල්ලට ගනිමින් අනාගතයේදී තොග ඇණවුම් කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| vii. | 2012 වර්ෂයේදී විසල් ගාල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ හපුගල ජල පවිත්‍රාගාරය ඉදිකිරීම සඳහා රු.මිලියන 16 ක් වැය කරමින් ඉඩමක් පවරාගෙන තිබුණි. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂය අවසන් වන තුරු මෙම ඉඩම අපේක්ෂිත කාර්ය සඳහා යොදවා නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | ඉඩම විකල්ප ප්‍රයෝජනයකට යොදා ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතු වීම. |
| viii. | අවිස්සාවේල්ල වැඩභාර නිලධාරී කාර්යාලයේ වටිනාකම රු.1,027,059 ක් වූ රසායනාගාර උපකරණ තොගයක් නිෂ්ක්‍රීය තත්ත්වයේ පැවතුණි. | රසායනඥවරයෙකු සේවයේ යෙදවීමට කාර්ය මණ්ඩල අනුමැතියක් නොමැති නිසා රාසායනඥයෙකුගේ සේවය ලබාගත නොහැකි බැවින් රසායනාගාර උපකරණ භාවිත කළ නොහැකි විය. මහරගම කළමනාකරු කාර්යාලයේ රසායනඥයකුගේ සේවය 2019 වර්ෂයේ සිට ලබා ගනු ලබයි. | සම්පත් පවතින විට ඒවා ප්‍රයෝජනයට ගැනීමට ක්‍රියාමාර්ග හඳුන්වා දිය යුතු වීම. |
| ix. | යාපනය කිලිනොච්චි ප්‍රදේශයට පානීය ජලය ලබා දීමට මුහුදු ජලයේ ලවණ ඉවත් කිරීම සඳහා පවිත්‍රාගාරය ඉදිකිරීම 2022 වර්ෂය වන විට නිම කිරීමට අපේක්ෂා කොට තිබුණි. ඒ අනුව, 2018 දෙසැම්බර් 31 දින වන විට රු. මිලියන 1,140 ක් වැය කර ජල කුළුණු 15ක් සහ රු.මිලියන 5,536 ක් වැය කර පිරිපහදු ජලය සම්ප්‍රේෂණ නල මාර්ග ඇතිරීම නිම කොට තිබුණි. කෙසේ වෙතත් මෙම සියලුම ඉදිකිරීම් ජල මූලාශ්‍රවල හිඟකම නිසා අක්‍රීය තත්ත්වයේ පැවතුණි. | යාපනය කිලිනොච්චි ව්‍යාපෘතිය සඳහා ADB ණය ගිවිසුම 2011 මැයි සිට බලාත්මක වේ. කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ඉරණමඩු වාරිමාර්ග ජලාශය ජල මූලාශ්‍රය ලෙස තෝරා ගෙන තිබුණි. කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ගොවීන් ගොවිතැන් සඳහා මෙම වැව භාවිතා කරනු ලබයි. මෙහි ජලය ගොවීන් සමඟ බෙදා ගැනීම සඳහා ජල සම්පාදන මණ්ඩලය, උතුරු නැගෙනහිර කෘෂිකර්ම හා වාරිමාර්ග අමාත්‍යාංශය සහ ප්‍රාදේශීය සභාව සමඟ 2007 වසරේදී අවබෝධතා ගිවිසුමක් අත්සන් කොට තිබුණි. ඉරණමඩු ජලාශයේ පවත්නා ධාරිතාව අඩි 02 කින් වැඩි කිරීමට මෙම ව්‍යාපෘතිය මඟින් සැලසුම් කර ඇත.<br><br>ජලය බෙදා ගැනීමේ ගැටළු සහ පහත සඳහන් පරිදි ඉරණමඩු ජලාශයේ ජලය ලබා ගැනීමේ සිට මුහුදු ජලයේ ලවණ හරණය කිරීම දක්වා වූ ව්‍යාපෘති විෂය පථය වෙනස් වීම නිසා ව්‍යාපෘතිය ප්‍රතිව්‍යූහගත කර තිබුණි. ජල සම්පාදන මණ්ඩලය විසින් යාපනය දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කරනු ලබන බොහොමයක් සුළු පරිමාණ ජල ව්‍යාපෘති ඉතා පැරණිය. තවද, ජල කාන්දුවීම්, සීමිත ධාරිතාව, ප්‍රමාණවත් නොවන ජල කුලුණු උස වර්තමාන සැපයුම් පද්ධතියට බලපායි. මේ හේතූන් යටතේ ඉහත කී | (i) උක්ත අක්‍රීය වත්කම් භාවිතා කිරීම සඳහා විකල්ප විමර්ශනය කර සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වීම.<br><br>(ii) ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර ශක්‍යතා අධ්‍යයනයක් සිදු කළ යුතු වීම. |

යෝජනා ක්‍රම බෙදාහැරීම් පද්ධතිය වැඩිදියුණු කිරීමට උපකාරීවනවා මෙන්ම අනාගත ජල සැපයුම් වැඩසටහන ක්‍රියාත්මක කිරීමටද පහසුකම් සලසාලයි. 2022 වසරේ මුහුදු ජලය පිරිසිදු කිරීමේ පවිත්‍රාගාරය ඉදිකරන තුරු දැනට පවතින ජල මූලාශ්‍ර වලින් පුතුර්, පුනරි, කඩ්ඩුඩෙයි වෙල්ලනි සහ මණ්ඩතිවු ජල කුළුණුවලට ජලය ලබා දීමට ප්‍රයෝජනයට ගැනීමට කටයුතු සිදු කර ඇත.

x. නැගෙනහිර දිස්ත්‍රික් ජල සම්පාදන සංවර්ධන ව්‍යාපෘතිය යටතේ වූ පානම ජල සම්පාදන යෝජනා ක්‍රමය මඟින් රු. මිලියන 253.83 ක් වැය කරමින් ජල කුළුණක්, පොම්පාගාරයක්, සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ මාර්ගයක් ස්ථාපිත කර තිබුණි. කෙසේ වෙතත් ජල මූලාශ්‍රවල හිඟකම නිසා මෙම සියලුම ඉදිකිරීම් අක්‍රීය තත්ත්වයට පත්ව තිබුණි.

සිදුරු හතරක් ආරම්භ කිරීමෙන් පසු සත්‍ය නිපයුම ප්‍රමාණවත් නොවූ අතර පොතුවිල් ක්‍රමයේ සේවා මට්ටම ඉහළ නැංවීම සඳහා පවතින ප්‍රමාණය භාවිතා කරන ලදී.

එම නිසා පානම ජල සම්පාදන යෝජනා ක්‍රමය සඳහා භූගත ජල ප්‍රභවයන් හඳුනා ගැනීමේ ක්‍රියාවලිය සඳහා මේ වන විට ක්‍රියාත්මක හා නඩත්තු අංශය විසින් කටයුතු කරමින් සිටියි.

ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට ප්‍රථම නිසි ශක්‍යතා අධ්‍යයනයක් සිදුකිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වීම.

## 3.8 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

**විගණන නිරීක්ෂණය**

i. කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්ය සාධනය, ඉඩම් නිරවුල් කිරීමේ ප්‍රමාදවීම, පාරිසරික හා නැවත පදිංචි කරවීමේ ගැටළු, කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ ප්‍රමාදය, කොන්ත්‍රාත්කරු විසින් සපයනු ලබන පී.ඊ. පයිප්පවල බාල ගුණාත්මක භාවය ආදිය හේතුවෙන් විදේශ මූලායන ව්‍යාපෘති 07 ක් සම්බන්ධයෙන් සැලකිය යුතු ප්‍රමාදයක් නිරීක්ෂණය විය. විස්තර පහත පරිදිවේ.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තු ගත පිරිවැය රු.මිලියන | ආරම්භක දිනය | සම්පූර්ණ කළ දිනය | දීර්ඝ කිරීමේ කාලය | ප්‍රමාද වූ දින ගණන |
|---|---|---|---|---|---|
| වියළි කලාපීය ජල සම්පාදන හා සනීපාරක්ෂක | 19,165 | 13/11/2009 | 31/12/2016 | 31/12/2016 - 31/12/2018 | 730 |

**කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම**

| යාපෘතිය | ඇස්තමේන්තු ගත පිරිවැය රු. මිලියන | ආරම්භ කළ දිනය | සම්පූර්ණ කළ දිනය | දින දීර්ඝ කිරීමේ කාලය | ප්‍රමාද වූ දින ගණන |
|---|---|---|---|---|---|
| මුල් ණය මුදල | 12,625 | 06-05-2011 | 14-11-2017 | 15-11-2017 සිට 31-12-2020 | 1,143 |
| අතිරේක මුළු වැය | 23,256 | 15-03-2018 | 30-06-2026 | | |
| මුළු පිරිවැය | 38,881 | | | | |

ඉරණමඩු ජලාශයේ ජලය බෙදා ගැනීමේ ගැටළුව හා මුහුදු ජල පවිත්‍රකරණය සඳහා වූ පහත සඳහන් ප්‍රධාන විෂය පථය වෙනස්

**නිර්දේශය**

ව්‍යාපෘති ප්‍රමාදවීම් වැළැක්වීමටත්, එමඟින් කොන්ත්‍රාත්කරුවන්ට දෙනු ලබන කාලය දීර්ඝ කිරීම හා එවැනි කාල දීර්ඝකිරීමක් ලබා දෙන විටක කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘතිය | | | | | | | |
| යාපනය කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය | 16,475 | 15/02/2011 | 14/08/2017 | 14/08/2017-31/12/2020 | 1234 | | |
| මහනුවර අපජල කළමනාකරණ ව්‍යාපෘතිය | 17,278 | 03/02/2010 | 30/09/2017 | 30/09/2017-31/12/2021 | 1552 | | |
| මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය | 13.410 | 18/12/2009 | 31/12/2014 | 31/12/2014 - 30/03/2017 | 819 | | |
| මහකොළඹ ජල පුනරුත්තාපන ව්‍යාපෘතිය | 4,785 | 27/11/2007 | 31/01/2012 | 31/01/2012 - 20/06/2017 | 1965 | | |
| බදුල්ල හාලිඇල ජල සම්පාදන ව්‍යාපෘතිය | 11,809 | 01/12/2013 | 31/08/2017 | 31/08/2017-15/08/2018 | 349 | | |
| නැගෙනහිර පළාත් ජල සම්පාදන හා සංවර්ධන ව්‍යාපෘතිය | 7,702 | 20/03/2010 | 20/12/2013 | 20/12/2013 - 31/01/2018 | 1502 | | |

කිරීම හේතුවෙන් ව්‍යාපෘතියේ අරමුණු ප්‍රතිව්‍යුහගත කර තිබුණි. ප්‍රධාන විෂය පථය වෙනස්වීම් හේතුවෙන් 2012, 2013 හා 2014 වර්ෂ වලදී ව්‍යාපෘතියට එහි ප්‍රධාන සිවිල් වැඩ කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට නොහැකි විය. විෂය පථය වෙනස් කිරීමෙන් අනතුරුව මෙම ව්‍යාපෘතිය සීමා කර තිබූ අතර අතිරේක මූල්‍යකරණයෙන් පසුව ක්‍රියාත්මක කිරීමේ සැලැස්මද සංශෝධනය කරන ලදී. ඉන් අනතුරුව මෙම ව්‍යාපෘතිය මඟින් 2013 වර්ෂයේ සිට 2018 දක්වා පහත සඳහන් සිවිල් වැඩ කොන්ත්‍රාත්තු ප්‍රදානය කරන ලදී.

1. බෙදාහැරීමේ ජාලයක් සැපයීම හා එළීම - පැකේජ 01
2. ජල කුළුණු ඉදිකිරීම පැකේජ 01 හා 02
3. පිරිපහදු කළ ජල සම්ප්‍රේෂණය - සැපයුම් කිරීම හා ඇතිරීම පැකේජ 01 සහ 02
4. බෙදාහැරීමේ ජාලයන් සැපයීම හා එළීම - පැකේජ 02

මෙම සිවිල් වැඩ කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීමෙන් පසුව, ව්‍යාපෘතිය 2018 වසරේදී සැලකිය යුතු භෞතික හා මූල්‍ය ප්‍රගතියක් පෙන්නුම් කර තිබුණි. තවද, සංශෝධිත ක්‍රියාත්මක සැලැස්මට අනුව, මෙම ව්‍යාපෘතිය මඟින් පහත සිවිල් වැඩ කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීමට නියමිතය.

1. ජල කුළුණු ඉදිකිරීම (ET03)
2. මූලික ණය යටතේ 2018 වර්ෂය තුළ යාන්ත්‍රික හා ඉංජිනේරු SCADA සහ මූලික ණය යටතේ JMC ප්‍රදේශය තුළ බෙදාහැරීම් ජාල.

<u>වියළි කලාපීය ජල සම්පාදන ව්‍යාපෘතිය</u>

- පළමු ණය (L 2477) අවසන් දිනය 2014 ජුනි 30 වේ.
- උපණය (L 2977) මූලික අවසන් දිනය 2016 දෙසැම්බර් 31 වේ.

එබැවින් මුල් ව්‍යාපෘති නිමකිරීමේ දිනය 2016 දෙසැම්බර් 31 ලෙස සලකනු ලැබේ.

- දින දීර්ඝ කිරීම 2016.12.31
- ප්‍රමාද වූ දින ගණන 730.

<u>බදුල්ල හාලි ඇල ජල සම්පාදන ව්‍යාපෘතිය</u>

අයිතම අංක "4.3-ප්‍රමාදවූ ව්‍යාපෘති" යටතේ බදුල්ල - හාලි ඇල, ඇල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ දින දීර්ඝ කාල සීමාව 2017.08.31 සිට 2017.11.30 දක්වා වේ. දින ගණන 91ක් ලෙස නිවැරදි විය යුතුය. වේල්ල ඉදිකිරීම සඳහා ඉඩම් අත්පත් කර

ප්‍රමාද ගාස්තු අය කරන බවට සහතික විය යුතු වීම.

ගැනීම ප්‍රමාද වීම හේතුවෙන් වැඩ ප්‍රමාද වූ බවත් කොන්ත්‍රාත්කරුට විචලන සම්බන්ධ ගෙවීමක් සිදු නොවූ බවත් සලකන්න.

## 3.9 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 ඡේදය ප්‍රකාරව ඉදිරි වසර තුනක කාලය සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදනයන් ඇතුළත් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් මණ්ඩලය පිළියෙල කර නොතිබුණි. | 2018 ජනවාරි 04 දින ජලසම්පාදන මණ්ඩලය විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර රේඛීය අමාත්‍යාංශයට ඉදිරිපත් කර ඇත. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන පිළිපැදිය යුතු වීම. |
| ii. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.12.2 ඡේදයට පටහැනිව අනියකන්ද, ඒකල හා වර්විල්හි වැඩබිම්වල එච්ඩීපීඊ පයිප්ප ගබඩා කිරීම සඳහා ගබඩාවක් ඉදිකිරීම සඳහා වන කොන්ත්‍රාත්තුව රු.868,123,308 කට ප්‍රදානය කර තිබූ අතර එය ඉංජිනේරු ඇස්තමේන්තුව සමඟ සැසඳීමේදී සියයට 37.82 ක ඉහළ අගයකි. එබැවින් මණ්ඩලය විසින් භාණ්ඩ ආනයනය කිරීමට පෙර ගබඩා ඉදිකිරීමට නියමිත ලෙස සැලසුම් නොකිරීම හේතුවෙන් රු.23,826,788 ක අතිරේක පිරිවැයක් දැරීමට සිදුව තිබුණි. | ඉංජිනේරු ඇස්තමේන්තුව මණ්ඩලයේ මිල අනුපාතයන් අනුව සකස් කරන මුත් ලංසුකරුවන්ගේ ලංසු මිල ගණන් වෙළඳපළ මිල ගණන් අනුව ඉදිරිපත් කරනු ලබයි. එබැවින් වෙනසක් දැකිය හැකිය. තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් මෙය පරීක්ෂා කර ඔවුන්ගේ නිර්දේශ ප්‍රසම්පාදන කමිටුවට ලබා දෙනු ලබයි. | රජයේ මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන පිළිපැදිය යුතු වීම. |
| iii. | 2018 වර්ෂය සඳහා සකස් කරන ලද විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්ම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | නගර සැලසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් ජල සම්පාදන මණ්ඩලයේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වේ. එබැවින් 2018 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම ඔහුගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. | ප්‍රසම්පාදන සැලැස්මට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා ගත යුතු වීම. |
| iv. | ප්‍රසම්පාදන සැලැස්ම කාලීනව සමාලෝචනය කර යාවත්කාලීන කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්ම ජල සම්පාදන අමාත්‍යාංශය, මණ්ඩලයේ ප්‍රතිපත්ති හා සැලසුම් අංශය, මණ්ඩලයේ ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථාන විසින් සමාලෝචනය කරනු ලබයි. | ප්‍රසම්පාදන සැලැස්ම කාලීනව සමාලෝචනය කළ යුතු වේ. |
| v. | ප්‍රතිග්‍රහණ ලිපියේ ප්‍රතිපාදනයන් අනුව ඇතැම් අවස්ථාවල සැපයුම්කරුවන්ගෙන් අය කළ යුතු ප්‍රමාද වන්දි මුදල් අයකර නොමැති බව විගණන නියැදි පරීක්ෂණ අනුව නිරීක්ෂණය විය. | සටහන් කර ගන්නා ලදී. | කොන්ත්‍රාත් ගිවිසුමේ විධිවිධාන පිළිපැදිය යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| vi. | එක් පුවත්පතක පළවූ දැන්වීමක් මත පදනම්ව අනුරාධපුර හා පොළොන්නරුව ප්‍රදේශවල වාහන කුලියට ගැනීම සඳහා රු.22,940,600 ක කොන්ත්‍රාත් වටිනාකමට කොන්ත්‍රාත්කරුවන් තෝරාගෙන තිබුණි. ලංසුකරුවන් එක් අයෙකු හෝ දෙදෙනෙකු පමණක් ප්‍රතිචාර දක්වා ඇති හෙයින් ප්‍රමාණවත් තරගයකින් තොරව, වඩා අනුකූලතාවයක් දක්වා ඇති ලංසුකරු තෝරාගෙන තිබුණි. | සටහන් කර ගන්නා ලදී. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල විධිවිධාන පිළිපැදිය යුතු වීම. |

**3.10 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

**-------------------------------------**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | --------------------- | -------------------------------- | ---------- |
| **3.10.1** | **මහකොළඹ ජල හා අපජල කළමනාකරණ ආයෝජන වැඩ සටහන - ව්‍යාපෘතිය 01**<br>**---------------------------------------**<br>පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ. | | |
| අ. | මෙම ව්‍යාපෘතිය 2013 ජුනි 28 වන දින ආරම්භ කොට 2018 ජුනි 30 දින නිමකිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත් කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය හේතුවෙන් 2019 ජුනි 30 දක්වා කාලය දීර්ඝ කිරීමට ආසියානු සංවර්ධන බැංකුව අනුමැතිය ලබා දී තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | i. කොන්ත්‍රාත් කාලය තුළ ව්‍යාපෘතිය නිම කිරීම සඳහා ව්‍යාපෘතියේ කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතු වීම.<br><br>ii. කොන්ත්‍රාත් ගිවිසුමේ විධිවිධාන පිළිපැදිය යුතු වීම. |
| ආ. | සමාලෝචිත වර්ෂයේ වැඩසටහන් ප්‍රගති වාර්තාවට අනුව සමස්ත භෞතික ප්‍රගතිය හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 55.05 හා සියයට 67 ක් වී තිබුණි. | | |
| ඇ. | 2019 ජුනි 30 දිනට පෙර ව්‍යාපෘතියේ සියලුම කටයුතු අවසන් කිරීමට යටත්ව ආසියානු සංවර්ධන බැංකුව විසින් ව්‍යාපෘතියේ ණය කාලය අවසන් වන දිනය 2019 ජුනි 30 දක්වා දීර්ඝ කර තිබුණි.<br>කෙසේ වෙතත් ආදායම් නොලබන ජලය සඳහා වූ උපදේශන කොන්ත්‍රාත්තුව, මහජන දැනුවත් කිරීම් සහ මාධ්‍ය ව්‍යාපාරය කොන්ත්‍රාත්තුන්හි අවසන් දිනය 2021 පෙබරවාරි 21 දින හා 2020 ඔක්තෝම්බර් 31 වශයෙන් ව්‍යාපෘතියේ සංශෝධිත ණය අවසන් කාලයෙන් ඔබ්බට නියම කර තිබුණි. | | |

ඈ. කොළඹ නගර උතුරු කොටසෙහි ආදායම් නොලබන ජලය අඩු කිරීම සඳහා පද්ධති පුනරුත්ථාපනය කිරීමේ නල එළීමේ කොන්ත්‍රාත්තුවේ මූලික සැලසුම අනුව ගෙන්වන ලද පස හා කැණීම් කළ පස පයිප්ප අගල් නැවත පිරවීම සඳහා භාවිතා කිරීමට නිර්දේශ කර තිබුණි. මෙම කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමෙන් පසුව ආනයනය කරන ලද හා කැණීම් කළ පස වෙනුවට ගල් කුඩු භාවිතා කිරීමට ව්‍යාපෘතිය තීරණය කර තිබුණි.

ඉ. කොළඹ නගරයේ උතුරු, නැගෙනහිර, බටහිර සහ දකුණු ප්‍රදේශවල ආදායම් නොලබන ජලය සඳහා පද්ධති පුනරුත්ථාපන කොන්ත්‍රාත්තුවේ නල එළීම, පීඩන පරීක්ෂාව, නිවාස සඳහා ජල සබඳතා ලබා දීමේදී අඩු භෞතික ප්‍රගතියක් පෙන්නුම් කර තිබුණි.

### 3.10.2 අඹතලේ බලශක්ති ඉතිරි කිරීමේ ව්‍යාපෘතිය

පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| (අ) | මෙම ව්‍යාපෘතියේ සමස්ත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාලය මාස 63 ක් වූ අතර, 2018 දෙසැම්බර් 31 දින වන විට ඉන් මාස 51 ක් ගතවී තිබුණි. කෙසේ වෙතත් කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්ය සාධනය හේතුවෙන් එදින වන විට සමස්ත භෞතික ප්‍රගතිය සියයට 10.84 ක් පමණක් විය. කොන්ත්‍රාත්කරු. තවද එය 2017 වර්ෂය අවසානය හා සසඳන විට සියයට 3.14 ක භෞතික ප්‍රගතියේ වැඩිවීමක් පමණක් පෙන්නුම් කරයි. | (අ) එක් එක් ව්‍යාපෘතිය ප්‍රමාද වීමට හේතු සහ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් ගනු ලබන ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග පහත දැක්වේ. ඒ හැරුණු විට, සියළුම ලංසුකරුවන්ට අත්දැකීම් නොමැති බැවින් ටෙන්ඩර් නැවත කැඳවීම හේතුවෙන් ICB 06 කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම ප්‍රමාද විය. කෙසේ වෙතත්, එය 2018.10.19 දින ප්‍රදානය කර තිබුණි. | (i) කොන්ත්‍රාත් කාලය තුළ ව්‍යාපෘතිය නිම කිරීම සඳහා ව්‍යාපෘතියේ කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතු වීම. (ii) කොන්ත්‍රාත් ගිවිසුමේ විධිවිධාන පිළිපැදිය යුතුය. (iii) වැඩසටහනකට අනුව ව්‍යාපෘති කටයුතු සම්පූර්ණ කිරීමට පියවර ගත යුතු වීම. |
| (ආ) | කිලෝමීටර් 9 ක් සඳහා පැරණි නල මාර්ගය, විෂ්කම්භය මිලිමීටර් 1200 ක ධාරිතාවයකින් යුතු නව පයිප්ප මගින් ප්‍රතිස්ථාපනය කිරීමේ ප්‍රධාන කොන්ත්‍රාත්තුව 2018 මැයි 04 දින අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්කරුගේ දුර්වල ක්‍රියාකාරිත්වය හේතුවෙන් නිම කිරීමේ කාලය 2019 පෙබරවාරි දක්වා දීර්ඝ කර තිබූ අතර 2018 දෙසැම්බර් 31 දිනට මීටර් 1316.2 ක දුරකට පමණක් නල එළා තිබුණි. | උපදේශන කොන්ත්‍රාත්තුව (DRCSC) යටතේ සැලසුම්ගත කාර්ය මණ්ඩලය සංචලනය කිරීම AWSSIESP හි ඉදිකිරීම් කොන්ත්‍රාත්තු වල ප්‍රගතිය සමඟ උපදේශකගේ විශේෂ ප්‍රාගුණ්‍ය අවශ්‍යතාවය කල් දැමීමට හේතු විය. (ආ) මුලදී, කොන්ත්‍රාත්කරුගේ දුර්වල ක්‍රියාකාරිත්වය හේතුවෙන් කොන්ත්‍රාත්කරු ද්‍රව්‍ය සැපයුම මාස 11 කින් ප්‍රමාද කර ඇත. | |

| | | |
|---|---|---|
| (ඇ) | ගොතටුව ජලාශයේ සිට කොළඹ දක්වා කිලෝමීටර් 5 ක් සඳහා නල එළීම හා 15000 m³ ධාරිතාවයකින් යුත් භූගත ජල ජලාශයක් ඉදිකිරීම සඳහා වූ තවත් කොන්ත්‍රාත්තුවක් 2018 ජනවාරි 04 දින ප්‍රදානය කර තිබුණි. කෙසේ වෙතත්, 2018 දෙසැම්බර් 31 වන විටත් ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි. | පසුව, මණ්ඩලය විසින් දින 291 කින් කාලය දීර්ඝ කිරීම සඳහා කොන්ත්‍රාත්කරුට අනුමැතිය ලබා දුන් අතර, ඒ අනුව කොන්ත්‍රාත්කරු විසින් කිලෝමීටර් 9.0 ක දුරින් කිලෝමීටර් 1.316 ක නල එළීම සම්පූර්ණ කරන ලදී. කෙසේ වෙතත්, ණය ගිවිසුම් කොන්දේසි සමඟ අනුගත නොවීම සහ 2018 මාර්තු සිට රජයේ දායකය සම්බන්ධයෙන් අනුගමනය කළ පිළිවෙත නිසා AFD විසින් අරමුදල් බෙදා හැරීම තාවකාලිකව නවතා දැමීය. එබැවින් කොන්ත්‍රාත්කරුගේ අතුරු ගෙවීම පියවා ගැනීමට මණ්ඩලයට නොහැකි විය. අවසාන වශයෙන්, මුදල් නොගෙවීම හේතුවෙන් කොන්ත්‍රාත්කරු විසින් 2018 සැප්තැම්බර් 01 දින කොන්ත්‍රාත්තුව අවසන් කර ඇත. කොන්ත්‍රාත්තුව නැවත ආරම්භ කිරීම සඳහා මණ්ඩලය කොන්ත්‍රාත්කරු සමඟ සාකච්ඡා කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීම සඳහා කොන්ත්‍රාත් ගිවිසුමේ සංශෝධනය 2019.01.04 දින අත්සන් කරන ලදී. ඒ අනුව, කොන්ත්‍රාත්තුව නැවත ආරම්භ කිරීම සඳහා කොන්ත්‍රාත්කරු සහ මණ්ඩලය විසින් සංශෝධන කොන්දේසි සපුරා ඇත.<br>(ඇ) ICB 03 කොන්ත්‍රාත්කරු සම්පූර්ණයෙන් බලමුලු ගැන්වූයේ නැත. කොන්ත්‍රාත්කරු විසින් වැඩබිම් තුළ අර්ථවත් කාර්යයක් සිදු කර නොමැත. ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් කොන්ත්‍රාත්කරුට "නිවැරදි කිරීමට දැන්වීම" නිකුත් කර ඇත. එහෙත්, කොන්ත්‍රාත්කරු සැලකිය යුතු ප්‍රගතියක් පෙන්නුම් කර නොමැති අතර ඔවුන් උසාවියේ නඩුවක් දමා ඇත. අනතුරුව නගර සැලසුම් හා ජල |
| ඈ. | බලශක්ති පිරිවැය අඩු කිරීමට සෘජුවම බලපාන විදුලි, යාන්ත්‍රික, උපකරණ සවිකිරීම සහ සිවිල් වැඩ සඳහා වූ ප්‍රධාන කොන්ත්‍රාත්තුව හා සිවිල් වැඩ කොන්ත්‍රාත්තුවේ ප්‍රදානය කිරීම සඳහා වසර හතරක් සහ මාස තුනක කාලයක් හෙවත් කොන්ත්‍රාත් කාලයෙන් සියයට 80 ක් වැය කර ඇති බව නිරීක්ෂණය විය. | |

සම්පාදන අමාත්‍යාංශයේ ලේකම් විසින් ICB 03 කොන්ත්‍රාත්තුව අන්‍යෝන්‍ය වශයෙන් අවසන් කිරීමට තීරණය කරන ලද්දේ ICB 03 කොන්ත්‍රාත්තුව දෙවන අඩුම ලංසුකරුට ප්‍රදානය කර ව්‍යාපෘතිය නිම කිරීමට ය. 2018 දෙසැම්බර් 05 සහ 28 යන දිනවල අමාත්‍යාංශයේ පැවති විශේෂ රැස්වීමේදී කොන්ත්‍රාත්තුව අන්‍යෝන්‍ය වශයෙන් අවසන් කිරීමට කොන්ත්‍රාත්කරු එකඟ විය. අන්‍යෝන්‍ය වශයෙන් ගිවිසුම අත්සන් කිරීමේ ක්‍රියාවලිය සිදු වෙමින් පවතී. කෙසේ වෙතත්, ඉහත හේතු නිසා ICB 03 කොන්ත්‍රාත්තුව මුළුමනින්ම ප්‍රමාද විය.

(ඇ) ICB 05 කොන්ත්‍රාත්තුවේ ලංසු තැබීමේ ක්‍රියාවලිය අදියර දෙකකි. සාමාන්‍යයෙන්, වෙනත් ලංසු තැබීමේ ක්‍රියා පටිපාටිවලට වඩා ඊට කාලය ගතවේ. කෙසේ වෙතත්, SCAPC ටෙන්ඩර් මණ්ඩල කමිටු සාමාජිකයන් වෙනස් කිරීම, ලංසුකරුවන් විසින් වැඩි පැහැදිලි කිරීම් ඉල්ලා සිටීම සහ තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයින් වෙනස් කිරීම හේතුවෙන් ICB 05 කොන්තාත්තුව ප්‍රසම්පාදනය ප්‍රමාද විය. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්තුව 2018 සැප්තැම්බර් 10 වන දින ප්‍රදානය කරන ලද අතර ව්‍යාපෘතිය 2018.12.13 දින ආරම්භ කරන ලදී. කෙසේ වෙතත්, ඉහත හේතු නිසා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම ප්‍රමාද විය.

**3.10.3 නැගෙනහිර පළාතේ ජල සම්පාදන සංවර්ධන ව්‍යාපෘතිය**

| | | |
|---|---|---|
| මහා ඔය සහ කොන්ඩවතුවන ජල සම්පාදන යෝජනා ක්‍රම සඳහා පිළිවෙලින් කිලෝමීටර් 80 සහ 28.5 සඳහා බෙදා හැරීමේ නල මාර්ග එළීමට අපේක්ෂා කරන ලදී. කෙසේ වෙතත් ඉහත යෝජනා ක්‍රම දෙක සඳහා වන සත්‍ය එළීම කිලෝමීටර 73 කට සීමා විය. | මුල් සැලසුම්වලට අනුව මහා ඔය බෙදාහැරීමේ ප්‍රධාන මාර්ගයේ දිග කිලෝමීටර 80 කි. කෙසේ වෙතත්, මහා ඔය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රම අටක් (08) ක්‍රියාත්මක කිරීම හේතුවෙන් එම ප්‍රදේශවල නල එළීම නොකරන ලෙසට මහඔය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රාදේශීය සභාව මණ්ඩලයට ලිඛිතව දැනුම් දෙන ලදී. කිලෝමීටර 48.29 ක පමණක් එළීම සිදු කරන ලදී. කොන්ඩවතුවන ජල සම්පාදන ව්‍යාපෘතියේ සද්දතිස්ස කුළුණේ සිට කල්මුනයි ජලාශය දක්වා කිලෝමීටර් 28.5 දුර සඳහා සම්ප්‍රේෂණ ප්‍රධාන මාර්ගය සම්බන්ධයෙන් මාර්ග සංවර්ධන අධිකාරියේ සීමාවන් නිසා නල මාර්ගය නැවත සංශෝධනය කිරීමෙන් ඉහත සම්ප්‍රේෂණ දිග අඩු කිරීමට සිදු විය. එම අඩු කිරීම කිලෝමීටර 3.5 ක් පමණ විය. ඉහත අඩුකිරීමට අනුව, එළීමේ දූර දිග කිලෝමීටර 73 කට සීමා වූ බව සත්‍යයකි. | වැඩ කටයුතු ඇස්තමේන්තු කිරීමට පෙර අදාළ ආයතන (ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සහ මාර්ග සංවර්ධන අධිකාරිය වැනි) සමඟ නිසි සම්බන්ධීකරණයක් පවත්වා ගත යුතු වීම. |

**3.10.4 මහ කොළඹ ජල හා අපජල කළමනාකරණ ව්‍යාපෘතිය**

පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| (අ) | මහ කොළඹ ප්‍රදේශයේ නාගරික හා තදාසන්න ප්‍රදේශවල වැසියන් සඳහා නිසි අපජල කළමනාකරණයක් සැපයීම තුළින් නාගරික පරිසරය සහ මහජන සෞඛ්‍ය සේවා වැඩිදියුණු කිරීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය 2009 දෙසැම්බර් 18 වන දින ආරම්භ කරන ලදී. | අදහස් දක්වා නොතිබුණි. | (i) කොන්ත්‍රාත් කාලය තුළ ව්‍යාපෘතිය නිම කිරීම සඳහා ව්‍යාපෘතියේ කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතු වීම.<br><br>(ii) ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් පරිසරයට කිසිදු බලපෑමක් සිදු බවට |

| | | |
|---|---|---|
| (ආ) මෙම ව්‍යාපෘතිය 2014 දෙසැම්බර් 31 වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය හේතුවෙන් එය 2017 මාර්තු 30 දක්වා දීර්ඝ කරන ලදී. | | සහතික විය යුතු වීම. |
| (ඇ) නාගරික පරිසරය වැඩිදියුණු කිරීම සහ මහජන සෞඛ්‍යය හා පවත්නා බැහැර කිරීම් ක්‍රමය මගින් මලාපවහන හා අපජල ජලය ක්‍රමානුකූලව බැහැර කිරීම පිළිබඳ පුළුල් දෘෂ්ටිකෝණයකින් මෙම ව්‍යාපෘතිය සකස් කර තිබුණි. කෙසේ වෙතත්, 2018 ජූලි 24 දින සිදු කරන ලද ක්ෂේත්‍ර විගණන පරීක්ෂණයේදී, එම ක්‍රියාවලියෙන් පිටවන රොන් මඩ පිරිපහදු කිරීමකින් තොරව කොලොන්නාවේ පොම්පාගාර පරිශ්‍රයේ වළලනු ලබන බව නිරීක්ෂණය විය. මීට පෙරද මෙවැනිම කාරණයක් සිදුවී තිබුණද පාරිසරික දූෂණය පිළිබඳ ඇතිවිය හැකි අවදානම අවම කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | | |
| (ඇ) අපිරිසිදු ජලය පිටාර ගැලීම සඳහා විකල්ප විසඳුමක් ලෙස දෙහිවල අපජල පොම්පාගාරයේ භාවිතා කිරීම සඳහා උපස්ථ ජනක යන්ත්‍ර දෙකක් (02) මිලදී ගැනීමට ණය දෙන ආයතනය විසින් කරන ලද යෝජනාව ව්‍යාපෘති නිලධාරීන්ගේ සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ විවිධ මත හේතුවෙන් ක්‍රියාත්මක කර නොමැති බව නිරීක්ෂණය විය. | | |

### 3.10.5 මහනුවර අපජල කළමනාකරණ ව්‍යාපෘතිය

---------------------------------------------

| | | |
|---|---|---|
| ජීවන පරිසරය සහ මහවැලි ගඟේ ජලයේ ගුණාත්මකබව වැඩි දියුණු කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ විය. ජනාකීර්ණ ප්‍රදේශවල යළි පුනරුත්තාපනය හා සනීපාරක්ෂක පහසුකම් ඇතුළත්ව මහනුවර පිරිපහදු හා අපජලය එකතු කිරීම, පිරිපහදු කිරීම හා බැහැර කිරීම සඳහා නිසි ක්‍රමවේදයක් සකස් කිරීම හා එමගින් එම ප්‍රදේශවල මිනිසුන්ගේ ජීවන තත්ත්වය, සෞඛ්‍ය හා සුබ සාධනය ඉහළ නැංවීම මෙම ව්‍යාපෘතියේ අරමුණ විය. | (අ) ව්‍යාපෘති කාලය 2022 ජූලි 4 දක්වා දීර්ඝ කිරීම සඳහා අමාත්‍යාංශය විසින් මෙම කාරණය ජයිකා ආයතනය වෙත යොමු කර ඇත. මහනුවර නගරය පුරාවිද්‍යා භූමියක් වන අතර එය ඉතා ජනාකීර්ණ ප්‍රදේශයක් වන බැවින් එය ව්‍යාපෘතියේ ප්‍රගතියට බලපාඇත. | (i) කොන්ත්‍රාත් කාලය තුළ ව්‍යාපෘතිය නිම කිරීම සඳහා ව්‍යාපෘතියේ කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතු වීම.<br><br>(ii) කොන්ත්‍රාත් ගිවිසුමේ විධිවිධාන පිළිපැදිය යුතු වීම. |
| (අ) මෙම ව්‍යාපෘතිය 2010 පෙබරවාරි 3 දින ආරම්භ කරන ලද අතර එය 2017 සැප්තැම්බර් 30 වන විට අවසන් කිරීමට | (ආ) පිරියතෙහි ප්‍රධාන ඉදිකිරීම් කටයුතු මේ වන විටත් අවසන් කර ඇති අතර ඉතිරි කටයුතු 2019 වසර අවසන් වන විට | (i) වැඩසටහනකට අනුව ව්‍යාපෘති කටයුතු සම්පූර්ණ කිරීමට පියවර ගත යුතු වීම. |

සැලසුම් කර තිබුණි. නියමිත කාල සීමාව තුළ ව්‍යාපෘති කටයුතු අවසන් කර නොතිබුණද කාල දිගුවක් ලබාගෙන නොතිබුණි. කෙසේ වෙතත්, 2018 දෙසැම්බර් 31 වන විට සත්‍ය භෞතික ප්‍රගතිය සියයට 60.43ක් විය.

(ආ) අපජල පවිත්‍රාගාරය, ප්‍රධාන පොම්පාගාරය, පිරිපහදු කළ අපද්‍රව්‍ය බැහැර කිරීමේ පද්ධතිය, රොන්මඩ වියළන යහන් සහ මෙහෙයුම් නඩත්තු උපකරණ සැපයීම සඳහා වන සැලසුම් හා ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව ආරම්භ කිරීමට නියමිත දිනයේ සිට වසර 3 ½ ක් ගත වීමෙන් පසුව 2015 ජනවාරි ආරම්භ කළ අතර 2018 දෙසැම්බර් 31 දිනට සියයට 60 ක මන්දගාමී ප්‍රගතියක් පෙන්නුම් කර තිබුණි.

(ඇ) 2011 ජුලි මාසයේ ආරම්භ කිරීමට නියමිතව තිබූ ප්‍රධාන මලාපවහන නල, ශාඛා මලාපවහන නල හා මනුවල පොම්පාගාරයෙහි සැලසුම් කිරීමේ හා ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව 2013 ඔක්තෝබර් මාසයේදී ප්‍රදානය කර තිබුණි. තවද, එම දිනය වන විට නිම කිරීමට ඇස්තමේන්තුගත නල මීටර් 9,105 ක් එළීම අතරින් 2018 ජුනි 30 වන විට ප්‍රධාන අපවහන නල එළීම් මීටර 2396 ක් පමණක් සම්පූර්ණ කර තිබුණි. මීට අමතරව, 2018 ජුනි 30 වන විට අවසන් කිරීමට නියමිත මනුවල පොම්පාගාර නවයෙන් (09). මනුවල පොම්පාගාර දෙකක (02) වැඩ පමණක් නිම කර තිබුණි.

(ඈ) ව්‍යාපෘති ලියකියවිලි වලට අනුව, 2017 වන විට අවසන් කිරීමට අපේක්ෂා කරන දේපල සම්බන්ධතා සැලසුම් කිරිම හා ඉදිකිරීමේ පැකේජය යටතේ වූ කටයුතු 2016 ජූලි මාසයේදී ආරම්භ කර තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමට නියමිත දිනය වූ 2017 සැප්තැම්බර් 30 දින සලකා බැලීමකින් තොරව, අදාළ කොන්ත්‍රාත්තුවේ වැඩකටයුතු 2021 නිමකිරීමට එකඟ වී තිබුණි.

අවසන් කෙරේ.

(ඇ) නාගරික සංවර්ධන අධිකාරිය, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, මාර්ග සංවර්ධන අධිකාරිය, මධ්‍යම පරිසර අධිකාරිය, මහනුවර මහ නගර සභාව වැනි විවිධ පාර්ශවකරුවන්ගෙන් ද අනුමැතිය ලබා ගත යුතුය.

**3.10.6 පොල්ගහවෙල, පොතුහැර සහ අලව්ව ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය**

---

මෙම ව්‍යාපෘතියේ පරමාර්ථය වනුයේ සැලසුම් කරන ලද 2037 වර්ෂයේදී පුද්ගලයින් 162,725 කට ප්‍රතිලාභ ලබා දෙමින් පොල්ගහවෙල, අලව්ව, කුරුණෑගල (කොටසක්), වීරම්බුගෙදර (කොටසක්) සහ මල්ලවපිටිය (කොටසක්) යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හතරක ජල සැපයුම් පහසුකම් ඉදිකිරීම හා පුළුල් කිරීම මගින් ආරක්ෂිත පානීය ජලය සැපයීමයි. ව්‍යාපෘතිය 2017 මාර්තු 02 දින ආරම්භ කර ඇති අතර 2020 මාර්තු 01 වන විට අවසන් කිරීමට නියමිතය.

පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

| | | |
|---|---|---|
| (අ) මණ්ඩලය විසින් සකස් කරන ලද ප්‍රගති වාර්තාවට අනුව, සමාලෝචිත වර්ෂය අවසානයේදී ව්‍යාපෘතියේ ඉලක්කගත භෞතික ප්‍රගතිය සියයට 69.3 කි. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ සමස්ත සත්‍ය භෞතික ප්‍රගතිය සියයට 39.4 ක් පමණක් වූ අතර ව්‍යාපෘතියේ ප්‍රගතිය වැඩ වැඩසටහනට වඩා පහළින් පවතී. | (අ) කොන්ත්‍රාත්කරු විසින් 2018 දෙසැම්බර් මස අවසානයේදී වැඩසටහන ඉදිරිපත් කර ඇත. | (i) කොන්ත්‍රාත් කාලය තුළ ව්‍යාපෘතිය නිම කිරීම සඳහා ව්‍යාපෘතියේ කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතු වීම. |
| (ආ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 4.2.3 වගන්තියට අනුව, තරඟකාරී ලංසු තැබීමේ ක්‍රියාපටිපාටියේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සති 60 ක් තුළ (දින 420) සම්පූර්ණ කළ යුතුය. 1998 ප්‍රසම්පාදනය මාර්ගෝපදේශයේ II කොටසෙහි ව්‍යතිරේක 23 හි කැඳවුමක් නොලත් යෝජනා හදිසි පදනම යටතේ සිදු කළ යුතු වුවද, ප්‍රසම්පාදන ආයතනය නොවැම්බර් 27 වන දින කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කිරීම සඳහා 2015 ජුනි 29 දින ලංසු ඉදිරිපත් කිරීමේ අවසන් දිනයේ සිට අවුරුදු තුනක් (3) සහ මාස පහක් (5) ක් වැය කර තිබුණි. | (ආ) මෙය අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව යටතේ විය. දීර්ඝකිරීම් ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ඇතිව සිදු විය. සාකච්ඡා අවසන් කර අරමුදල් අවශ්‍යතා සපුරාලීමෙන් පසුව ගිවිසුම අත්සන් කරන ලදී. | (ii) කොන්ත්‍රාත් ගිවිසුමේ විධිවිධාන පිළිපැදිය යුතු වීම.<br><br>(iii) වැඩසටහනකට අනුව ව්‍යාපෘති කටයුතු සම්පූර්ණ කිරීමට පියවර ගත යුතු වීම.<br><br>(iv) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ විධිවිධාන පිළිපැදිය යුතු වීම. |
| (ඇ) එළීම් කටයුතු සඳහා වැඩබිම භාර දීමට ප්‍රථමයෙන් මාර්ග සංවර්ධන අධිකාරියේ මාර්ගයන්හි කැණීම් කටයුතු සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ අනුමැතිය ලබා ගත යුතුය. කෙසේ වෙතත්, 2018 ඔක්තෝබර් 23 දින වන විටත් ව්‍යාපෘතියේ නල මාර්ග අටක (8) එළීම් සඳහා අනුමැතිය ලැබී නොමැති බව නිරීක්ෂණය විය. | (ඇ) ඒ වන විට මාර්ග සංවර්ධන අධිකාරියේ මාර්ග කැණීම සඳහා වූ සියලුම ඇස්තමේන්තු ලැබී ඇති අතර, ඔවුන්ගේ වැඩ සටහනට අනුව මාර්ග සංවර්ධන අධිකාරියේ මාර්ග දෙකක ඇස්තමේන්තු සඳහා ගෙවීමට කොන්ත්‍රාත්කරු කටයුතු කළේය. එසේම, ඔවුන්ගේ ඉදිකිරීම් වැඩසටහනට අනුව ඉතිරි ඇස්තමේන්තු 08 සඳහා ගෙවීම් කරනු ලැබේ. එබැවින් මෙම කාරණය ව්‍යාපෘතියේ ප්‍රගතියට බලපා නැත. | (v) එළීම් කටයුතු සඳහා වැඩබිම භාර දීමට ප්‍රථම මාර්ග සංවර්ධන අධිකාරියේ මාර්ගයන්හි කැණීම් කටයුතු සිදු කිරීමට මාර්ග සංවර්ධන අධිකාරියේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු වීම. |

**3.10.7 අනුරාධපුර උතුරු ජල සම්පාදන ව්‍යාපෘතියේ පළමු අදියර**

----------------------------------------

මෙම ව්‍යාපෘතියේ පරමාර්ථය වන්නේ අනුරාධපුර උතුරු ප්‍රදේශයේ මැදවච්චිය සහ රබෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ජල සැපයුම් පද්ධතියක් ඉදිකිරීම මගින් ආරක්ෂිත පානීය ජලය සැපයීම සහ ජල සැපයුම් ආවරණය ඉහළ නැංවීම හා එමගින් ප්‍රදේශයේ සෞඛ්‍යාරක්ෂිත තත්ත්වය සහ සෞඛ්‍ය තත්ත්වය වැඩිදියුණු කිරීමට දායක වීමයි.

පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතිය 2013 පෙබරවාරි මාසයේදී සිය කටයුතු ආරම්භ කළ අතර එය 2018 පෙබරවාරි වන විට අවසන් කිරීමට නියමිතය.

(ආ) පසුව, කොන්ත්‍රාත්තුවේ විස්තරාත්මක සැලසුම් සහ ප්‍රදානය කිරීමේ ක්‍රියාවලිය ප්‍රමාද වීම හේතුවෙන් ව්‍යාපෘතියේ කාල සීමාව 2020 අප්‍රේල් 30 දක්වා දීර්ඝ කර ඇත.

(ඇ) මණ්ඩලයේ ප්‍රගති වාර්තාවට අනුව, සමාලෝචිත වර්ෂය අවසානයේ අපේක්ෂිත ප්‍රගතිය වූ පිළිවෙලින් සියයට 22.67 ක් සහ සියයට 25 කට සාපේක්ෂව ව්‍යාපෘතියේ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 27.67 සහ සියයට 33.5 ක මන්දගාමී ප්‍රගතියක් පෙන්නුම් කර තිබුණි.

(ඈ) ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ වී වසර 4 ක් හා මාස 10 ක් ගතවීමෙන් පසු, තුළුමුව පහසුකම්, ජල පවිත්‍රාගාරය, භූගත සම්මිශ්‍රණ, උස් කුළුණු, කාර්යාල ගොඩනැගිල්ල, යාන්ත්‍රික හා විදුලි වැඩ සඳහා වූ ප්‍රධාන කොන්ත්‍රාත්තුව (ලොට්-ඒ) 2018 මාර්තු 23 දින පිරිනමා තිබුණි.

(ඉ) එච්ඩීපීඊ පයිප්ප සැපයීම හා එළීම, ඩීඅයි සම්ප්‍රේෂණ මාර්ග සහ බෙදාහැරීම් මාර්ග (ලොට්-බී) සඳහා වූ කොන්ත්‍රාත්තුව ව්‍යාපෘති කටයුතු ආරම්භ වී වසර 04 මාස 09 කට පසුව 2017 නොවැම්බර් මාසයේදී ප්‍රදානය කොට තිබුණි. කෙසේ වෙතත් ව්‍යාපෘතිය 2019 දෙසැම්බර් මාසයේ අවසන් කිරීමට නියමිතව තිබුණද 2018 සැප්තැම්බර් 30 වන විට නල

අ) ව්‍යාපෘතිය ආරම්භ කිරීම 2013 පෙබරවාරි මාසයේ සිදුවී 2018 පෙබරවාරි වන විට අවසන් කිරීමට සැලසුම් කර ඇත. එහෙත් ප්‍රදානය කිරීම පහත පරිදි සිදුවිය.

1. විස්තරාත්මක හා ටෙන්ඩර් ලියකියවිලි සැලසුම් පිළියෙල කිරීම ටෙන්ඩර් - අපේක්ෂිත කාල සීමාව මාස 10 ක් වන නමුත් සත්‍ය වශයෙන් මාස 12.5 ක කාලයේ ගත කොට ඇත.

2. තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව සකස් කිරීම - නියමිත කාල සීමාව මාස 3 ක් වන නමුත් සත්‍ය වශයෙන් ගත් කාලය මාස 8.5 කි.

ලේඛනයන්හි වූ සංකීර්ණතා හේතුවෙන් පැහැදිලි කිරීම් උපදේශකයන්ගෙන් කැඳවනු ලැබූ අතර එම පැහැදිලි කිරීම් ලංසුකරුවන්ගෙන්ද කැඳවනු ලැබීය. එම කොන්ත්‍රාත්තුව වසර 1.5 කින් ප්‍රදානය කිරීමට නියමිතව තිබුණද එය ප්‍රදානය කිරීම වසර 02 ක් හා මාස 2ක් ප්‍රමාද විය. ඒ හේතුවෙන් ලොට්-ඒ හි ප්‍රදානය 2018 මාර්තු 23 දක්වා ප්‍රමාද විය.

(i) කොන්ත්‍රාත් කාලය තුළ ව්‍යාපෘතිය නිම කිරීම සඳහා ව්‍යාපෘතියේ කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතු වීම.

(ii) කොන්ත්‍රාත් ගිවිසුමේ විධිවිධානවලට අනුකූල වන බවට සහතික වීම.

(iii) වැඩ වැඩසටහනට අනුව ව්‍යාපෘති කටයුතු සම්පූර්ණ කිරීමට පියවර ගත යුතු වීම.

එළීම අවසන් කර තිබුණේ මීටර 252,353 ක් වූ නල එළීමේ කොන්ත්‍රාත්තවෙන් මීටර් 4627.18 ක් සඳහා පමණක් වූ අතර එය සියයට 1.83 ට සමාන ප්‍රතිශතයක් විය.

(ඈ) මාර්ග සංවර්ධන අධිකාරියේ අනුමත කිරීම්, අයහපත් කාලගුණය, ශ්‍රම හිඟය ආදිය හේතුවෙන් ප්‍රගතියෙහි ප්‍රමාදයන් සිදුවිය.

(ඊ) යූපීවීසී පයිප්ප, උපාංග සැපයීම හා එළීම සහ ඩීඅයි සහ ජීඅයි පයිප්ප (ලොට්-සී) එළීමේ කොන්ත්‍රාත්තුව ව්‍යාපෘතියෙහි කටයුතු ආරම්භ වී වසර තුනකුත් මාස 09 කින් පසුව 2016 ඔක්තෝබර් මාසයේදී ප්‍රධානය කර ඇත. කෙසේ වෙතත්, 2018 සැප්තැම්බර් 30 වන විට කොන්ත්‍රාත්තුවේ එළීමේ මීටර 112,311 න් සියයට 89.99 ක ප්‍රතිශතයකට සමාන මීටර් 101,073.46 ක් පමණක් නල එළීම් සම්පූර්ණ කර තිබුණි.

(ඇ) තුන්වන පාර්ශවයක් විසින් ගොනු කරන ලද පෙත්සමක් හේතුවෙන්, කැබලි බී ප්‍රදානය කරනු ලැබුවේ 2017 නොවැම්බර් මාසයේදී පමණය එබැවින් ඉදිරි වැඩ සඳහා පරීක්ෂණ අවසන් කළ යුතුය. අවසාන වශයෙන් ජයිකා ආයතනය විසින් 2017 මාර්තු මාසයේ දී අඩුම ලංසුකරු සුදුසුකම් ලබා ඇති බව දැනුම් දුන්නේය. දෙවන අඩුම ලංසුකරු 2017 ජූලි මාසයේදී සුදුසුකම් ලැබූ ලෙස සලකනු ලැබූ අතර එබැවින් ප්‍රදානය කිරීම 2017 නොවැම්බර් මාසයේදී සිදු කරන ලදී.

(ඉ) උපදේශන කොන්ත්‍රාත්තුව 2014 ජූලි මාසයේදී සම්පූර්ණ කරන ලද අතර විස්තරාත්මක සැලසුම් සඳහා වන තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව සකස් කිරීම 2016 මාර්තු මාසයේදී අමාත්‍යාංශයට ඉදිරිපත් කරන ලදී. පසුව ටෙන්ඩර් කැඳවීමේ හා ප්‍රදානය කිරීමේ ක්‍රියා පටිපාටිය 2016 ඔක්තෝබර් දක්වා ක්‍රියාත්මක කරන ලදී.

**3.10.8 මාතර අදියර IV - ජල සම්පාදන ව්‍යාපෘතිය**

-----------------------------------------------

2030 දී අපේක්ෂා කරන ජනගහනය වූ 321,954 ක් සඳහා පානීය ජලය සැපයීම සඳහා ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණි. පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

(අ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 4.2.3 වගන්තියට අනුව, තරඟකාරී ලංසු තැබීමේ ක්‍රියාපටිපාටියේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සති 60 ක් තුළ (දින 420) සම්පූර්ණ කළ යුතුය. 1998 ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ II වන කොටසෙහි 23 වන ව්‍යාතිරේකය අනුව

(අ) අදහස් දක්වා නොතිබුණි.

(ආ) අංක 04 උපග්‍රන්ථය යටතේ ප්‍රධාන සම්ප්‍රේෂණ මාර්ග සඳහා DI / PE සඳහා එකඟ විය. ගිවිසුමට අනුව, ඕනෑම නිවැරදි

(i) කොන්ත්‍රාත් කාලය තුළ ව්‍යාපෘතිය නිම කිරීම සඳහා ව්‍යාපෘතියේ කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතු වීම.

කැඳවුමක් නොලත් ව්‍යාපෘති හදිසි පදනම මත සිදු කළ යුතුය. කෙසේ වෙතත්, අකාර්යක්ෂම ප්‍රසම්පාදන ක්‍රියාවලිය හේතුවෙන්, ලංසුකරුවන්ගෙන් කැමැත්ත ප්‍රකාශ කිරීම, කැඳවීමේ සිට තෝරාගත් ලංසුකරුට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සඳහා 2011 ජුනි සිට 2016 ජූලි දක්වා වසර 5 කට වැඩි කාලයක් ගත වී ඇති බව නිරීක්ෂණය විය.

(ආ) ලංසු කැඳවීමේදී DI පයිප්ප එළීම් කටයුතු සඳහා භාවිතා කිරීමට එකඟ විය. කෙසේ වෙතත්, අවසාන සැලසුම් සඳහා අනුමැතිය ලබා ගැනීමට පෙර කොන්ත්‍රාත්කරු DI පයිප්ප වෙනුවට PE පයිප්ප මිලදී ගෙන ඇති බව නිරීක්ෂණය විය. තවද, ඉංජිනේරු ඇස්තමේන්තුව තුළ ඩීඅයි නල ප්‍රසම්පාදනය සඳහා රු.17,014,944 ක් වෙන්කර ඇති බව නිරීක්ෂණය විය.

(ඇ) FIDIC මාර්ගෝපදේශ වල 8.1 කොන්දේසිය අනුව තෝරාගත් ලංසුකරුවන්ට කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමෙන් දින 42 ක් ඇතුළත වැඩ ආරම්භ කළ යුතු අතර, එම මාර්ගෝපදේශවල 2.1 වගන්තිය අනුව සේවායෝජකයා විසින් වැඩබිමට ඇතුළුවීමට අදාළ ආයතනයන්ගෙන් අවසර ලබා ගැනීම සඳහා පියවර ගත යුතු වේ. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමෙන් වසර 2 ක් ගතවී ඇතත්, මාලිම්බඩ හි ජල පවිත්‍රාගාරය ඉදිකිරීමට යෝජිත ඉඩමට ප්‍රවේශ වීමේ අයිතිය ලබා ගැනීමට අපොහොසත් වී තිබුණි.

(ඈ) 2018 දෙසැම්බර් 31 වන විට ව්‍යාපෘතියේ සත්‍ය ප්‍රගතිය සියයට 9 ක් වූ අතර එය අපේක්ෂිත ප්‍රගතිය වූ සියයට 12 ට සාපේක්ෂව ඉතා අඩු අගයක් විය. එබැවින් අපේක්ෂිත පරිදි 2020 ඔක්තෝබර් 10 අවසන් වන විට ව්‍යාපෘතිය නිම කිරීමට හැකි වේද යන්න සැක සහිතය.

(ඉ) ව්‍යාපෘතිය ආරම්භයට පෙර මාලිම්බඩ පිහිටි අවශ්‍ය ඉඩම් අත්පත් කර ගැනීමට අපොහොසත් වීම හේතුවෙන් මාස 6 ක ප්‍රමාදයකින් පසු 2018 අප්‍රේල් වන විටත් ලවණතා බාධකය ඉදිකිරීමේ කටයුතු ආරම්භ කර නොතිබුණි. එබැවින් කොන්ත්‍රාත්කරු විසින් ප්‍රමාද ගාස්තු ඉල්ලා සිටිමට ඇති හැකියාව විගණනයේදී බැහැර කළ නොහැකිය.

කිරීමක් අවසාන ඇඳීමේදී (drawing) සිදු කළ යුතු අතර කොන්ත්‍රාත්කරු තම වියදමින් ඒවා නිවැරදි කිරීමට එකඟ විය.

(ඇ) අත්පත් කර ගැනීමට එරෙහිව ඉඩම් හිමියන් විසින් ගොනු කරන ලද නඩුවක් ඊට හේතු විය.

(ඈ) එකිනෙකට සට්ටනය වන වැඩසටහනක් මගින් අවශ්‍ය ඉලක්කය සපුරා ගනු ඇත. මෙම ප්‍රමාදය ඉඩම් අත්පත් කර ගැනීම නිසා වූ අතර දැන් විසඳා ඇත.

(ඉ) ලවණතා බාධකය දැනට ක්‍රියාත්මක වෙමින් පවතී

(ඊ) මෙම ප්‍රමාදය ඉඩම් අත්පත් කර ගැනීම නිසා සිදු වූ අතර දැන් විසඳා ඇත.

(උ) කුළුණු, ජලාශ, පොම්පාගාර පිහිටීම ස්ථානීය සමීක්ෂණය මත පදනම් වේ. එවැනි ස්ථාන වැඩබිම් තත්ත්වයන්ට යටත් වේ. එබැවින් හඳුනාගත් ඉඩම් ඒ අනුව තීරණය වේ. ඉඩම් අත්පත් කර ගැනීම පසුව ආරම්භ වන අතර එවැනි ප්‍රමාදයන් සාමාන්‍ය දෙයකි.

(ii) කොන්ත්‍රාත් ගිවිසුමේ විධිවිධාන පිළිපැදිය යුතු වීම.

(iii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ සහ FIDIC මාර්ගෝපදේශවල විධිවිධාන පිළිපැදිය යුතු වීම.

(ii) වැඩසටහනකට අනුව ව්‍යාපෘති කටයුතු සම්පූර්ණ කිරීමට පියවර ගත යුතු වීම.

(ඊ) මණ්ඩලය විසින් ඉඩම් අත්පත් කර ගැනීම ප්‍රමාද වීම සහ කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්ය සාධනය හේතුවෙන් භූගත ජලාශ 6 ක් සහ ජල කුළුණු 4 ක් ඉදිකිරීමේ සැලකිය යුතු ප්‍රමාදයක් නිරීක්ෂණය විය. තවද, 2017 ඔක්තෝබර් මස වැඩ ආරම්භ කිරීමට නියමිතව තිබියදීත් ඉඩම් අත්පත් කර ගැනීම ප්‍රමාද වීම හේතුවෙන් මාලිම්බඩ, ගල්කැටිය සහ මිරිස්වත්ත යන ස්ථානවල භූගත ජලාශ තුනක් ඉදිකිරීම සහ කරගොඩ උයංගොඩ ප්‍රදේශයේ ජල කුළුණු ඉදිකිරීම 2019 මාර්තු 30 දක්වා ආරම්භ කර නොතිබුණි.

(උ) ප්‍රසම්පාදන කමිටුවක් පත් කිරීම සඳහා ඉල්ලීමට පෙර රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල 2.3.1 වගන්තියට අනුව, ස්ථිතිය විසින් ඉඩම් අත්පත් කර ගැනීම සහ වන්දි ගෙවීම්, උපයෝගිතා නැවත ස්ථානගත කිරීම ඇතුළු නැවත පදිංචි කරවීමේ ගැටළු සහ ව්‍යාපෘතිය කිසිඳු බාධාවකින් තොරව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය අනෙකුත් කරුණු විසඳා ඇති බව තහවුරු කළ යුතුය. කෙසේ වෙතත්, මාතර අදියර IV ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වන සියලුම ඉඩම් අත්පත් කර ගෙන තිබුණේ ව්‍යාපෘතිය ආරම්භ කිරීමෙන් පසුව බව නිරීක්ෂණය විය. එබැවින්, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී සැලකිය යුතු ප්‍රමාදය සිදුවීම සහ කොන්ත්‍රාත්කරු විසින් ප්‍රමාද ගාස්තු ඉල්ලා සිටීමට ඇති හැකියාව නොවැළැක්විය හැකිය.

**3.10.9 කොළඹ දිස්ත්‍රික් නගර නැගෙනහිර ජල සම්පාදන ව්‍යාපෘතිය - අදියර 01**

**---------------------------------------------**

පාදුක්ක, සීතාවක, හොරණ සහ හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන් ආවරණය වන පරිදි කිලෝමීටර් 176 ක් සඳහා බෙදාහැරීමේ ප්‍රධාන නල එළීම මඟින් හා කිලෝමීටර් 4ක් සඳහා සම්ප්‍රේෂණ නල එළීම මඟින් ජලය සැපයීම සඳහා ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| (අ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 වගන්තියට අනුව තරගකාරී ලංසු තැබීම සඳහා අවම ලංසු තැබීමේ කාලය දින 21 ක් වේ. කෙසේ වෙතත්, 2013 දෙසැම්බර් 11 දින පළ කළ පුවත්පත් දැන්වීමට අනුව රු.මිලියන 38,805 ක් වටිනාකමකින් යුතු මෙම ව්‍යාපෘතියද ඇතුළත්ව ව්‍යාපෘති 33 ක් සඳහා ලංසු ඉදිරිපත් කිරීමට දින 14 ක් පමණක් ලබා දී තිබුණි. | අමාත්‍යාංශය විසින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය මෙහෙය වන ලදී. | කොන්ත්‍රාත් ගිවිසුමෙහි විධිවිධාන අනුගමනය කළ යුතු වීම. |
| (ආ) | කොන්ත්‍රාත්තුව රු.4,879,367,561 ට ප්‍රදානය කර තිබූ අතර එය ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා සියයට 24 ක් ඉක්මවා තිබුණි. | SCAPC විසින් මෙම තීරණය ගනු ලැබූ අතර එම මුදල සඳහා කැබිනට් අනුමැතියද ලබා දෙන ලදී. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කළ යුතු වීම. |
| (ඇ) | 2017 වර්ෂය තුළ පැවති ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අනුපාතයන්ට අනුව ප්‍රමාණ පත් වටිනාකම එච්ඩීපීඊ පයිප්ප හා සවිකිරීම් සඳහා ගෙවීම් හා සසඳන විට සියයට 83 ක වැඩිවීමක් පෙන්නුම් කෙරුණි. | අත්සන් කරන ලද කොන්ත්‍රාත්තුවේ BOQ හි දක්වා ඇති අනුපාතයන්ට අනුව HDPE පයිප්ප හා සවිකිරීම සඳහා ගෙවීම් සිදු කරන ලදී. ගිවිසුම්ගතව එකඟ වූ රේටයන් වෙනස් කළ නොහැක. | කොන්ත්‍රාත් කාල සීමාව තුළ ව්‍යාපෘතිය අවසන් කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතු වීම. |
| (ඈ) | ප්‍රමාණ බිල්පතට අනුව 90mm විෂ්කම්භයෙන් යුත් HDPE පයිප්ප නල මීටර් 32550 ක් එළීමට අපේක්ෂා කළත් මීටර් 131000 ක නල සැපයීමට ප්‍රතිපාදන සලසා තිබුණි. මේ අනුව අතිරික්ත පයිප්ප මීටර් 98450 ක් සැපයීම වෙනුවෙන් රු.77,677,050 ක් අතිරික්ත මුදලක් ගෙවා තිබුණි. | සාමාන්‍යයෙන් BOQ (ප්‍රමාණ පත්‍ර) නල මාර්ග දිගු කිරීම සඳහා අමතර ප්‍රමාණයක් සපයයි. BOQහි 90mm පමණක් නොව 63mm අමතර පයිප්පද සපයනු ලැබේ. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ දිගුවන් සඳහා ප්‍රධාන වශයෙන් 90mm පයිප්ප අවශ්‍යවන අතර නල මාර්ග දිගු කිරීම සඳහා ප්‍රසම්පාදනය කර මෙහෙයුම් හා නඩත්තු අංශය වෙත භාර දෙන ලදී. | |
| (ඉ) | පිරිවිතර 3 කින් ජල මීටර් 4900ක් මිලදී ගෙන ඒ සඳහා රු.20,702,600 ක් ගෙවා තිබුණි. එම ජල මීටර්වල වෙළඳපොළ වටිනාකම සමඟ සැසඳීමේදී ඒවායේ වටිනාකම රු.11,743,000 ක් වූයෙන් සියයට 76 ක වැඩිවීමක් පෙන්නුම් කෙරුණි. | අත්සන් කරන ලද කොන්ත්‍රාත්තුවේ BOQ හි දක්වා ඇති අනුපාතයන්ට අනුව ජල මීටර් සඳහා ගෙවීම් සිදු කරන ලදී. ගිවිසුම්ගතව එකඟ වූ අනුපාත වෙනස් කළ නොහැක. | |

| | | |
|---|---|---|
| (ඊ) | තවද, 2018 මැයි 02 දින අවසන් කිරීමට නියමිතව තිබූ කොන්ත්‍රාත් කාලය 2018 ඔක්තෝබර් දක්වා දීර්ඝ කර තිබූ බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත් රු.200,000,280 ක් වටිනා සේවා සම්බන්ධතාවයට අවශ්‍ය අමුද්‍රව්‍ය 2018 අගෝස්තු වන විටත් මිලදී ගෙන නොතිබුණි. | සැපයුම් සම්බන්ධතා ද්‍රව්‍යයන් පමණක් BOQ මගින් සපයනු ලැබේ. ඉදිරිපත් කළ සාම්පල සම්බන්ධයෙන් විශ්ලේෂයනයක් කිරීමට කොන්ත්‍රාකරුට දන්වා ඇත. එම විශ්ලේෂණය අතරතුර ඉදිරිපත් කළ සාම්පල පිළිගත හැකි මට්ටමේ නොපවතින බව නිරීක්ෂණය විය. මෙහෙයුම් හා නඩත්තු අංශයද එම නිරූපණය සඳහා සහභාගී විය. එම නිසා පැකේජ 03 කොන්ත්‍රාත්තුව සඳහා අනුමත ද්‍රව්‍ය මිලට ගැනීමට කොන්ත්‍රාත්කරුට විකල්පයක් ලබා දෙන ලදී. මේ වන විටත් කොන්ත්‍රාත්කරුට එම යෝජනාවට ප්‍රතිචාර දැක්වීමක් හෝ අලුත් නිෂ්පාදනයක් ඉදිරිපත් කිරීමක් සිදු කර නොමැත. |

**3.11 වෙනත් සංවිධානවලට මුදාහළ සම්පත්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | 2003 ජුනි 02 දිනැති PED / 12 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 වගන්තියේ විධිවිධානවලට පටහැනිව, 2018 ඔක්තෝබර් 16 වන විට සේවකයින් අසූ පහක් (85) රේඛීය අමාත්‍යාංශයට මුදා හැර තිබුණු අතර මණ්ඩලය විසින් රු.58,583,402 ක් සමාලෝචිත වර්ෂය තුළ එම සේවකයින් සඳහා වැය කර තිබුණි. ඒ අනුව, 2015 දෙසැම්බර් සිට 2018 දෙසැම්බර් 31 දක්වා නිදහස් කරන ලද සේවකයින් සඳහා රු.146,423,663 ක් නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය විසින් ප්‍රතිපූරණය කළ යුතුය. කෙසේ වෙතත්, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය විසින් සපයන ලද තොරතුරු අනුව අමාත්‍යාංශයේ රාජකාරි සඳහා ඉහත සේවකයින්ගෙන් 19 දෙනෙකු පමණක් ක්‍රියාකාරීව දායක වී තිබුණි. | අමාත්‍යාංශය තුළ ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැතිවීම හේතුවෙන් මණ්ඩලයේ ක්‍රියාකාරකම් හා සම්බන්ධ හදිසි තාක්ෂණික හා වෙනත් කාර්යයන් සඳහා කාර්ය මණ්ඩලය නිදහස් කරන ලෙස රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ඉල්ලීම් කළ විට, මණ්ඩලයේ කාර්ය මණ්ඩලය ඔවුන්ගේ වැටුප් මණ්ඩලය වෙත ප්‍රතිපූරණය කිරීමේ පදනම මත තාවකාලිකව අමාත්‍යාංශයට මුදා හරිනු ලැබේ.<br><br>කෙසේ වෙතත්, එම වැටුප් ප්‍රතිපූරණය කිරීම සඳහා අවශ්‍ය අයවැය ප්‍රතිපාදන තමන් සතුව නොමැති බව අමාත්‍යාංශය විසින් දැනුම් දී ඇත. | වෙනත් ආයතනවලට සම්පත් නිදහස් කිරීම සම්බන්ධයෙන් 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED / 12 හි ඇති විධිවිධාන පිළිපැදිය යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| ii. | ඉහත සේවකයින් අතරින් සේවකයින් තිස් පස් දෙනෙකු (35) සම්බන්ධීකාරකවරුන් ලෙස කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන තිබුණි. කෙසේ වෙතත් සම්බන්ධීකාරක තනතුර මණ්ඩලයේ අනුමත තනතුරක් නොවේ. | අදහස් දක්වා නොතිබුණි. | අනුමත කාර්ය මණ්ඩලයට පිටතින් සේවකයින් බඳවා ගැනීම වැළැක්වීමට පියවර ගත යුතු වීම. |
| iii. | තවද සමාලෝචිත වර්ෂය තුළ සේවකයින් දෙදෙනෙකු තවත් රජයේ ආයතන දෙකකට මුදා හැර ඇති අතර මණ්ඩලය විසින් ඔවුන්ගේ වැටුප් හා වේතන වශයෙන් රු.2,340,879 ක් ගෙවා තිබුණි. | සේවකයින් ස්වදේශ හා අභ්‍යන්තර කටයුතු අමාත්‍යාංශයට මුදා හැර ඇති අතර, එම වැටුප මණ්ඩලයට ප්‍රතිපූර්ණය කරන ලෙස ඔවුන්ට දන්වා ඇත. | වෙනත් ආයතනවලට සම්පත් නිදහස් කිරීම සම්බන්ධයෙන් 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED / 12 හි ඇති විධිවිධාන පිළිපැදිය යුතුය. |

**3.12 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | කළමනාකරුවන් / ඉංජිනේරු (යාන්ත්‍රික), ඉංජිනේරු (විදුලි), ඉංජිනේරු (සිවිල්), මධ්‍යම මට්ටමේ තාක්ෂණික (එම්එල්-ටී) ලිපිකරු සහ සමාන්තර ශ්‍රේණි වර්ගයන් සහ වෙනත් පුහුණු ශ්‍රේණි ආදී ප්‍රධාන මෙහෙයුම් මට්ටමේ තනතුරු 1051 ක් පිරවීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම මණ්ඩලය විසින් පියවර ගෙන නොතිබුණි. | පහත සඳහන් හේතු නිසා පුරප්පාඩු පිරවීමට නොහැකි විය.<br>1. මණ්ඩලයේ ඇතැම් වැඩ ස්වයංක්‍රීය වේ.<br>2. මිනිස් බල ගිවිසුම් යටතේ සේවකයින් බඳවා ගැනීම<br>3. වාරණ නියෝග හේතුවෙන් සමහර පුරප්පාඩු පිරවීමට නොහැකි විය<br>4. පිරිවැය පාලන යාන්ත්‍රණයක් ලෙස අත්‍යවශ්‍ය පුරප්පාඩු පමණක් පුරවනු ලැබේ | ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් බඳවා ගත යුතු වීම. |
| ii. | 2006 සැප්තැම්බර් 22 දිනැති අංක 30 දරණ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ දක්වා ඇති පරිදි බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය සඳහා අනුමැතිය ලබා ගැනීමට පියවර ගෙන නොතිබුණි. | අදහස් දැක්වීමක් කර නොතිබුණි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් බඳවා ගැනීම් හා උසස් කිරීම් පටිපාටිය සඳහා අනුමැතිය ලබා ගැනීම සඳහා පියවර ගත යුතු වීම. |
| iii. | මණ්ඩලය විසින් විගණනයට ලබා දී ඇති තොරතුරුවලට අනුව, 2012 දෙසැම්බර් 20 සිට 2018 දෙසැම්බර් 31 දක්වා විදේශීය මූල්‍යයන ජල සම්පාදන හා මලාපවහන ව්‍යාපෘති සඳහා මණ්ඩලය විසින් විවිධ කාණ්ඩවලට අයත් කාර්ය මණ්ඩලය 137 දෙනෙකු නිදහස් කර | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් විදේශීය මූල්‍යන සහ මලාපවහන ව්‍යාපෘති ඇතුළු සේවකයින් සඳහා අනුමැතිය ලබා දී ඇත. ඒ | ස්ථිර තනතුරෙහි රාජකාරී සහ ව්‍යාපෘති කාර්ය සාධනයට බලපාන අයුරින් එක් පුද්ගලයෙකු එක් ව්‍යාපෘතියකට වඩා වැඩි ගණනකට පත් නොකිරීමට |

<table>
<tr>
<td></td>
<td>තිබුණි. මණ්ඩලය විසින් ගෙවන ලද වැටුප් සහ වෙනත් දීමනා එම ව්‍යාපෘතිය විසින් මණ්ඩලය වෙත ප්‍රතිපූරණය කර තිබුණි. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන් තිදෙනෙකු (03), සහකාර සාමාන්‍යාධිකාරීන් පහළොවක් (15), ප්‍රධාන ඉංජිනේරුවන් තිස් එකක් (31), ඉංජිනේරුවන් තිස් අටක් (38), සහකාර ඉංජිනේරුවන් හතළිහක් (40) සහ සමාජ විද්‍යාඥයෙක් ඒ අතර විය.</td>
<td>අනුව අනුමත කාර්ය මණ්ඩලය තුළ සේවකයින් ඉහත ව්‍යාපෘති සඳහා නිදහස් කළ හැකිය.</td>
<td>ක්‍රියා කළ යුතු වීම.</td>
</tr>
<tr>
<td>iv.</td>
<td>පසුගිය වසර පහ තුළ එක් සේවකයෙකුගේ මුළු පිරිවැය පහත පරිදි වේ.
<table>
<tr><th>වර්ෂය</th><th>මුළු සේවක සංඛ්‍යාව</th><th>මුළු සේවක පිරිවැය රු.මිලියන</th><th>එක් සේවකයෙකු සඳහා පිරිවැය රු.මිලියන</th></tr>
<tr><td>-----</td><td>-------</td><td>------------</td><td>------------</td></tr>
<tr><td>2014</td><td>10483</td><td>7,666.74</td><td>0.73</td></tr>
<tr><td>2015</td><td>10245</td><td>10,684.59</td><td>1.04</td></tr>
<tr><td>2016</td><td>10352</td><td>11,412.87</td><td>1.10</td></tr>
<tr><td>2017</td><td>10338</td><td>11,575.10</td><td>1.12</td></tr>
<tr><td>2018</td><td>10022</td><td>12,863.07</td><td>1.28</td></tr>
</table>
ඒ අනුව පසුගිය සිව් වසර තුළ එක් සේවකයෙකුගේ පිරිවැය සියයට 75 කින් වැඩි වී තිබුණු බව නිරීක්ෂණය විය.</td>
<td>උද්ධමනය වැඩි වීමට අනුව මෙම පිරිවැය වැඩි වේ.</td>
<td>කාර්ය මණ්ඩල පිරිවැය පාලනය කිරීමට පියවර ගත යුතු වීම.</td>
</tr>
<tr>
<td>v.</td>
<td>සේවයට සම්බන්ධ වීමේදී ව්‍යාජ ලේඛන ඉදිරිපත් කරන ලද කඳාන ජල පිරිපහදුව හා කොලොන්නාව වැඩ භාර නිලධාරී කාර්යාලය වෙත අනුයුක්ත කොට තිබූ ඉංජිනේරු සහකාරවරුන් ලෙස බඳවා ගත් සේවකයින් දෙදෙනාට එරෙහිව කිසිදු විනය ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බව සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.</td>
<td>එම සේවකයින්ට චෝදනා පත්‍ර නිකුත් කර ඇති අතර ඒ අනුව විනය ක්‍රියාමාර්ග ගනු ලැබේ.</td>
<td>විනය ක්‍රියාමාර්ග කඩිනම් කිරීමට පියවර ගත යුතු වීම.</td>
</tr>
<tr>
<td>vi.</td>
<td>2017 වර්ෂය තුළ අභ්‍යන්තර සිවිල් ඉංජිනේරු (i) තනතුරට බඳවා ගැනීමේදී යෝග්‍ය ලකුණු කිරීමේ ක්‍රමයක් අනුගමනය කර නොතිබුණි.<br><br>(අ) ඒ හේතුවෙන්, ජොෂ්ඨත්වයට හානි සිදුවී තිබුණි.<br>(ආ) ලකුණු දීමේ පටිපාටියේ සඳහන් නොවන සුදුසුකම් සඳහා ලකුණු ලබා දීම.<br>(ඇ) ලකුණු ගණනයේදී ගණිතමය දෝෂ.</td>
<td>නිවැරදි කිරීම් ඒ අනුව සිදු කර ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී.</td>
<td>බඳවා ගැනීම් සහ උසස්වීම් සඳහා දැනට පවතින ලකුණු දීමේ පටිපාටිය සමාලෝචනය කිරීමට පියවර ගත යුතු වීම.</td>
</tr>
</table>

| | | | |
|---|---|---|---|
| | කෙසේ වෙතත්, එම කරුණු නිවැරදි කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | | |
| vii. | 2009 නොවැම්බර් 04 දින අනියම් පදනමක් මත මනු කියවන්නෙකු ලෙස සම්බන්ධ වූ සහ මාතලේ ජල සම්පාදන ව්‍යාපෘතියට අනුයුක්තව සිටි සේවකයෙකු සේවයට බැඳීමේදී ව්‍යාජ සහතික ඉදිරිපත් කර තිබූ අතර ඔහුගේ සේවා කාලය තුළ විෂමාචාර කිහිපයක් සිදු කර තිබුණි. කෙසේ වෙතත්, මණ්ඩලයට සිදුවූ හානි හා අලාභ අයකර නොගෙන වසර 9 කට පසු ඔහුගේ සේවය අත්හිටුවා තිබුණි. | ඔහුව සේවයෙන් පහ කිරීමට විනය ක්‍රියාමාර්ග ගන්නා ලදි. | විනය ක්‍රියාමාර්ග කඩිනම් කිරීමට පියවර ගත යුතු වීම. |

**3.13 වාහන පද්ධතිය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 ජනවාරි සිට දෙසැම්බර් 31 දක්වා කාලය තුළ මෝටර් රථ 10 ක් රේඛීය අමාත්‍යාංශයට මුදා හැර ඇති අතර එම වාහන අළුත්වැඩියා කිරීම, බලපත්‍ර ලබා ගැනීම සහ රක්ෂණය කිරීම සඳහා රු.699,087 ක් වැය කර තිබුණි. කෙසේ වෙතත් පීඒ -8942, පීසී -5865, කේජී -0475 යන වාහන තුනක් පමණක් අමාත්‍යාංශයෙන් ලැබුණු බව නගර සැලසුම් හා ජල සම්පාදන ලේකම් මා වෙත දන්වා තිබුණි | අදහස් දක්වා නොතිබුණි. | වෙනත් ආයතනවලට සම්පත් නිදහස් කිරීම සම්බන්ධයෙන් 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED / 12 හි ඇති විධිවිධාන අනුගමනය කිරීම අවශ්‍ය විය යුතු වීම. |

**4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 සංයුක්ත සැලැස්ම**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | 2016-2020 කාල සීමාව ආවරණය වන පරිදි ආයතනික සැලැස්මක් සකස් කර තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපාරය තුළ ඇති දුර්වලතා සහ ව්‍යාපාරයේ බාහිර පරිසරය තුළ ඇති අවස්ථාවන් සහ තර්ජන එය සකස් කිරීමට පෙර නිසි ලෙස ඇගයීමට ලක් කර නොතිබුණි. | 2016 - 2020 ආයතනික සැලැස්ම සකස් කිරීමට පෙර SWOT විශ්ලේෂණය සිදු කරන ලදී. ආයතනික සැලසුම් පොත් පිංචෙහි අංක 5 පිටුවෙහි මූල්‍ය, SWOT විශ්ලේෂණය සහ පෙර කාල පරිච්ඡේදයේ (2011 - 2014) මෙහෙයුම් ප්‍රතිඵල සමාලෝචනය කිරීම සඳහන් කර ඇත. කෙසේවෙතත්, මෙම තොරතුරු තරඟකරුවන් විසින් දැකිය හැකි පොදු ලේඛනයක හෙළිදරව් කිරීම යෝග්‍ය නොවන බව සැලකීම නිසා ආයතනික සැලැස්මේ ශක්තීන් සහ දුර්වලතා හිතාමතාම ප්‍රකාශ කර නොතිබුණි. | ආයතනික සැලැස්මට සම්පූර්ණ SWOT විශ්ලේෂණය ඇතුළත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| ii. | සමාලෝචිත වර්ෂය අවසානයේදී පැවති සියයට 41.65 ක් වන කොළඹ නගරයේ ආදායම් නොවන ජලය අඩු කිරීම සඳහා කිසිදු ඵලදායී ප්‍රයත්නයක් ගෙන නොතිබුණි. තවද, කොළඹ නගරය හැරුණු විට විශේෂයෙන් ගම්පහ, කළුතර, කුරුණෑගල, අනුරාධපුර, මාතර, බණ්ඩාරවෙල සහ මොණරාගල යන ප්‍රදේශවල ආදායම් නොවන ජලය අඩු කිරීම සඳහා මණ්ඩලයේ අවධානය ද ප්‍රමාණවත් නොවීය. එබැවින් ආයතනික සැලැස්මට ඇතුළත් ඉලක්ක ද යථාර්ථවාදී නොවේ. | කොළඹ නගරය පැරණි වාත්තු යකඩ හා ඩක්ටයිල් යකඩ පයිප්ප වලින් සමන්විත වන අතර ආදායම් නොලබන ජලය අඩු කිරීම සඳහා ඒවා ප්‍රතිස්ථාපනය කළ යුතුය. මෙම පැරණි නල ප්‍රතිස්ථාපනයට කොළඹ නගරයේ ප්‍රධාන ව්‍යාපෘති දෙකක් (2) ක්‍රියාත්මක වේ. අරමුදල් අවහිරතා හේතුවෙන් නල ප්‍රතිස්ථාපන කොන්ත්‍රාත් පැකේජ ආරම්භ කිරීම ප්‍රමාද විය. කොන්ත්‍රාත් පැකේජ හතරම මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතී. මෙම කොන්ත්‍රාත් පැකේජ 2019 සිට 2021 දක්වා කාලය තුළ නිම කිරීමට සැලසුම් කර ඇත. මෙම ව්‍යාපෘති අවසන් වන විට කොළඹ නගරයේ ආදායම් නොලබන ජලය 2021 දී සියයට 18.0 ක් සහ දිවයින පුරා සියයට 20කට ළඟා වනු ඇතැයි අපේක්ෂා කෙරේ.<br><br>ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානයන්හි ආදායම් නොලබන ජල ක්‍රියාකාරකම් එක් එක් ප්‍රාදේශිකයට මණ්ඩලයේ වාර්ෂික මෙහෙයුම් අයවැය මඟින් ලබා දී ඇති අයවැය ප්‍රතිපාදන වලින් අඛණ්ඩව පවත්වාගෙන යනු ලැබේ. 2012 සිට ජල ගාස්තු සංශෝධනය නොකිරීම නිසා මෙහෙයුම් හා නඩත්තු අයවැය සීමිතය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රාදේශිකයන්හි ආදායම් නොලබන ජලය අවම කිරීම සඳහා වූ ප්‍රතිපාදනද සැලසුම් කළ ආකාරයට නොවන අතර එය විගණන වාර්තාවේ සඳහන් දිස්ත්‍රික්කවල ඉලක්ක සපුරා ගැනීමට අහිතකර ලෙස බලපා ඇත. | ආයතනික සැලැස්මේ දක්වා ඇති ඉලක්ක සපුරා ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වීම. |
| iii. | වර්තමාන ආදායම් නොවන ජල ප්‍රතිශත හා සසඳන විට බටහිර මධ්‍යම, ඌව, මධ්‍යම, වයඹ, උතුරු මැද සහ මාතර ප්‍රදේශවල ආදායම් නොවන ජලය අඩු කිරීම සඳහා 2016 - 2020 වර්ෂය සඳහා ආයතනික සැලැස්මේ ඇති ඉලක්ක යථාර්ථවාදී නොවන බව නිරීක්ෂණය විය. | ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානවල ආදායම් නොලබන ජලය අඩු කිරීම සඳහා කෙටිකාලීන පියවරයන් ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථාන සඳහා අයවැය වෙන් කිරීම මත රඳාපවතී. ප්‍රකාශ කර ඇති පරිදි ප්‍රතිපාදන සීමිතයි. එහි ප්‍රතිඵලයක් ලෙස මෙම දිස්ත්‍රික්කවල වර්තමාන ආදායම් නොලබන ජල ප්‍රතිශතය කරා ළඟා වීම අවම වේ. | ආයතනික සැලැස්මේ දක්වා ඇති ඉලක්ක සපුරා ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වීම. |

## 4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | 2018 වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම 2018 ජූලි 24 වන විටත් මණ්ඩලය විසින් අනුමත කර නොමැති අතර 2014 පෙබරවාරි 17 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2014 ප්‍රකාරව වාර්ෂික අයවැය ඇස්තමේන්තු, වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම, මානව සම්පත් සංවර්ධන සැලැස්ම, ණය ආපසු ගෙවීමේ සැලැස්ම සහ අභ්‍යන්තර විගණන සැලැස්ම ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. | 2018 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ ලේකම් විසින් 2018.01.09 දින අනුමත කරන ලදී. ප්‍රාග්ධන අයවැය ක්‍රියාකාරී සැලැස්ම සඳහා මණ්ඩලයේ අනුමැතිය 2018.01.17 දින ලැබුණි. ආයතනික ක්‍රියාකාරී සංයුක්ත සැලැස්ම සඳහා මණ්ඩලයේ අනුමැතිය මාර්තු මාසයේදී ලැබුණි. අභ්‍යන්තර විගණන සැලැස්මේ සාරාංශය සහ මානව සම්පත් සංවර්ධන සැලැස්මේ (HRDP) සාරාංශය අනුමත ආයතනික ක්‍රියාකාරී සැලැස්මට (CAP) ඇතුළත් වේ. විස්තරාත්මක විගණන සැලැස්ම විගණන හා කළමනාකරණ කමිටුව විසින් අනුමත කර ඇත. විස්තරාත්මක අවශ්‍යතා තක්සේරුවකින් පසුව විස්තරාත්මක මානව සම්පත් සංවර්ධන සැලැස්ම සාමාන්‍යාධිකාරී විසින් අනුමත කර ඇත. වාර්ෂික අයවැය ඇස්තමේන්තු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2018.01.17 දින අනුමත කරන ලද අතර වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ ලේකම් විසින් 2018.01.04 දින අනුමත කරන ලදී. | 2014 පෙබරවාරි 17 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2014 හි විධිවිධාන පිළිපැදිය යුතු වීම. |
| ii. | එක් එක් ක්‍රියාකාරකම් සඳහා වෙන් කරන ලද අරමුදල්, එක් එක් ක්‍රියාකාරකම්වල ආරම්භක හා අවසන් දිනය, අපේක්ෂිත කාර්තුමය භෞතික හා මූල්‍ය ප්‍රගතිය ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. | එක් එක් ක්‍රියාකාරකම් සඳහා සමාලෝචිත වර්ෂය සඳහා වෙන් කිරීම, එක් එක් ක්‍රියාකාරකම් ආරම්භ කිරීම සහ සම්පූර්ණ කිරීම, අපේක්ෂිත කාර්තුමය භෞතික හා මූල්‍ය ප්‍රගතිය 2018 ප්‍රාග්ධන අයවැය ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර ඇත. | අරමුදල් වෙන් කිරීම, එක් එක් ක්‍රියාකාරකම ආරම්භක දිනය හා අවසන් දිනය, කාර්තුමය භෞතික හා මූල්‍ය ප්‍රගතිය වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කිරීමට පියවර ගත යුතු වීම. |
| iii. | ක්‍රියාකාරී සැලැස්මට අනුව 2018 වර්ෂය තුළ මහා පරිමාණ ජල සම්පාදන ව්‍යාපෘති පහක් සහ මහා පරිමාණ මලාපවහන ව්‍යාපෘති තුනක් ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත් එය 2019 | ප්‍රසම්පාදන ප්‍රමාදයන් හේතුවෙන් ඉහත සඳහන් ජල සැපයුම් හා මලාපවහන ව්‍යාපෘති සැලසුම් කළ පරිදි ආරම්භ කළ නොහැකි විය. | ක්‍රියාකාරී සැලැස්මේ දක්වා ඇති ඉලක්ක සපුරා ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | මාර්තු 31 වන විට ආරම්භ කර නොතිබුණි. | | |
| iv. | ක්‍රියාකාරී සැලැස්මට අනුව, සමාලෝචිත වර්ෂය අවසානයේදී සමස්ත නල ජල සැපයුම් ආවරණය සහ මලාපවහන ආවරණය සමස්ත ජනගහනයෙන් සියයට 54.9 දක්වා සහ සියයට 2.7 දක්වා ඉහළ නැංවීමට අපේක්ෂා කර තිබුණි. කෙසේ වෙතත්, සත්‍ය ආවරණය පිළිවෙලින් සියයට 50.5 ක් සහ සියයට 2.06 ක් පමණක් විය. තවද, 2016-2020 සඳහා සකස් කරන ලද ආයතනික සංයුක්ත සැලැස්මට අනුව, 2020 වර්ෂය අවසානයේදී මුළු නල ආවරණය සියයට 60 දක්වා ඉහළ නැංවීමට අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, පසුගිය වසර කිහිපය තුළ දී ලබා දුන් නව සම්බන්ධතා වල සියයට 1.4 ක වාර්ෂික වර්ධන වේගය සලකන විට, එම ඉලක්කය සපුරා ගැනීමේ හැකියාව සැක සහිත ය. | 2018 වර්ෂයේ නල මාර්ග සම්බන්ධිත ආවරණ ඉලක්කය සපුරා ගැනීමට නොහැකි වූයේ:<br><br>(i) මණ්ඩලයේ විෂය පථයෙන් වෙන්ව සිදු කරනු ලබන ප්‍රසම්පාදන ප්‍රමාදයන්.<br>(ii) ක්‍රියාත්මක කිරීමේදී වැඩ විෂය පථය වෙනස් කිරීම.<br>(iii) සැලසුම් අදියරේදී ව්‍යාපෘති සඳහා අයවැය ප්‍රතිපාදන නොමැති වීම.<br>(iv) ව්‍යාපෘති චක්‍රයේ විවිධ අවස්ථා වලදී විරෝධතා.<br>(v) අයවැය ප්‍රතිපාදන ප්‍රමාද වීම / නොලැබීම.<br>(vi) පවත්නා යෝජනා ක්‍රම වැඩි දියුණු කිරීම හා පුනරුත්ථාපනය කිරීම සඳහා අරමුදල් ප්‍රමාණවත් නොවීම.<br>(vii) පුනරුත්ථාපන අයවැය සීමා කිරීමේ ප්‍රතිඵලයක් ලෙස මෙහෙයුම් හා නඩත්තු අයවැය මණ්ඩලය විසින් සීමා කිරීම.<br>(viii) පාරිසරික තත්ත්වය හේතුවෙන් ප්‍රභවය වියුක්තයට සීමා වීම. | ක්‍රියාකාරී සැලැස්මේ දක්වා ඇති ඉලක්ක සපුරා ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වීම. |

## 4.3 අභ්‍යන්තර විගණනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| i. | සහකාර සාමාන්‍යාධිකාරීවරයෙකු, ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන් පස් දෙනෙකු සහ ඉංජිනේරුවෙකු ඇතුළුව අභ්‍යන්තර විගණන අංශයේ පුරප්පාඩු එකොළහක් (11) පවතී. | පසුගිය වසරේ අභ්‍යන්තර විගණකවරුන් තිදෙනෙකු පත් කර තිබේ. ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන් පස් දෙනෙකු 2019/02/14 දින පත් කර ඇති අතර දැනට පවතින නීතිමය කාරණයක් හේතුවෙන් එය ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. සහකාර සාමාන්‍යාධිකාරී තනතුර පිරවිය හැක්කේ බඳවා ගැනීම් හා උසස් කිරීමේ පටිපාටිය සඳහා අනුමැතිය ලබා ගැනීමෙන් පසුව පමණි. | ප්‍රමාණවත් අභ්‍යන්තර විගණන කාර්ය මණ්ඩලයක් බඳවා ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| ii. | දේශීය හා විදේශීය අරමුදල් භාවිතා කරන ජල සම්පාදන හා සනීපාරක්ෂක සේවා ව්‍යාපෘති විශාල ප්‍රමාණයක් මණ්ඩලය විසින් සිදු කරනු ලබයි. කෙසේවෙතත්, මණ්ඩලයේ තාක්ෂණික විගණන අංශයට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කොට නොතිබුණි. | තාක්ෂණික විගණන අංශයේ වර්තමාන අනුමත කාර්ය මණ්ඩලයට අනුව පහත සඳහන් තනතුරු සඳහා පත් කර ඇත.<br>ප්‍රධාන ඉංජිනේරු (අභ්‍යන්තර විගණනය)-01<br>ඉංජිනේරු-02<br>ඉංජිනේරු සහායකයින් -05<br>තාක්ෂණික විගණන අංශයේ ඉංජිනේරුවෙකු හැර දැනට සිටින කාර්ය මණ්ඩලය 2019 විගණන සැලැස්ම අනුව භාවිතා කරනු ලැබේ. | තාක්ෂණික විගණන අංශයට ප්‍රමාණවත් තාක්ෂණික විගණන කාර්ය මණ්ඩලයක් බඳවා ගත යුතු වීම. |
| iii. | 2017 පෙබරවාරි 15 දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක 1/2017 හි අවශ්‍යතාවයට අනුව විදේශ මූල්‍යන සපයන සංවර්ධන ව්‍යාපෘති සඳහා අභ්‍යන්තර විගණකවරුන් පූර්ණ කාලීන හෝ අර්ධ කාලීන පදනමින් පත් කර නොතිබුණි. විගණන සැලසුම් සඳහා අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීම, මූල්‍ය වර්ෂයට පෙර එය කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම සහ විගණන වාර්තා රේඛීය අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීම යානාදී වශයෙන් ඉහත චක්‍රලේඛයට අනුව එවැනි ව්‍යාපෘති විගණනයේදී කිසිඳු ප්‍රතිපාදනයක් අනුමගමනය කර නොතිබුණි. | 2016/06/10 දිනැති කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක 02/2016 ට අනුව විදේශීය මූල්‍යන ව්‍යාපෘති සඳහා අභ්‍යන්තර විගණකවරුන් බඳවා ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ඉල්ලා ඇත. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් මේ දක්වා ඒ සඳහා අනුමැතිය ලබා දී නොමැත. | කළමනාකරණය විසින් කළමනාකරණ විගණන චක්‍රලේඛවලට අනුගත විය යුතු වීම. |

**4.4** **අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළදී මණ්ඩලයේ අයවැයගත සහ තථ්‍ය ආදායම සහ වියදම් අතර සියයට 3 සිට 36 දක්වා සැලකිය යුතු වෙනස්කම් නිරීක්ෂණය විය. ඵලදායී කළමනාකරණ උපකරණයක් ලෙස අයවැය භාවිතා කර නොමැති බව එයින් ඇඟවේ. | මණ්ඩලයේ එක් එක් අංශයේ සමස්ත පිරිවැය පාලනය පදනම් වන්නේ මණ්ඩලය විසින් අනුගමනය කරන ඵලදායී අයවැය යාන්ත්‍රණය මත ය. එබැවින් පුරෝකථනය කර ඇති රු. බිලියන 2.7 ක අලාභය රු. බිලියන 0.56 දක්වා අඩු කර ඇත. | විචලනයන් අවම කිරීම සඳහා පියවර ගත යුතු වීම. |

## 4.5 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසාර සංවර්ධන අරමුණු පිළිබඳ න්‍යාය පත්‍රය -2030 පිළිබඳව දැනුවත්වීමෙන් අනතුරුව, විශ්වීය හා සාධාරණ ලෙස සැමට සුරක්ෂිත හා දැරිය හැකි ලෙස පානීය ජලය සඳහා ප්‍රවේශ වීම සහ ප්‍රමාණවත් හා සාධාරණ සනීපාරක්ෂාව සඳහා ප්‍රවේශය ලබා දීම, කාන්තාවන්ගේ හා ගැහැණු ළමයින්ගේ හා අවදානමට ලක්විය හැකි තත්වයන්හි සිටින අයගේ අවශ්‍යතා කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් 2030 දී තිරසර සංවර්ධන අරමුණු ලෙස මණ්ඩලය හඳුනාගෙන තිබුණි. කෙසේ වෙතත්, එහි විෂය පථයට අයත් අනෙකුත් අරමුණු, ඉලක්ක, දත්ත සහ සන්දිස්ථානයන් හඳුනා ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. තවද, 2018 වර්ෂය අවසාන වන විටත් තිරසාර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් මණ්ඩලය විසින් කිසිදු අභ්‍යන්තර චක්‍රලේඛයක් හෝ මාර්ගෝපදේශයක් නිකුත් කර නොතිබුණි.<br>ඊට අමතරව, දර්ශක සම්බන්ධයෙන් සියලු පාර්ශවයන් නියෝජනය කරන දත්ත වෙන් කිරීම සහ දත්තවල නිරවද්‍යතාවය සත්‍යාපනය කිරීම සඳහා කිසිදු ක්‍රමවේදයක් අනුගමනය කර නොමැති අතර මණ්ඩලයට අදාළ තිරසාර සංවර්ධන අරමුණු හා සම්බන්ධ වෙනත් රාජ්‍ය ආයතන 2019 මාර්තු 31 වන විටත් හඳුනාගෙන නොතිබුණි. | එස්ඩීජී ඉලක්කය සාක්ෂාත් කර ගැනීම සඳහා මණ්ඩලයේ එදිනෙදා කටයුතු ස්වභාවිකවම නැඹුරු වී ඇති අතර ''සැමට ජලය සහ සනීපාරක්ෂාව ලබා ගත හැකි බව සහ තිරසාර කළමනාකරණය සහතික කිරීම'', ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික මට්ටමේ ක්‍රියාකාරකම්වල නියැලී සිටී. සහශ්‍ර සංවර්ධන ඉලක්කවල සිට එස්ඩීජී දක්වා පරිවර්තනය කිරීම, නගර සැලසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ මග පෙන්වීම යටතේ මණ්ඩලයේ ජාතික දර්ශක සංවර්ධනය කිරීම හා ඉලක්ක සකස් කිරීම සඳහා ඉලක්ක 6.1 ට අදාළ ජයග්‍රහණ නිරීක්ෂණය කිරීම සහ වාර්තා කිරීම; 2030 වන විට සැමට සුරක්ෂිත හා දැරිය හැකි පානීය ජලය සඳහා විශ්වීය හා සාධාරණ ප්‍රවේශයක් ලබා ගැනීම සහ ඉලක්කය 6.2; සැමට ප්‍රමාණවත් හා සාධාරණ සනීපාරක්ෂාව සහ සනීපාරක්ෂාව සඳහා ප්‍රවේශය ලබා ගැනීම සහ විවෘත අපවිත්‍ර වීම අවසන් කිරීම, 2030 වන විට කාන්තාවන්ගේ හා ගැහැණු ළමයින්ගේ හා අවදානමට ලක්විය හැකි තත්වයන්හි සිටින අයගේ අවශ්‍යතා කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීම. 2018 වර්ෂය තුළ මේ සඳහා දත්ත රැස් කිරීම සඳහා ප්‍රශ්නාවලියක් සකස් කිරීම සම්බන්ධයෙන් සංගණන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සමඟ අමාත්‍යාංශයේ මඟ පෙන්වීම යටතේ මණ්ඩලයේ සාකච්ඡා කිහිපයක් පැවැත්විය.<br>එස්ඩීජී ක්‍රියාකාරකම් නගර සැලසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා මණ්ඩලයේ එක්ව පවත්වනු ලැබේ. මණ්ඩලයේ පවත්නා ආයතනික ක්‍රියාකාරී සැලසුම් අදාළ තිරසාර සංවර්ධන ඉලක්ක වෙත නැඹුරු වේ. එසේම, නගර සැලසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරන ලද කමිටුවක් මූලික හා ඉලක්ක ස්ථාපිත කිරීම සඳහා කටයුතු කරමින් සිටී. නගර සැලසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන | |

අමාත්‍යාංශය විසින් පත් කරන ලද විශේෂ කමිටුව විසින් අරමුණු සහ ඉලක්ක නිර්දේශ කර ඇත. මෙය පාර්ශවකරුවන් විසින් වලංගු කළ යුතුය. දත්ත රැස්කිරීමේ ප්‍රශ්නාවලියද කමිටුව විසින් අවසන් කරනු ලැබේ. අනතුරුව එය අවසන් කිරීම සඳහා ජාතික සංගණන දෙපාර්තමේන්තුව සහ WASH කණ්ඩායම, නගර සැලසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, පළාත් පාලන අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කරනු ඇත. මෙය සම්පූර්ණ කර පාර්ශවකරුවන් එකඟ වූ පසු, අවශ්‍ය නම්, අමාත්‍යාංශය විසින් චක්‍රලේඛ නිකුත් කරනු ලැබේ.

මණ්ඩලයේ නිලධාරීන් විසින් පහත සඳහන් දැනුවත් කිරීම් සහ උපදේශන වැඩමුළු සහභාගී වන ලදී.

ශ්‍රී ලංකාව සඳහා වූ බහු ජාතික පාර්ශවකරුවන්ගේ උපදේශන වැඩමුළුව ස්වේච්ඡා ජාතික සමාලෝචනය - ශ්‍රී ලංකා පදනම් ආයතනයේ ශ්‍රවණාගාරය

ii. එස්ඩීජී 6 අධීක්ෂණය කිරීම - පාර්ශවකරුවන්ගේ උපදේශන වැඩමුළුව - නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය - නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ ශ්‍රවණාගාරය

iii. ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන ජල ගුණත්වය පරීක්ෂාව සම්බන්ධයෙන් වූ කුටුම්භ සමීක්ෂණය එස්ඩීජී 6 ඉලක්කය 6.1 - නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ ශ්‍රවණාගාරය

iv. එස්ඩීජී 6 දර්ශක කමිටු රැස්වීම - නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය

v. ජල සම්පාදන හා සනීපාරක්ෂක අංශය ශක්තිමත් කිරීම එස්ඩීජී ප්‍රධාන පාර්ශවකරුවන් හමුවීමට සූදානම් වීම - නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය.